# පාලි භාෂාව

12 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය
(2017 සිට ක්‍රියාත්මක වේ)



සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

# පාලි භාෂාව

## ගුරු මාර්ගෝපදේශය

# 12 ශ්‍රේණිය

(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් තැපැල : info@nie.lk

පාලි භාෂාව

ගුරු මාර්ගෝපදේශය

12 ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය - 2017

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN

සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

**වෙබ් අඩවිය** : www.nie.lk

**විද්‍යුත් තැපැල** : info@nie.lk

මුද්‍රණය

ජාතික අධ්‍යාපන ආයතනය

# අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර වර්ෂ 2007 දී  ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශවයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම  2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩනැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එකම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරතවීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා  ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින්  ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායීවීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමීව භාවිතා කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ  අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ  සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද ආයතන සභාවේ ද රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත් දායකයින් හා වෙනත් පාර්ශවයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කරගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර,**
**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික අධ්‍යාපන ආයතනය,**
**මහරගම.**

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

මිනිසා විධිමත් අධ්‍යාපන ක්‍රියාවලියට යොමු වූයේ අනාදිමත් කලක සිට ය. අධ්‍යාපන පරමාර්ථ, ඉගෙනුම් ක්‍රමශිල්ප පිළිබඳ එදා මෙදා තුර විවිධ ප්‍රවේශ ඔස්සේ කර ඇති අනාවරණ ද අතිමහත් ය. කෙසේ වුව ද අධ්‍යාපනයේ පොදු අපේක්ෂාව පූර්ණ පෞරුෂයකින් හෙබි පුද්ගලයකු තැනීමයි. මේ සඳහා අවශ්‍ය දැනුම, ආකල්ප, කුසලතා, සමාජමය දක්ෂතාවන්ගෙන් පිරිපුන් සිය විභව ශක්ති මතු කරගත් පුද්ගලයකු නිර්මාණයට උචිත අධ්‍යාපන පුරෝගාමී මෙහෙවර ඉටු කිරීමට අප ආයතනය දායක වේ.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරත ගුරුවරුන් අධ්‍යාපන අරමුණු, ඉගෙනුම් ක්‍රියාවලිය, ඇගයීම යන අවස්ථා ත්‍රිත්වය කෙරෙහි ම එක සේ අවධානය යොමු කළ යුතු ය. ඒ සඳහා අවශ්‍ය මග පෙන්වීම මෙම ගුරු මාර්ගෝපදේශයෙන් සැපයේ. එය ආදර්ශයට ගෙන ඔබට අනන්‍ය, සාර්ථක ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සැලසුම් කර ගැනීමට ඔබට හැකියාව ඇත.

ශිෂ්‍ය සංවර්ධනය, ගුරු සංවර්ධනය, පද්ධතියට නව දැනුම සම්පාදනය ආදී විවිධ අපේක්ෂණ පෙරදැරි ව ගුරුවරයා පර්යේෂණ කාර්යයට යොමු වීම ද අත්‍යවශ්‍ය වේ. සෑම සාර්ථක ගුරුවරයෙක් ම සාර්ථක පර්යේෂකයෙක් ද වේ. ඔබ දැනටමත් සිදුකරනු ලබන පර්යේෂණ කාර්යය වඩාත් විධිමත් ව සිදු කිරීමට යොමු  වීම කාලීන අවශ්‍යතාවකි. එහි දී අවශ්‍ය මගපෙන්වීම් සඳහා අපගේ දායකත්වය ද ලබාගත හැකි ය.

ගුරුවරයා සෘෂිවරයෙකි. සිසුවා පිළිබඳ තුන්කල් දැක්මක් ගුරුවරයා සතු වේ. ගුරුවරයා විටෙක පෙරගමන්කරුවෙකි. විටෙක පසුගමන්කරුවෙක් වන අතර තවත් විටෙක එක් ව පියනගන්නෙකි. මේ මනා වැටහීමෙන් හා ආකල්පමය ගුණ වගාවෙන් යුතු ව කටයුතු කරන නිපුණ ගුරුවරයෙකු ලෙස; සිසු විවිධතා සැලකිල්ලට ගෙන සිසු නිපුණතා සංවර්ධනයට අවශ්‍ය උසස් ඉගෙනුම් ක්‍රමශිල්ප භාවිතයට ගනු ලබන, වගකීමෙන් හා වගවීමෙන් කටයුතු කරන ගුරුවරයෙකු වීමට ඔබට තව තවත් ශක්තිය ලැබේවා !

සංගීත විශාරද, ශාස්ත්‍රපති සුදත් සමරසිංහ

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,

ගුරු අධ්‍යාපන හා විකල්ප අධ්‍යාපන පීඨය

# විෂයමාලා කමිටුව

උපදේශකත්වය හා අනුමතිය - ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය.

විෂය විශේෂඥ උපදේශනය - **මහාචාර්ය නාබිරිත්තන්කඩවර ඤාණරතන හිමි.**
පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලයය, කැලණිය.

විෂය සම්බන්ධීකරණය - **පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි**
(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය), (අධ්‍යයන අංශප්‍රධාන)
ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.

ලේඛක මණ්ඩලය -

අභ්‍යන්තර ලේඛක මණ්ඩලය

01 **පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි** (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය), රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති (විශිෂ්ට පන්ති), පශ්චාද් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (විශිෂ්ට පන්ති), පශ්චාද් උපාධි උපදේශන ඩිප්ලෝමා, අධ්‍යාපනපති, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.

බාහිර ලේඛක මණ්ඩලය

(1) **මහාචාර්ය පූජ්‍ය නාබිරිත්තන්කඩවර ඤාණරතන හිමි**, රාජකීය පණ්ඩිත, බී. ඒ. (ගෞරව), එම්. ඒ, පීඑච්. ඩී. (දිල්ලි), පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලයය, කැලණිය.

(2) **මහාචාර්ය පූජ්‍ය මකුරුප්පේ ධම්මානන්ද හිමි**, රාජකීය පණ්ඩිත, බී. ඒ. (ගෞරව), එම්. ඒ, පීඑච්. ඩී. (දිල්ලි), පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලයය, කැලණිය.

(3) **ආචාර්ය පූජ්‍ය දෙණියායේ පඤ්ඤාලෝක හිමි** (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය), රාජකීය පණ්ඩිත, බී. ඒ. (ගෞරව), එම්. ඒ, එම්.ෆිල්, පීඑච්. ඩී. (ක්‍යුෂු) පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලයය, කැලණිය.

(4) **පූජ්‍ය මොනරාගල නන්දසිරි හිමි** (පරිවෙණාචාර්ය), රාජකීය පණ්ඩිත, බී. ඒ. (ගෞරව) (ජපුර) එම්. ඒ. (කැලණිය) එම්. ඒ. (බෞ. පා) බප/ ගම්/ ශ්‍රී විද්‍යාශේඛර මහ පිරිවෙන, බැණ්ඩියමුල්ල, ගම්පහ.

(5) **ඒ. ඒ. ජයසූරිය මයා** (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - විශ්‍රාමික), කැලණිය විශ්වවිද්‍යාලයය, කැලණිය.

(6) **ආර්. ඒ. විමල් ප්‍රේමතිලක මයා** (කථිකාචාර්ය), ශාස්ත්‍රවේදී (ගෞරව), ශාස්ත්‍රපති, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා, සීතාවකපුර පිරිවෙන් ගුරු අභ්‍යාස ආයතනය, අවිස්සාවේල්ල.

(7) **ඒ. සුමිත් ධර්මශ්‍රී මයා** (පරිවෙණාචාර්ය), රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා, කෑ/ මාව/ කීර්ති ශ්‍රී රාජසිංහ විද්‍යායතන පිරිවෙන, දියසුන්න, රඹුක්කන.

(8) **එන්.සීලරත්න මයා** (ගුරු උපදේශක), රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, කු/බෞද්ධාලෝක විද්‍යායතන පිරිවෙන, කුරුණෑගල.

(9) **ඩී. එම්. එස්. දිසානායක මයා** (පරිවෙණාචාර්ය), ශාස්ත්‍රවේදී (ගෞරව), ශාස්ත්‍රපති, අ/ශ්‍රී විද්‍යාධාර මහ පිරිවෙන, කලාකරඹෑව.

**පරිගණක වදන් සැකසුම**
පූජ්‍ය මොනරාගල නන්දසිරි හිමි
**කවර නිර්මාණය**
අජිත් පනාපිටිය, කෑ/පිංදෙණිය මධ්‍ය මහා විද්‍යාලය, අටාල.

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

මෙම ගුරු මර්ගෝපදේශය, අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ 12 ශ්‍රේණියට අදාළ පාලි විෂය, නිපුණතා පාදකව පාසල් හා පිරිවෙන් තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ඔබට මඟ පෙන්වයි. පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරයා තුළ ධනාත්මක වූත් ප්‍රබෝධාත්මක වූත් සිතුවිලි හා ක්‍රියාකාරකම් නොමැති නම් 'උල්පතට ඉහළින් ගඟ නො ගලන්නාක් මෙන් ' අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගත නොහැක. ඒ අනුව අධ්‍යාපන ක්ෂේත්‍රයේ වටිනාම සම්පත වූ ගුරු සම්පතට අයත් ඔබගේ උද්‍යෝගය මත මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් ප්‍රායෝගික වනු ඇත. ඒ අනුව මෙම ගුරු මාර්ගෝපදේශය මුල සිට (අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ පණිවිඩයේ සිට) සැලකිල්ලෙන් කියවා හොඳින් අවබෝධ කර ගැනීම අත්‍යවශ්‍ය වේ.

2007 වර්ෂයේ සිට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන නිපුණතා පාදක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය පිළිබඳ ගුරුවරයෙකු ලෙස ඔබ ඇතැම්විට හොඳ අවබෝධයක් ලබා ඇත. යම් විෂයක් පිළිබඳ සිසුන් නිපුණයින් වීමට නම් ඇසීම, දැකීම හා කිරීම යන අංශ තුනෙහි ම ක්‍රියාකාරී ව යෙදිය යුතු ය. උගත් දෙවල් ප්‍රායෝගික ජීවිතයේ දී සුසංයෝගී ව යොදා ගැනීමේ හැකියාව ඇත්නම් ඔහු නිපුණයෙකි.

2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ අතට ලබා දෙන මෙම ගුරු මර්ගෝපදේශය පරිශීලනය කර, දරුවන් විභාගයෙන් සමත් කරවීම ම පමණක් එකම අරමුණ නොවිය යුතු ය. ඔබගේ ඉගෙනුම් ඉගැන්වීම් කාර්යයෙන් ශ්‍රේෂ්ඨ ගණයේ පුරවැසියෙකු බිහි කිරීම ප්‍රධාන අරමුණ විය යුතු අතර විශිෂ්ට ලෙස විභාග සමත්වීම සිසුන් ලබන අතිරේක ප්‍රතිලාභයක් වනු ඇත. අධ්‍යාපනයෙන් විභාග සමත්වීමේ නිපුණතාව නොව ධාර්මික ජීවිතයක් ගත කිරීමේ නිපුණතාව ඇති කළ යුතු ය.

පාලි විෂය නිර්දේශය තුළ 12 ශ්‍රේණිය සඳහා නිපුණතා 10 ක් දක්වා ඇති අතර පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ පහසුව සඳහා ඒවා නිපුණතා මට්ටම් (පියවර) 26 කට බෙදා ඇත. මෙම මට්ටම් 26 සඳහා ගුරු මාර්ගෝපදේශයේ පාඩම් ඒකක 30 ක් දක්වා ඇත. සෑම ආදර්ශ පාඩම් ඒකකයක් ම ඉගෙනුම් පල ගණනාවකින් සමන්විත වන අතර එම ඉගෙනුම් පල අත් කර ගත හැකි ආකාරයට ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පන්ති කාමරය තුළ සිදු කළ යුතු ය. ගුණාත්මක යෙදවුම් භාවිත කරමින් යෝජිත කාලය තුළ අදාළ විෂය කරුණු ග්‍රහණය කරගැනීමෙන් පසු සිසුන්ට ඉගෙනුම් පල අත් කර ගැනීමට හැකි වූ ප්‍රමාණය තක්සෙරුකර බැලීම ද පාඩම් ඒකකය අවසානයේ සිදු විය යුතු ය.

පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දි සිසුන්ට හා පන්තියට උචිත පරිදි වඩාත් නිර්මාණශීලි ක්‍රමයක් භාවිත කිරීමට ගුරුභවතාට නිදහස ඇති අතර සිසුන්ගේ නිපුණතා තව දුරටත් සංවර්ධනය වීම සඳහා වැඩි දුර ගවේෂණයට යොමු කළ යුතු ය. මෙම ගුරු මාර්ගෝපදේශය තුළ කාලච්ඡේද ගණනය කර ඇත්තේ විෂය අන්තර්ගතය පිළිබඳ සැලකිලිමත් වෙමිනි. වර්ෂයට නියමිත කාලච්ඡේද සංඛ්‍යාව නොඉක්මවන පරිදී පාඩම් ඒකකවලට යොදා ඇති කාලච්ඡේද සංශෝධනය කර ගැනීමට හා පන්ති කාලසටහනට අනුව පාඩම් ඒකක කළමනාකරණය කර ගැනීමට ඔබට අවකාශ ඇත. ගුරු මාර්ගෝපදේශය අවසානයේ දක්වා ඇති තක්සේරු හා ඇගයීම් ක්‍රියාවලියට අදාළ නිදර්ශක ආධාරයකය ගුරු කොට නිපුණතා 10 ආවරණය වන පරිදි 12 ශ්‍රේණියේදී ඇගයීම් 09 ක් සිදු කළ යුතු ය. ඒ සඳහා විස්තර පාසල පදනම් කරගත් තක්සේරුකරණය කොටසේ දක්වා ඇත.

රාජකීය පණ්ඩිත, අධ්‍යාපනපති පූජ්‍ය කෙරිපැහැ මේධංකර හිමි.

(ව්‍යාපෘති ප්‍රධාන හා අධ්‍යයන අංශප්‍රධාන)

# පටුන


| | | පිටු අංක |
|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ පණිවිඩය | iii |
| 02 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ පණිවිඩය | iv |
| 03 | විෂයමාලා කමිටුව | v |
| 04 | ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | vi |
| 05 | පටුන | vii |
| 06 | විෂය හැඳින්වීම | ix |
| 07 | ජාතික අරමුණු | x |
| 08 | මූලික නිපුනතා | xi |
| 09 | පාලි විෂය අධ්‍යයනයේ අරමුණු | xiii |
| 10 | විෂය නිර්දේශය පාසල් වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලැස්ම | xiv |
| 11 | විෂය නිර්දේශය | xv |
| 12 | පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් | xxiii |
| 13 | තක්සේරු හා ඇගයීම් | xxiv |
| 14 | ඉගැනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | xx-xxix |
| 15 | 01. ඒකකය - අක්ෂර මාලාව | 1 - 2 |
| 16 | 02. ඒකකය - උක්තාඛ්‍යාත භාවිතය | 3 - 4 |
| 17 | 03. ඒකකය - කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය | 5 - 6 |
| 18 | 04. ඒකකය - කාරක හා උපපද විභක්ති | 7 - 8 |
| 19 | 05. ඒකකය - ත්‍රෛකාලික ක්‍රියා | 9 - 11 |
| 20 | 06. ඒකකය - සන්ධි | 12 - 13 |
| 21 | 07. ඒකකය - නාම වරනැඟීම | 14 - 16 |
| 22 | 08. ඒකකය - පූර්ව ක්‍රියා, තුමන්ත ක්‍රියා, උපසර්ග හා නිපාත | 17 - 19 |
| 23 | 09. ඒකකය - සමාස | 20 - 21 |
| 24 | 10. ඒකකය - තද්ධිත | 22 - 23 |
| 25 | 11. ඒකකය - කිං (ක) ශබ්දය ඇසුරෙන් ප්‍රශ්න සැකසීම | 24 - 25 |
| **26** | 12. ඒකකය - ප්‍රශ්නවාචක නිපාත උපයෝගි කරගෙන ප්‍රශ්න සැකසීම | 26 - 27 |
| 27 | 13. ඒකකය - උච්චාරණය හා ස්මරණය | 28 - 29 |
| 28 | 14. ඒකකය - නිර්දිෂ්ට ග්‍රන්ථය - මහාසුපින ජාතක | 30 - 31 |
| 29 | 15. ඒකකය - නිර්දිෂ්ට ග්‍රන්ථය - ධම්මපද | 32 - 33 |
| 30 | 16. ඒකකය - නිර්දිෂ්ට ග්‍රන්ථය - සිගාලකසුත්ත | 34 - 35 |
| 31 | 17. ඒකකය - අනිර්දිෂ්ට ගද්‍ය පාඨ - අර්ථාවබෝධය | 36 - 37 |
| 32 | 18. ඒකකය - අනිර්දිෂ්ට පද්‍ය පාඨ - අර්ථාවබෝධය | 38 - 39 |
| 33 | 19. ඒකකය - සාරධර්ම චරිතායනය - ධම්මපද | 40 - 41 |
| 34 | 20. ඒකකය - සාරධර්ම චරිතායනය - සිගාලකසුත්ත | 42 - 43 |
| 35 | 21. ඒකකය - සාරධර්ම චරිතායනය - මහාසුපින ජාතක | 44 - 45 |
| 36 | 22. ඒකකය - සාහිත්‍ය රසාස්වාදනය - 1 | 46 - 47 |
| 37 | 23. ඒකකය - සාහිත්‍ය රසාස්වාදනය - 2 | 48 - 49 |
| 38 | 24. ඒකකය - පාලි සාහිත්‍යාගත බෞද්ධ සංස්කෘතිය - ආචාර සමාචාර ධර්ම | 50 - 51 |
| 39 | 25. ඒකකය - පාලි සාහිත්‍යාගත බෞද්ධ සංස්කෘතිය - සත්පුරුෂ හා පණ්ඩිත ලක්ෂණ | 52 - 53 |
| 40 | 26. ඒකකය - පාලි සාහිත්‍යාගත බෞද්ධ සංස්කෘතිය - පඤ්චශීලය, කුසල් හා අකුසල් | 54 - 55 |
| 41 | 27. ඒකකය - පාලි සාහිත්‍යය - 1 | 56 - 57 |
| 42 | 28. ඒකකය - පාලි සාහිත්‍යය - 2 | 58 - 59 |
| 43 | 29. ඒකකය - අර්ථ විවරණය - ව්‍යාකරණ විභාග | 60 - 61 |
| 44 | 30. ඒකකය - අර්ථ විවරණය - ධර්මාර්ථ විභාග | 62 - 63 |
| 45 | පාසල පදනම් කරගත් තක්සේරුකරණය - හැඳින්වීම | 64 - 65 |
| 46 | ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ නිදර්ශක ආධාරකය | 66 - 67 |

# 12 ශ්‍රේණිය

# පාලි

## විෂය නිර්දේශය

# විෂය හැඳින්වීම

පාලි භාෂාව බුදුසමයත් සමඟ ශ්‍රී ලංකාවට ලැබුණු දායාදයකි. ශ්‍රී ලාංකේය අනන්‍යතාව ගොඩ නැගීමට බුදු සමයෙන් සැලසී ඇත්තේ මාහැඟි සේවයකි. ශ්‍රී ලංකාව අදටත් ලෝකයේ සම්භාවනාවට පාත්‍ර වන්නේ මුල් බුදුසමය යැයි සැලකෙන පාලි ත්‍රිපිටකය සුරක්ෂිත ව පවත්නා දේශයක් වශයෙනි. ලෝකයේ අන් රටකට නොදෙවැනි අපගේ ඉතිහාසයත්, සම්භාව්‍ය සාහිත්‍යයත් ලියවී ඇත්තේ ද පාලි භාෂාවෙනි. යමෙකුට පාලි භාෂාඥානය නො අඩුව තිබේ නම් ඔහු හෝ ඇය බුදුසමය පිළිබඳ හසළ දැනුමක් ඇත්තෙකැයි නො අනුමානව ම ගෞරවාදරයට පාත්‍ර වෙයි.

පාලි භාෂාවෙන් ලියැවී ඇති ප්‍රධානතම ලේඛන සමුදාය වන්නේ පාලි ත්‍රිපිටකය යි. එය ආගමික සාහිත්‍යයක් පමණක් ම නොව සාමකාමී සදාචාර සම්පන්න ජීවන මාර්ගයක් ද වෙයි. බුදුන් වහන්සේ ඇතුළු ආර්යයන් වහන්සේලාගේ ජීවනචරිත හා අභිසමාචාරයන් තත් වූ පරිද්දෙන් ජනවහරින් ම ලියවුණු පාලි ත්‍රිපිටකය තරම් අන් කිසිදු ලේඛනයක් වෙතැයි සිතිය නොහැක.

ක්‍රිස්තු පූර්ව යුගය තරම් ඈතට දිවෙන පාලි අට්ඨකථා සාහිත්‍යය ලංකා ඉතිහාසයේ දීර්ඝ කාලපරිච්ඡේදයක් ආවරණය කරන්නකි. ධර්මයත් ඉතිහාසයත් සංස්කෘතියත් මේවායෙහි කඳිමට සනිටුහන් ව ඇත. කෙනෙකුට බුදුසමය මැනවින් තේරුම් ගැනීමට හැකි වන්නේ මෙකී පාලි අට්ඨකථා කියවා අවබෝධ කර ගත හැකි නම් පමණි. ලංකා ඉතිහාසය පෝෂණය කළ පාලි අට්ඨකථා ලියා ඇත්තේ විවිධ භාෂා හා සමය සම්ප්‍රදායයන් පිළිබඳ ප්‍රවීණත්වයක් දරූ මහාප්‍රාඥයන් විසින් වන බැවින් ඔවුන්ගේ දැනුම් සම්භාරය ඉස්මතු කර ගත හැකි වන්නේ ද පාලි භාෂාව දන්නේ නම් පමණි.

සිංහල භාෂාවේ මව්බසක් ලෙස පාලිය හඳුන්වනු ලබයි. පුරාතන ලංකා ඉතිහාසයේ යමක් ලේඛනගත වී නම් එය බොහෝ විට සිදු වී ඇත්තේ පාලි හෝ ප්‍රාකෘත භාෂාවලිනි. පැරණි ඉන්දු ආර්ය භාෂාවක් වන සංස්කෘත භාෂාව හා නූතන ආර්ය භාෂාවක් වන සිංහල අතර සම්බන්ධීකාරක භාෂාව වන්නේ පාලිය යි. අද අප ව්‍යවහාර කරන බොහොමයක් වචන පාලි හෝ ඊට ආසන්න ඒවා ය. එබැවින් පාලි ඉගෙනීමෙන් පහසුවෙන් ම සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් ලබා ගත හැකි බව නොරහසකි. පාලි භාෂාව අපගේ සංස්කෘතික උරුමයක් ද වෙයි. ජාතික අනන්‍යතාව පමණක් නොව දේශමාමකත්වය ගොඩ නැගූ මෙරට වංසකථා ලියා තිබෙන්නේ ද පාලි භාෂාවෙනි. ඒවා හුදු ඉතිහාසයක් දක්වන ග්‍රන්ථ පමණක් නොව සම්භාව්‍ය සාහිත්‍යයක් ලෙස ද වැදගත් වෙයි. ශෘංගාර ආදි ලෞකික සාහිත්‍යය රස ජනනයෙහි ලා වැඩි සැලකිල්ලක් නොදක්වා යථාර්ථවාදී ලෙස ජීවිතය දෙස බලන්නට පාලි රචනාවන් උත්සාහ කොට ඇත. ලෝකයේ මෙතෙක් ව්‍යවහාරයට පත් ගීතවත් භාෂා අතර පාලියට හිමිවන්නේ ප්‍රමුඛස්ථානයකි. පාලි පිරිත් හා ගාථා සජ්ඣායනාවන්ට සවන් දීමෙන් ඒ බව වටහා ගත හැකි ය. පාලි භාෂාවට ව්‍යාකරණ සාහිත්‍යයක් ද ඇත. සංස්කෘත ශබ්ද ශාස්ත්‍ර පරිශීලනයෙන් පාලි ව්‍යාකරණය ගොඩනගා ඇතත් පාලියට ම ආවේණික වූ අනන්‍යතාවක් ද ඇත. එහි බුද්ධදේශනා පදනම් කොට ගෙන සැකසී ඇති පාලි ව්‍යාකරණය වෙනත් ව්‍යාකරණ සම්ප්‍රදායන් මෙන් නොව භාවිත ව්‍යවහාරයට ඉතාමත් සමීප වෙයි. මීට අතිරේක වශයෙන් වන ඡන්දෝලංකාර ක්ෂේත්‍රය ද සලකා බලන විට අවශ්‍ය කරන අංග ලක්ෂණ සියල්ලකින් සමන්විත වූවක් ලෙස පාලි භාෂාව හැඳින්විය හැකි ය.

# ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයින් සහ කණ්ඩායම් ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතුය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරණු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම, අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I — මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික අභිමානය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ ගැනීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාවය තහවුරු කිරීම

II — වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III — මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV — පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V — සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංගලක්ෂණ සංවර්ධනය කිරීම

VI — පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII — ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථකව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII — ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම ( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව )

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන ඉහත සඳහන් ජාතික අරමුණු සාක්ෂාත් කර ගැනීමට පහත දැක්වෙන මූලික නිපුණතා දායක වනු ඇත.

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදිව සහ නිරවුල්ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය : පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද සේවා පරිශ්‍රයක් තුළදී ද තම පෞද්ගලික ජීවිතයේදී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා: ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය, මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන් හා චිත්තවේගී බුද්ධිය.

(III) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අබෝධය, සංවේදීබව හා කුසලතා

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට එවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, සහ විවේකය, අපද්‍රව්‍යසහ මලපහ කිරීම ආදිය හා සම්බන්ධ වූ අබෝධය සහ සංවේදිතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත්වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගුවේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම, තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම, වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුශලතා

(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදීව හා සාර්ථකව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම.

( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව )

# පාලි විෂය අධ්‍යයනයේ අරමුණු

- පාලි භාෂාව හා තදනුබද්ධ සාහිත්‍යය හඳුනා ගැනීම
- පාලි භාෂාවේ ව්‍යාකරණාංග පිළිබඳ දැනුමක් ලබා ගැනීම
- ත්‍රිපිටක සාහිත්‍යයේ සංවර්ධනය සහ විකාසය පිළිබඳ අවබෝධය ලබා ගැනීම
- භාෂා සාහිත්‍යය හැදෑරීමෙන් ලබන අත්දැකීම් පදනම් කරගෙන සමාජයට අවශ්‍ය යහපත් පෞරුෂයක් ගොඩනගාගැනීම
- කරුණාව, මෛත්‍රිය, දයාව, පරිත්‍යාගශීලිත්වය, අල්පේච්ඡතාව වැනි සත්පුරුෂ ගුණාංග දියුණු කර ගැනීම
- ජාතික හා ආගමික වටිනාකම් පිළිබඳ ධනාත්මක ආකල්ප ජනනය කිරීම
- බෞද්ධ ආගමික හා සංස්කෘතික චාරිත්‍රවාරිත්‍ර විධි පාලි භාෂා මාධ්‍යයෙන් සිදු කැරෙන බැවින් ඒ පිළිබඳ කුසලතා වර්ධනය කර ගැනීම
- ජාතික ඉතිහාසය හා අනන්‍යතාව තහවුරු කර ගැනීමට අවශ්‍ය පාලි මූලාශ්‍රය කියවා තේරුම් ගැනීම
- නිර්මාණකරණයට හා ශාස්ත්‍රීය රචනාකරණයට අවශ්‍ය ව්‍යාකරණ ඥානය හා වාඞ්මාලාව පෝෂණය කර ගැනීම
- අර්ථකථා, ටීකා හා ප්‍රකරණ  කියවා ධර්මාර්ථ විවරණය කිරීමේ හැකියාව ලබා ගැනීම
- පාලි සාහිත්‍ය රසාස්වාදනයට මඟ පෙන්වීම
- ශ්‍රවණය, කථනය, පඨනය, ලේඛනය හා අවබෝධය යන භාෂා කුසලතා සංවර්ධනය කර ගැනීම

## අ.පො.ස (උසස් පෙළ) පාලි විෂය

## විෂය නිර්දේශය පාසල් වාර වශයෙන් බෙදාගැනීමට යෝජිත සැලැස්ම

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම් | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|
| 12 | I | 1.1, 1.2, 1.3, 2.1, 2.2, 2.3, 3.1, 3.2, 3.3, 4.1 | 100 |
| | II | 4.2, 4.3, 5.1, 5.2, | 100 |
| | III | 6.1, 6.2, 7.1,7.2, 8.1, 8.2, 9.1, 9.2, 9.3, 9.4, 10.1, 10.2, | 100 |
| | | එකතුව | 300 |

12 ශ්‍රේණිය

## අ.පො.ස. (උසස් පෙළ) පාලි විෂය නිර්දේශය

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 පාලි භාෂාවේ මූලික වියරණ හා භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි. | 1.1 පාලි වර්ණ මාලාව හඳුනාගෙන නිවැරදි අක්ෂර වින්‍යාසය හා සංයුක්තාක්ෂර පිළිබඳ සැලකිලිමත් වෙමින් ලියයි.<br><br>1.2 මූලික භාෂා ප්‍රයෝග උපයෝගී කර ගනිමින් වාක්‍ය නිර්මාණය හා රචනය හුරුකර ලියයි.<br><br>1.3 මූලික ව්‍යාකරණාංග හඳුනාගෙන පදසාධනය පිළිබඳ අවබෝධයෙන් යුතුව ලේඛන කාර්යයේ යෙදෙයි. | • අක්ෂර මාලාවේ ප්‍රභේද<br>• ස්වර හා ව්‍යඤ්ජන<br>• සංයුක්තාක්ෂර<br>• අක්ෂර උත්පත්තිස්ථාන<br>• උක්තාඛ්‍යාත භාවිතය<br>• කර්තෘකාරක කර්මකාරක වාක්‍ය<br>• කාරක හා උපපද විභක්ති<br>• ත්‍රෛකාලික ක්‍රියා භාවිතය<br>• සන්ධි හා එහි ප්‍රභේද<br>• අ, ඉ, ඊ, උ, ඌ, අන්ත පුල්ලිංග නාම<br>• ආ, ඉ, ඊ අන්ත ස්ත්‍රීලිංග නාම<br>• අ, ඉ, ඊ අන්ත නපුංසකලිංග නාම<br>• පූර්වක්‍රියා, තුමන්ත ක්‍රියා, උපසර්ග, නිපාත<br>• සමාස නාම<br>• තද්ධිත නාම | • පාලි වර්ණ මාලාව ප්‍රභේද කොට දක්වයි.<br>• පාලි ගද්‍ය පද්‍ය පාඨ අසා ලියයි.<br>• වාක්‍යයක මූලික ලක්ෂණ පෙන්වා දෙයි.<br>• කර්තෘ කාරක වාක්‍ය කර්මකාරකයටත් කර්මකාරක වාක්‍ය කර්තෘකාරකයටත් හරවා ලියයි.<br>• කාරක හා විභක්ති ප්‍රයෝග හඳුන්වයි.<br>• ක්‍රියාරූප කාලත්‍රයේ වරනගයි.<br>• සන්ධි ප්‍රභේද හඳුනාගෙන භාවිත කරයි.<br>• පුල්ලිංග, ස්ත්‍රීලිංග, නපුංසකලිංග ශබ්ද සියලු විභක්තිවල වරනගයි. අර්ථ ගන්වයි.<br>• පූර්ව ක්‍රියා, තුමන්ත ක්‍රියා, උපසර්ග, නිපාත හඳුනාගෙන භාවිත කරයි.<br>• පාලි සමාස හා තද්ධිත පද හඳුනාගෙන භාවිත කරයි. | 60 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේද |
|---|---|---|---|---|
| 2.0 නිවැරදි වාචික සංනිවේදනයේ යෙදෙයි. | 2.1 පාලි භාෂා සම්ප්‍රදායානුකූල ව ප්‍රශ්න අසයි.<br><br>2.2 අසන ලද ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයයි.<br><br>2.3 අදහසක් නිවැරදි ව පාලි භාෂාවෙන් ප්‍රකාශ කරයි. | • කිං (ක) ශබ්දය ඇසුරින් ප්‍රශ්න සැකසීම<br><br>• ප්‍රශ්නවාචක නිපාත උපයෝගී කර ගෙන ප්‍රශ්න ඇසීම<br><br>• අසන ලද ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු දීම<br><br>• අසන ලද ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු ලිවීම<br><br>• නිර්දිෂ්ට ග්‍රන්ථ අනුව සංවාදයක් තේරුම් ගැනීම | • ජාතක කථාවක් නිවැරදි ව කියවයි.<br>• එහි ඇති ප්‍රශ්නවාචක පද ලියයි.<br>• විවිධ ප්‍රශ්නවාචක පද ලැයිස්තු ගත කරයි.<br>• ප්‍රශ්නවාචක නාමපද ලිංගත්‍රයේ වරනගයි.<br>• ප්‍රශ්නවාචක නිපාත පදයක් වාක්‍යයක යෙදිය යුතු තැන් විස්තර කරයි.<br>• ප්‍රශ්නවාචක පද යොදා විවිධ අරුත් ඇති වාක්‍ය ලියයි.<br>• එම ප්‍රශ්නවාචක වාක්‍යවලට අදාළ ව පිළිතුරු ලියයි.<br>• සාමාන්‍ය තොරතුරු දැන ගැනීමට ප්‍රශ්න අසයි.<br>• සම්භාෂණ ප්‍රයෝග උපයෝගී කරගෙන පිළිතුරු දෙයි.<br>• ප්‍රශ්නවාචක පද එකකට වැඩි ගණනක් යොදා සංකීර්ණ වාක්‍ය සකසයි.<br>• සංකීර්ණ ප්‍රශ්නවාචක වාක්‍යවලට පිළිතුරු දෙයි. | 20 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ කියවා භාවිතයට හුරු වෙයි. | 3.1 පාලි ගද්‍ය පද්‍ය පාඨ නිවැරදි ව උච්චාරණය කරයි.<br>3.2 සම්ප්‍රදායාගත රිද්මයට අනුකූල ව සජ්ඣායනය කරයි.<br>3.3 සුවිශේෂ පාලි පාඨ වනපොත් කරයි. | • ගද්‍ය පාඨ මහාප්‍රාණ අල්පප්‍රාණ නොබිඳ උච්චාරණය කිරීම<br>• අදාළ පාඨ සජ්ඣායනය කිරීම<br>• අදාළ පාඨ වනපොත් කිරීම<br>• තෝරාගත් සුවිශේෂ පාඨ හා ගාථා වනපොත් කිරීම<br>• ගද්‍ය පද්‍ය පාඨවල අන්වය සැකසීම | • සූත්‍ර පාඨ හා ගාථා හඬනගා නිවැරදි ව කියවයි.<br>• මහාප්‍රාණ, අල්පප්‍රාණ හා සංයුක්තාක්ෂර පැහැදිලි ව උච්චාරණය කරයි.<br>• ගාථාවල විවිධ වෘත්ත හ යතිය කෙරෙහි සැලකිලිමත් ව සජ්ඣායනා කරයි.<br>• නියමිත ගද්‍ය හා පද්‍ය කොටස් මතකයෙන් කියවයි.<br>• නියමිත ගද්‍ය හා පද්‍ය කොටස් මතකයෙන් නිවැරදිව ලියයි.<br>• පද බෙදීම් පිළිබඳ අවබෝධයෙන් යුතුව සජ්ඣායනා කරයි. | 10 |
| 4.0 නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ පරිවර්තන කාර්යයේ යෙදෙයි. | 4.1 අන්වය හඳුනා ගනියි.<br>4.2 ක්‍රියාකාරක පද සම්බන්ධය නිවැරදි ව තේරුම් ගනියි.<br>4.3 පාලි උද්ධෘත පාඨ මාධ්‍ය භාෂාවට පරිවර්තනය කරයි. | • ගද්‍ය පද්‍ය පාඨවල අන්වය කීම හා ලිවීම<br>• ගද්‍ය පද්‍ය පාඨයන්හි ක්‍රියාකාරක පද සම්බන්ධය අනුව අර්ථ කීම<br>• ගද්‍ය පද්‍ය කොටස් මාධ්‍ය භාෂාවට නැගීම හා පිටපත් කිරීම<br>• සරල වාක්‍ය පරිවර්තනය කිරීම | • නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳ හැඳින්වීමක් කරයි.<br>• ජාතක කථා හා සූත්‍රවල අර්ථය ලියයි.<br>• තෝරාගත් පදවල ව්‍යාකරණ විභාග දක්වයි.<br>• සිංහල වාක්‍ය රීතිය අනුව සමස්තය තේරුම් ගෙන නිවැරදි ව පරිවර්තනයේ යෙදෙයි.<br>• ගාථා පාඨවල අන්වය ලියා දක්වයි.<br>• ක්‍රියාපද යොදා ගනිමින් කාලත්‍රයේ වාක්‍ය නිර්මාණය කරයි. | 100 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේද |
|---|---|---|---|---|
| 5.0 ගද්‍ය පද්‍ය පාඨ කියවා අර්ථය අවබෝධ කර ගනියි. | 5.1 පාලි ගද්‍ය පාඨ කියවා අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.<br>5.2 පාලි පද්‍ය පාඨ කියවා අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | • පාලි ඡේද 10 ක් ඇසුරෙන් ප්‍රශ්න විමසීම | • තෝරාගත් පාලි ගද්‍ය පාඨ හා ගාථා නිවැරදි ව කියවයි.<br>• වාක්‍යවල උක්තාඛ්‍යාත සම්බන්ධය දක්වයි.<br>• එම උක්තාඛ්‍යාත සම්බන්ධය අනුව නාම හා ආඛ්‍යාත පදවල විභක්ති, පුරුෂ හා වචන ආදී ප්‍රභේද වෙන් කර ඉදිරිපත් කරයි.<br>• සන්ධි පද විසන්ධි කර ලියයි.<br>• සමාස පද නම් කරයි.<br>• තෝරාගත් එම පාලි පාඨවල නිවැරදි අර්ථය මාධ්‍ය භාෂාවෙන් ලියයි.<br>• සරල හා සංකීර්ණ වාක්‍ය පාලියට පරිවර්තනය කරයි.<br>• පාලි ඡේදයක් ඇසුරෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | 10 |
| 6.0 පාලි භාෂා සාහිත්‍යයෙහි අන්තර්ගත සාර ධර්ම චර්යාවෙන් ප්‍රදර්ශනය කරයි. | 6.1 පාලි සාහිත්‍යාගත සාරධර්ම පිළිබඳ අවබෝධය ලබා ගැනීම සඳහා කියවයි.<br>6.2 භාෂා සාහිත්‍යාගත සාරධර්මවල සමාජ සංස්කෘතික උපයෝගීතාව අවබෝධ කර ගනියි. | • ආගමාලය, ජාතිකාභිමානය ආදිය තම ජීවිතයට යොදා ගැනීම<br>• ලෝකපාලක ධර්ම, පරිසර සංරක්ෂණය, චින්තන නිදහස ආදි ධර්ම, සමාජ සුභ සාධනයට ඉවහල්වන අයුරු පැහැදිලි කිරීම<br>• සමාජ සාර ධර්ම, සීලය, පුද්ගල වගකීම් හා යුතුකම්, ධනාත්මක චරිත ලක්ෂණ ආදිය ඉගෙන ඒවා තම ජීවිතයට යොදා ගැනීම<br>• ධර්මිෂ්ඨ රාජ්‍ය පාලනය, යුක්තිගරුකත්වය, සාධාරණත්වය යනාදිය සමාජ සුභ සාධනයට ඉවහල්වන අයුරු පැහැදිලි කිරීම | • නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය කොටස් කියවා ඒවායේ සාර ධර්ම නම් කරයි.<br>• ධම්මපදයේ පණ්ඩිත වග්ගයේ, දීඝනිකායේ සිගාලක සූත්‍රයේ, ජාතකට්ඨකථාවේ මහාසුපින ජාතකයේ එන කරුණුවලට අනුව තම ජීවිත ප්‍රතිපදාව සකසා ගනියි. | 25 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේද |
|---|---|---|---|---|
| 7.0 පාලි සාහිත්‍ය රසාස්වාදයේ යෙදෙයි. | 7.1 නිර්දිෂ්ට පාලි ගද්‍ය පද්‍ය පාඨයන්හි අන්තර්ගත කාව්‍යෝක්ති හඳුනා ගෙන ලියා දක්වයි.<br><br>7.2 ගද්‍ය පද්‍ය පාඨයන්හි අන්තර්ගත කාව්‍යෝක්ති රසවින්දනයට හා ඇගයීමට පුහුණු වෙයි. | • පණ්ඩිත වග්ග, සිගාලක සුත්ත, මහාසුපින ජාතක යන මේවායේ ඇතුළත් උපමා, රූපක, ස්වභාවෝක්ති, අනුප්‍රාස ආදී සුවිශේෂී කාව්‍යාත්මක යෙදුම් හා ප්‍රකාශන උද්ධෘත කර නම් කිරීම<br><br>• නිර්දිෂ්‍ය ග්‍රන්ථාගත පාඨවල සාහිත්‍යමය රසය විවරණය කිරීම | • නිර්දිෂ්ට සාහිත්‍ය කොටස්වල සන්දර්භය පිළිබඳ අවබෝධය ලබා ගනියි.<br>• අදාළ ආඛ්‍යානය හෝ ඓතිහාසික සංසිද්ධිය මැනවින් පැහැදිලි කරයි.<br>• ආඛ්‍යානයන් හෝ ඓතිහාසික සංසිද්ධි විවරණයෙන් අපේක්ෂිත අරමුණ විශ්ලේෂණය කරයි.<br>• පුද්ගල ගති ලක්ෂණ හඳුනා ගෙන ඒවා ඉස්මතු කොට දක්වයි.<br>• උපමා, රූපක, ස්වභවෝක්ති හා අනුප්‍රාසාත්මක යෙදුම් විශ්ලේෂණය කරයි.<br>• භාෂා භාවිතය, අවස්ථා නිරූපණ ආදිය විවරණය කරයි.<br>• විවිධ රස හඳුනාගෙන රසාස්වාදයේ යෙදෙයි.<br>• කාව්‍යමය හා සාහිත්‍යමය ලක්ෂණ පෙන්වමින් විචාරාත්මක ලේඛනයේ යෙදෙයි. | 15 |
| 8.0 පාලි සාහිත්‍යාගත බෞද්ධ සංස්කෘතිය වටහාගෙන එය සමාජ සහජීවනය ගොඩනගා ගැනීමට උපයෝගී කර ගනියි. | 8.1 පාලි සාහිත්‍යාගත සුවිශේෂී බෞද්ධ සංකල්ප හඳුනාගෙන ඒවායේ සංස්කෘතික වැදගත්කම හදාරයි.<br><br>8.2 පාලි සාහිත්‍යාගත සුවිශේෂී බෞද්ධ සංකල්ප හඳුනාගෙන ඒවා සමාජ සහජීවනය උදෙසා යොදා ගනියි. | • විවිධ සමාජ ස්තරයන් පිළිබඳව පැවතිය යුතු ආචාර සමාචාර විධි<br><br>• සත්පුරුෂ හා පණ්ඩිත ගති ලක්ෂණ<br><br>• නිර්දිෂ්ට කෘති ආශ්‍රයෙන් සාහිත්‍යමය හා කාව්‍යාත්මක යෙදුම් හා ප්‍රකාශන පිළිබඳ දැනුම ලබා ගැනීම<br><br>• දීඝනිකායේ සිගාලක සූත්‍රය, ධම්මපදයේ පණ්ඩිත වග්ගය, මහාසුපින ජාතකය ආශ්‍රයෙන් පඤ්චසීලය, කුසල් අකුසල් ආදියෙහි සමාජ සංස්කෘතික වැදගත්කම | • සංස්කෘතික වටිනාකමක් සහිත සංකල්ප හැඳින ගැනීම සඳහා පාලි සාහිත්‍යය කියවයි.<br>• නිර්දිෂ්ට ජාතක කථාවේ සමාජ ආර්ථික, දේශපාලන තත්වය විග්‍රහ කරයි.<br>• නිර්දිෂ්ට කෘතිවල සංස්කෘතික වටිනාකම් සාකච්ඡා කරයි.<br>• ධම්මපදයේ නිර්දේශිත කොටස වාචෝද්ගත කරයි.<br>• නිර්දිෂ්ට කෘතිවල ආගමික හා දාර්ශනික සංකල්ප පැහැදිලි කරයි. | 15 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේද |
|---|---|---|---|---|
| 9.0 පාලි සාහිත්‍යයේ ව්‍යූහය පිළිබඳ අවබෝධය ලබා ගැනීම සඳහා පාලි සාහිත්‍ය ග්‍රන්ථ පරිශීලනය කරයි. | 9.1 පාලි භාෂාවේ ප්‍රභවය පිළිබඳ අවබෝධය ලබා ගැනීමට කියවයි<br><br>9.2 ත්‍රිපිටක සාහිත්‍යය වර්ගීකරණය කරයි<br><br>9.3 පාලි ත්‍රිපිටක ග්‍රන්ථ හඳුන්වයි.<br><br>9.4 පාලි ත්‍රිපිටක සාහිත්‍යයේ ඓතිහාසික පෙළ ගැස්ම පැහැදිලි කරයි. | • පාලි භාෂාවේ ප්‍රභවය, ත්‍රිපිටකයේ වර්ගීකරණය, අන්තර්ගත ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, වර්ග, සූත්‍ර හා බණවර පිළිබඳ අවබෝධය ලබා ගැනීම | • පාලි භාෂාවේ ප්‍රභවය පිළිබඳ මත සමාලෝචනය කරයි.<br>• ත්‍රිපිටක වර්ගීකරණයන්හි පෞරාණිකත්වය පැහැදිලි කරයි.<br>• වඩාත් ප්‍රායෝගික හා විධිමත් වර්ගීකරණය විස්තර කරයි.<br>• ත්‍රිපිටකයට අයත් ග්‍රන්ථ වෙන් වශයෙන් ලියා දක්වයි.<br>• ප්‍රථම සංගායනාවේ දී ත්‍රිපිටක ග්‍රන්ථයන්හි භාරකාරත්වය පැවරීම පිළිබඳ අටුවා වාර්තා පැහැදිලි කරයි.<br>• පිටක ග්‍රන්ථයන්හි අන්තර්ගත සූත්‍ර, ශික්ෂාපද, මාතිකා හා බණවර සංඛ්‍යා ලියා දක්වයි.<br>• ත්‍රිපිටකයේ ඇතුළත් ශ්‍රාවක දේශනා බුද්ධ දේශනාවලින් වෙන්කර දක්වයි.<br>• ඛුද්දක නිකායේ පෞරාණිකත්වය පිළිබඳ මත සමාලෝචනය කරයි.<br>• අන්තර්ගතය, භාෂා ශෛලිය හා ඡන්දස් ආශ්‍රයෙන් පිටකාගත දේශනාවන්හි පැරණි හා පසුකාලීන බව තේරුම් කරයි.<br>• අභිධර්ම පිටකයේ ඓතිහාසිකත්වය සම්බන්ධයෙන් පවත්නා මත සමාලෝචනය කරයි. | 20 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේද |
|---|---|---|---|---|
| 10.0 අර්ථ විවරණ හැකියාව වර්ධනය කර ගනියි. | 10.1 නිර්දිෂ්ට කෘතිවල ඇතුළත් විශේෂ පද විග්‍රහ (විභාග) කරයි.<br><br>10.2 තෝරාගත් විශේෂ පදවල ධර්මාර්ථ විවරණය කරයි. | • තෝරාගත් පදවල ව්‍යාකරණ ප්‍රභේද විස්තර කිරීම<br><br>• අංකිත පදවල ධර්මාර්ථ අටුවා ඇසුරින් පැහැදිලි කිරීම | • නිර්දිෂ්ට කොටස්වල අර්ථ විවරණය කරයි.<br>• නියමිත කොටස්වල ව්‍යාකරණ විභාග ගෙනහැර දක්වයි.<br>• පද හා අර්ථ අතර ඇති සම්බන්ධය පැහැදිලි කරයි.<br>• උද්ධෘත පදවල ධර්මානුකූල විවරණ පැහැදිලි කරයි.<br>• නිර්දිෂ්ට ඡේදවල පසුබිම විශ්ලේෂණය කරයි.<br>• නිවැරදි පාලි වාක්‍ය රචනයේ යෙදෙයි.<br>• නාම, සන්ධි, සමාස, තද්ධිත සහ කාරක ප්‍රයෝග ආදී ව්‍යාකරණාංගවල භාවිතය හඳුන්වයි.<br>• වාච්‍යාර්ථය, ලක්ෂ්‍යාර්ථය හා ධ්වන්‍යාර්ථය පැහැදිලි කරයි.<br>• පාලි භාෂාවේ විශේෂ ප්‍රයෝග පිළිබඳ අවබෝධය ලබයි. | 25 |

# නිර්දිෂ්ට ග්‍රන්ථ

## (අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයට නියමිත)

## (2017 සිට)

**12 ශ්‍රේණිය**

| | | | |
|---|---|---|---|
| 1. | දීඝනිකාය | - | සිගාලකසුත්ත (සිගාලෝවාද සුත්ත) |
| 2. | ධම්මපද | - | පණ්ඩිතවග්ග |
| 3. | ජාතකට්ඨකථා | - | මහාසුපිනජාතක |
| 4. | පාලි සාහිත්‍යය | - | 1,2, පරිච්ඡේද හා 3 පරිච්ඡේදයේ දීඝ, මජ්ඣිම හා ඛුද්දක යන නිකාය තුන සහ විනය හා අභිධර්ම පිටකයන්ට අදාළ කොටස් |
| | පාලි සාහිත්‍යය | - | (පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි) |

**අතිරේක කියවීම්**

1. ධම්මපදට්ඨකථා - පණ්ඩිතවග්ග
2. පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි, පාලි සාහිත්‍යය, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ, 2012.
3. පැණිහෙළ සිරිසම්බෝධි හිමි, පාලි භාෂාව හා රචනය, සමයවර්ධන, කොළඹ, 1999
4. පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි, පාලි භාෂාවතරණය, පළමු වන සහ දෙවන පොත්, සමයවර්ධන, කොළඹ, 1999
6. අසෝක කරුණාරත්න, පාලි සංග්‍රහය, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1964 (2015)
7. Ven. Polwatte Buddhadatta , New Pali Course 1 & 2, Buddhist Cultural Centre, Colombo

## පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්

පන්ති කාමරයේ ඒකාකාරී ක්‍රියාවලියෙන් බැහැර නිපුණතා සංවර්ධනය සඳහා ශිෂ්‍යයා දැනුම ගවේෂණය කරන්නෙකු බවට පත් කළ යුතු ය. ඒ සඳහා පාලි භාෂාව නම් විෂය ශිෂ්‍යයා තුළ ආත්මගත කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු ය. පන්ති කාමරයෙන් බැහැර පහත සඳහන් වැඩ සටහන් සංවිධානය කිරීම පාලි භාෂාව පිළිබඳ නිපුණතා වර්ධනයට උපයුක්ත වේ යැයි සිතමු.

- පාලි බිත්ති පුවත්පතක් ක්‍රියාත්මක කිරීම
- පාලි භාෂා දිනයක් සංවිධානය කිරීම
- ගාථා හා සූත්‍ර ගායනා තරග සංවිධානය කිරීම
- පාලි කථික තරග සංවිධානය කිරීම
- පාලි භාෂා සාහිත්‍යය පිළිබඳ ගවේෂණාත්මක ව්‍යාපෘති කරවීම
- පාලි සමිතියක් පැවැත්වීම

පාසලේ හෝ පිරිවෙනෙහි පසුබිමට හා සංස්කෘතියට අදාළ වන පරිදි විද්‍යාස්ථානයේ මානව හා භෞතික සම්පත්වලට අනුකූල ලෙස මෙම වැඩසටහන් සංවිධානය කර ගැනීම යෝග්‍ය වේ.

# තක්සේරුව හා ඇගයීම

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙළ යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් උපකරණ නිර්මාණාත්මකව පිළියෙල කොට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ය.

ඉගෙනුම් කාර්යයේදී අපේක්ෂිත නිපුණතා මට්ටමට පැමිණ අත්පත් කරගෙන ඇති ඉගෙනුම් පලයන්ගේ ගුණාත්මක බව සොයා බැලීමට තක්සේරුව හා ඇගයීම අවශ්‍ය වේ.

නිපුණතා මට්ටම් ඔස්සේ අපේක්ෂිත ඉගැනුම් පලවලට ළඟා වන ආකාරය හඳුනා ගැනීම තක්සේරුවේ දී සිදුවේ. මුල දී තීරණය කරගත් නිර්ණායක සමඟ සසඳා බලමින් අදාළ නිපුණතා කවර මට්ටමකින් ළමයා සාක්ෂාත් කරගෙන තිබේදැයි පරීක්ෂා කළ යුතු වේ. ඒ අනුව ප්‍රබලතා, දුබලතා හඳුනාගෙන ප්‍රතිපෝෂණ වැඩ සටහන් සංවිධානය කළ යුතුය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර දී කණ්ඩායම් ගවේෂණය, ශිෂ්‍ය ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීම යන අවස්ථාවල තක්සේරු කාර්යය මැනවින් කළ හැකි ය.

# ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

පාලි භාෂාව පිළිබඳ අ.පො.ස. (උ. පෙ.) නව විෂය නිර්දේශය සකස් කොට ඇත්තේ නිපුණතා පාදක කර ගෙනය. නිපුණතා පාදක අධ්‍යාපනයේ දී ශිෂ්‍ය කාර්යය ප්‍රමුඛස්ථානයක් ගනී. අද වන විට විශේෂයෙන් අ.පො.ස. (උ. පෙ.) අධ්‍යාපන ක්‍රමය සකස් වී ඇත්තේ දේශන ක්‍රමය කේන්ද්‍ර කරගත් සම්ප්‍රේෂණ භූමිකාවක ගුරුවරයා සිටින ආකාරයෙනි. එහෙත් නව නිපුණතා පාදක අධ්‍යාපනයේ දී පැරණි සම්ප්‍රේෂණ භූමිකාව හැරදමා ගුරුවරයා සිසුන් ගවේෂණයට යොමුකරන මාර්ගොපදේශකයෙකු විය යුතු ය. මෙහි දී පාලි භාෂාවේ සුවිශේෂී අධ්‍යාපන ක්‍රම හා නවීන ක්‍රම ශිල්ප කිහිපයකුත් යොදාගත හැකි ආකාරය පිළිබඳ කෙටියෙන් සඳහන් කරමු.

බුදුරජාණන් වහන්සේ මාර්ගදර්ශකයාණෝ ය. ගුරුවරයා විසින් පාලි භාෂාව ඉගැන්වීමේදී බුදුරදුන් අනුගමනය කළ ක්‍රමවේදය උපයෝගී කර ගැනීම වඩාත් සුදුසු ය. එබැවින් නූතන ගුරුවරයා මනෝ මූලික හා විෂය මූලික සාධක ඔස්සේ පූර්ව විනිශ්චයන්ට නොඑළඹ ශිෂ්‍යයා ගවේෂකයෙකු හා නවෝත්පාදකයෙකු කිරීමට මර්ගෝපදේශ සැපයීම මැනවි.

### 1 ක්‍රමය

"සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙ කල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං" (මහාවග්ගපාලි)

| | | |
|---|---|---|
| ආදිකල්‍යාණං | - | පාඩමක ආරම්භය ශිෂ්‍යයා පොළඹවන, සිත්ගන්නාසුලු චමත්කාර ජනක අත්දැකීම් ඇසුරින් ඉදිරිපත් විය යුතු ය. |
| මජ්ඣෙ කල්‍යාණං | - | පාඩමෙහි මැද සාරවත් කරුණු අන්තර්ගත විය යුතුවාසේම පැහැදිලි හා නිරවුල් විය යුතු ය. තව දුරටත් ශිෂ්‍යයා මාතෘකාවට පොළඹවන, ගවේෂකයෙකු කරවන ක්‍රියාවලියක් විය යුතු ය. |
| පරියොසානකල්‍යාණං | - | පාඩමේ අවසානය ශිෂ්‍යයා ප්‍රාප්ති මට්ටමකට පමුණුවා ශිෂ්‍යයාගේ චර්යාත්මක වෙනසක් ඇති කිරීමට සමත් විය යුතු ය. |
| සාත්ථං | - | පාඩම සරල සුගම හා අර්ථවත් කරුණුවලින් සමන්විත විය යුතු ය. |
| සබ්‍යඤ්ජනං | - | යොදාගන්නා වාඞ්මාලාව අරුත් ප්‍රකට කරවන අදහස් නිවැරදිව සන්නිවේදනය කරවන්නක් විය යුතු ය. |
| පරිසුද්ධං | - | පාඩම අසභ්‍ය හා ග්‍රාම්‍ය ව්‍යවහාරයෙන් තොර විය යුතුය. |
| කේවලපරිපුණ්ණං | - | පාඩම ඌණතාවලින් තොරව භාෂණය, ලේඛනය, චින්තනය, චරිතායනය කර ගැනීමට හැකිවන අංගයන්ගෙන් සමුපලක්ෂිත විය යුතු ය. |

මෙම ලක්ෂණවලින් යුතුව පාඩමක් මෙහෙයවීමෙන් ශිෂ්‍යයා නිපුණතාවට ළංවන අතර ශිෂ්‍යයාගේ චර්යාත්මක වෙනසක් ද ඇති කළ හැකි ය.

### 2 ක්‍රමය

**ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා** විවරණා විභජනා උත්තානිකම්මං
(සච්චවිභංග සුත්ත - මජ්ඣිම නිකාය)

ශිෂ්‍ය සාධනය ඔප් නැංවීමට උචිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමයක් සච්චවිභංග සූත්‍රයේ අන්තර්ගතය.

| | | |
|---|---|---|
| ආචික්ඛනා | - | පාඩමට අදාළව අපේක්ෂිත කරුණු කෙටියෙන් කීම |

| | | |
|---|---|---|
| දෙසනා | - | උචිත භාෂාව යොදා ගනිමින් කෙටියෙන් කී කරුණු ගුරුවරයා කෙරෙහි ප්‍රාමාණික විශ්වාසයක් ඇතිවන පරිදි ධර්මානුකූලව විස්තර කිරීම |
| පඤ්ඤපනා | - | ශිෂ්‍යයාගේ බුද්ධියට හා ප්‍රඥාවට යෝග්‍ය ලෙස කරුණු පෙළ ගැස්වීම |
| පට්ඨපනා | - | අපේක්ෂිත අරමුණෙහි ශිෂ්‍යයා පිහිටුවීම |
| විවරණා | - | වසා තිබූවක් විවෘත කරන්නාක් සේ හේතුඵලවාදී ව කරුණු විවරණය කිරීම |
| විභජනා | - | කරුණු විශ්ලේෂණය කොට කුඩා අනුකුඩා කොටස්වලට බෙදා විග්‍රහ කිරීම |
| උත්තානිකම්මං | - | සංයුක්ත සංකල්ප නිදසුන් වශයෙන් ගෙනහැර දක්වමින් ශ්‍රාවක බුද්ධියට ගෝචරවන ලෙස මතුකර දැක්වීම හා ශිෂ්‍යයා ගැටළුවෙන් නිදහස් කිරීම |

මෙම ක්‍රම අනුගමනය කිරීමෙන් ද ශිෂ්‍ය නිපුණතාව ඉහළ නැංවිය හැකි ය

**3 ක්‍රමය**

ශිෂ්‍යයාගේ අවබෝධය දියුණු කිරීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රමය අනුපූර්ව ප්‍රතිපදාවයි. ශිෂ්‍යයාට අලුත් අත්දකීම් ලබා දෙන විට එය ඔහුගේ අතීත අත්දැකීම්වලට සම්බන්ධ දෙයක්වීම වැදගත් වේ. ශිෂ්‍යයා ආස්වාදිත දෙයෙහි සිට නොදන්නා සත්‍යය කරා යොමුකරවීම මෙම අධ්‍යාපන ක්‍රමයේ පිළිවෙළයි.

| | | |
|---|---|---|
| සද්ධාජාතො උපසංකමති | - | ශ්‍රද්ධාව ඇතිකර ගැනීමයි. ගුරුවරයා කෙරේ ශිෂ්‍යයාගේ විශ්වාසය ගොඩනගා ගැනීමයි. එසේ විශ්වාසය ගොඩනැගීම නිසා ශිෂ්‍යයා ගුරුවරයා වෙත එළඹෙයි. |
| පයිරුපාසති | - | විශ්වාසය ගොඩනැගීම නිසා ශිෂ්‍යයා ගුරු ඇසුර ලැබීමට ප්‍රිය කරයි. |
| සොතං ඔදහති | - | පාඩමට සාවධාන ව හා අවික්ෂිප්ත ව ඇහුම්කන් දෙයි. |
| සුත්වා ධාරෙති | - | ඇසූ පාඩම සිතේ දරා ගනියි. |
| අත්ථං උපපරික්ඛති | - | දරාගත් කරුණුවල අර්ථය නුවණින් පරීක්ෂා කර බලයි. |
| ධම්මා නිජ්ඣානං ඛමන්ති | - | කරුණු නුවණින් සලකා බලා වටහා ගනියි. |
| ඡන්දො ජායති | - | කරුණු වටහා ගැනීම නිසා ගුරුවරයාගේ පාඩමට රුචියක් ඇති වෙයි. |
| උස්සහති | - | පාඩමේ කරුණුවල ප්‍රාප්ති මට්ටමට ළඟාවීමට උත්සාහ කරයි. |
| තුලෙති | - | වෙනත් කරුණු හා තුලනය කර බලයි. |
| පදහති | - | සන්සන්දනය කොට නිපුණතා මට්ටමට යාමට වීර්ය කරයි. |
| සච්චං සච්ඡිකරොති | - | සත්‍ය වූ තත්ත්වය අවබෝධ සාක්ෂාත් කර ගනියි. |

පඤ්ඤාය ච නං පටිවිජ්ඣ පස්සති - නුවණින් ද එය විනිවිද දකී

(කීටාගිරි සුත්ත - මජ්ඣිමනිකාය)

සරල අවස්ථාවේ සිට අනුක්‍රමයෙන් ගැඹුරට යන ආකාරයේ පිළිවෙළක් මෙහි දක්නට ඇත. පාලි භාෂාව විෂයෙහි ශිෂ්‍ය නිපුණතාව ඇති කිරීමේ දී මෙම ඉගැන්වීම් ක්‍රම උපයෝගී කර ගත හැකි ය. මෙබඳු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම රාශියක් පාලි සාහිත්‍යයේ අඩංගු ය.

පාලි භාෂාවේ නව විෂය නිර්දේශය ඉගැන්වීමට සරල සුගම ක්‍රමවේදයක් මෙහිලා දක්වමු. (ආශ්‍රය පාලි භාෂාව 9 - 10 අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1984)

i පියවර - නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට පාලි පාඨ හා ඡේද උස් හඬින් ගුරුවරයා විසින් කියවීම, පාලි විෂයේ ආරම්භක ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට එම භාෂාව කණට හුරු කරවීම මෙයින් අපේක්ෂා කෙරේ. පාලි භාෂා ව්‍යවහාරය දරුවන්ගේ ඇසට, කණට හුරු කරවීමට මෙම ක්‍රමය යෝග්‍ය වේ.

ii පියවර - අනතුරුව ගුරුවරයා විසින් කළ යුත්තේ එකී කොටස අර්ථවත් ලෙස භාවාර්ථ පැහැදිලි වන පරිදි ඉදිරිපත් කිරීම.

එමගින් පාලි භාෂා ව්‍යවහාරය හා රීතිය ශිෂ්‍යයාගේ ඉන්ද්‍රියන්ට හුරුවනු ඇත.

iii පියවර - කාලවේලාව අනුව පාලි උද්ධෘතය ශිෂ්‍යයන් ලවා සාමූහික ව හෝ වෙන් වෙන් හෝ නිවැරදි උච්චාරණය සහිත ව කියවීම ප්‍රයෝජනවත්

iv පියවර - පාලි උද්ධෘතයන්හි අර්ථය අවබෝධ කර ගැනීමට ගුරුවරයා සිසුන්ට උදව් කළ යුතු ය.

v පියවර - උද්ධෘත ඡේදවල වාක්‍ය හා වාක්‍යාංශ කලුලෑල්ලේ ලියා එම යෙදුම් රටාව ශිෂ්‍යයාට පැහැදිලි කළ යුතු ය.

vi පියවර - උද්ධෘත ඡේදවල ඇතුළත් පද හා වාක්‍යවල ව්‍යාකරණ ලක්ෂණ පැහැදිලි කළ යුතු ය. මෙය සරල ක්‍රමවේදවලින්

පටන් ගෙන සංකීර්ණ ක්‍රම දක්වා වැඩි කිරීම සුදුසු ය.

vii පියවර - වැදගත් ගාථා හා ඡේද වනපොත් කිරීමේ අවශ්‍යතාව ශිෂ්‍යයන්ට ඒත්තු ගැන්වීම අවශ්‍ය වෙයි.

මෙම ක්‍රමවේදය අනුගමනය කිරීම මගින් ශිෂ්‍යයන් අපේක්ෂිත නිපුණතා මට්ටමට ළඟාවනු ඇත. සිසුන් කරුණු හා තොරතුරු ගවේෂණයට යොමු කළ යුතු ය. ගවේෂිත කරුණු අධීක්ෂණය ගුරුවරයා විසින් කළ යුතු ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පන්ති කාමරයට පමණක් සීමා නොකොට බාහිර ක්‍රියාකාරකම් කෙරෙහි ද යොමු කිරීම ගුරුවරයාගේ යුතුකමකි. සිසු දරුවන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ නිරතුරු අවධානයෙන් සිටීමෙන් ඇගයීම හා තක්සේරුව ද විනිවිදභාවයකින් යුතුව කිරීමට ගුරුවරයාට ඉඩකඩ සැලසේ. මෙම නව විෂයමාලා සංශෝධනයේ අපේක්ෂාව ගුරුවරයාත් ශිෂ්‍යයාත් අතර වූ සම්ප්‍රේෂණ අධ්‍යාපන ක්‍රමය සංවර්ධනය කර ක්‍රියාකාරී ගවේෂණාත්මක අධ්‍යාපන ක්‍රමවේදයකට යොමු කිරීම හා එමගින් සිසුන්ගේ නිපුණතාව ඉහළ නංවා සමාජයට රටට යෝග්‍ය පුරවැසියන් බිහි කිරීමයි.

# 01. ඒකකය - අක්ෂර මාලාව

**නිපුණතාව**

1.0 පාලි භාෂාවේ මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

1:1 පාලි වර්ණ මාලාව හඳුනාගෙන නිවැරදි අක්ෂර වින්‍යාසය හා සංයුක්තාක්ෂර පිළිබඳ ව සැලකිලිමත් වෙමින් ලියයි.

**කාලච්ඡේද 05 යි.**

**ඉගෙනුම් පල**

- පාලි වර්ණමාලාව නිවැරදි ව උච්චාරණය කරයි.
- පාලි වර්ණමාලාව නිවැරදි ව පිළිවෙළින් ලියයි.
- පාලි වර්ණමාලාව වර්ගීකරණය කරයි.
- අක්ෂර ප්‍රභේද නම් කර, ඒ ඒ අක්ෂර කිනම් ප්‍රභේදයකට අයත් දැයි ලියා දක්වයි.
- සංයුක්ත අක්ෂර නිවැරදි ව භාවිත කරයි.
- අල්පප්‍රාණ හා මහාප්‍රාණ අක්ෂර ලියා දක්වා, නිසි පරිදි උච්චාරණය කරයි.
- එකාර, ඔකාර භාවිතය පෙන්වා දෙයි.
- පාලි වර්ණමාලාවේ ප්‍රභේද ප්‍රකට වන පරිදි වගුගත කොට දක්වයි.
- අක්ෂර උත්පත්තිස්ථාන නම් කොට ඒ ඒ ස්ථානයෙන් උපදවන අක්ෂර පෙන්වා දෙයි.
- සාම්ප්‍රදායික ලේඛන රීතියට අනුව පාලි ඡේද ලියා දක්වයි.
- දුරවබෝධ දුෂ්කර වචන නිවැරදි ව ලියයි. කියවයි.
- පාලි නිර්දිෂ්ට ගද්‍ය හා පද්‍ය පාඨ අසා ලියයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය යටතේ දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- පාලි වර්ණමාලාව අකුරු හතළිස් එකකින් යුක්ත වන බව
- පාලි වර්ණමාලාව ස්වර හා ව්‍යඤ්ජන වශයෙන් ප්‍රභේද වන බව
- ස්වර, හ්‍රස්ව හා දීර්ඝ වශයෙන් ප්‍රභේද වන බව
- ව්‍යඤ්ජන, වර්ගාක්ෂර, අවර්ගාක්ෂර, වර්ගාන්තාක්ෂර, අල්පප්‍රාණ, මහාප්‍රාණ, අඝෝෂ, ඝෝෂ, අනුස්වාර ආදී වශයෙන් ප්‍රභේද වන බව
- සංයුක්තාක්ෂර භාවිතය පිළිබඳ පාලි ලේඛන සම්ප්‍රදායයක් ඇති බව
- අල්පප්‍රාණාක්ෂර, මහාප්‍රාණාක්ෂර හා අඝෝෂාක්ෂර, ඝෝෂාක්ෂර නිවැරදි ව උච්චාරණය කළ යුතු බව.
- නිග්ගහීතය වර්ගාක්ෂරයක් හා යෙදෙන විට වර්ගාන්තාක්ෂර ආදේශ වන බව
- පාලි භාෂාවේ දන්තජ සකාරය පමණක් ඇති බව
- සංයුක්තාක්ෂරයකට මුලින් යෙදෙන විට එකාරය හා ඔකාරය හ්‍රස්ව වන බව
- පාලි වර්ණමාලාවේ අකුරු උපදින ස්ථාන ඇති බව
- පාලි වර්ණමාලාව ඒකජාක්ෂර, ද්විජාක්ෂර වශයෙන් වර්ග කළ හැකි බව
- පාලි වර්ණමාලාව උත්පත්තිස්ථාන අනුව හා ප්‍රභේද අනුව වගුගත කළ හැකි බව
- සාම්ප්‍රදායික ලේඛන රීතියට අනුව පාලි පද, වාක්‍ය හා ඡේද ලියා දැක්විය යුතු බව

- දුරවබෝධ දුෂ්කර වචන නිවැරදිව ලිවිය යුතු බව, නිවැරදි ව උච්චාරණය කළ යුතු බව
- අර්ථය ගම්‍ය වන පරිදි නිවැරදි අක්ෂර වින්‍යාසය සහිතව පාලි පාඨ ලිවිය යුතු බව

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- විද්‍යුත් උපකරණ භාවිතයෙන් හෝ පුවරුවක් මත ලියා දැක්වීමෙන් හෝ අක්ෂර මාලාව ප්‍රදර්ශනය කිරීම
- අල්පප්‍රාණ, මහාප්‍රාණ, ඝෝෂ හා අඝෝෂ ප්‍රකට වන වන පරිදී උච්චාරණය කරවීම
- එකාර හා ඔකාර භාවිතය හ්‍රස්ව හා දීර්ඝ වන ආකාරය පෙන්වා දීම
- අක්ෂර මාලාව ප්‍රභේද කොට දැක්වීම
- පාලි භාෂාවේ දන්තජ සකාරය පමණක් භාවිත වන බව පෙන්වා දීම
- උත්පත්තිස්ථාන දැක්වෙන බාලාවතාර පාඨය වන පොත් කරවා වගුවක් ඇසුරින් පැහැදිලි කිරීම
- සංයුක්තාක්ෂර භාවිත වන ආකාරය පෙන්වා දීම
- සංකීර්ණ සංයුක්තාක්ෂර සහිත වචන නිර්දිෂ්ට කෘතිවලින් උපුටා දැක්වීම
- පාලි භාෂාවේ විෂම සංයුක්තාක්ෂර සහිත (තත්‍ර, බ්‍රෑහි) වැනි වචන උපුටා දැක්වීම
- අක්ෂර විපර්යාස වන තැන් පෙන්වා දීම (බව්හාබාධ)
- නිතර වරදවා උච්චාරණය කෙරෙන වචන පෙන්වා දීම
- පාලි ගද්‍ය පද්‍ය පාඨ නිවැරදි ව කියවීමට හා ලිවීමට උපදෙස් දීම
- පාලි වචන අකාරාදි පිළිවෙළට සකස් කරවීම
- පාලි වචනවල ස්වර ව්‍යඤ්ජන වෙන් කර දැක්වීම

**තක්සේරුව හා ඇගයීම**

- පාලි වර්ණ මාලාව මතකයෙන් කියයි, ලියා දක්වයි.
- පාලි වර්ණ මාලාව ප්‍රභේද කොට දක්වයි.
- නිදසුන් සහිත ව එකාර හා ඔකාර භාවිතය පැහැදිලි කරයි.
- ව්‍යඤ්ජනාක්ෂර ස්වරාරූඪ කර දක්වයි.
- සංයුක්තාක්ෂර නිවැරදි ව ලියා දක්වයි.
- අර්ථ ගැන්වෙන පරිදි අල්පප්‍රාණාක්ෂර, මහාප්‍රාණාක්ෂර ඇතුළත් වචන ලියයි.
- අක්ෂර උත්පත්තිස්ථාන නම් කොට ඒ ඒ ස්ථානයට අදාළ බාලාවතාර සූත්‍ර පාඨය යොදා ගනිමින් අක්ෂර ලියා දක්වයි.
- අල්පප්‍රාණාක්ෂර, මහාප්‍රාණාක්ෂර හා අඝෝෂාකාර, ඝෝෂාක්ෂර නිවැරදි ව උච්චාරණය කරයි.
- පාලි වර්ණ මාලාවේ ඒ ඒ ප්‍රභේදයට අයත් අක්ෂර සංඛ්‍යාත්මක ව ලියා දක්වයි.
- දුරවබෝධ දුෂ්කර වචන නිවැරදි ව ලියා දක්වයි. උච්චාරණය කරයි.
- පාලි ගද්‍ය පද්‍ය පාඨ නිවැරදි ව ලියා දක්වයි.

**ගුණාත්මක යෙදවුම්**

- කළු ලෑල්ල
- බාලාවතාරය - සඤ්ඤා කාණ්ඩය
- පාලි භාෂවතරණය - I, II පොත්
- 12 වන ශ්‍රේණියට නියමිත නිර්දිෂ්ට පාලි පාඨ ග්‍රන්ථ

**වැඩි දුර ගවේෂණය**

- පාලි ව්‍යාකරණ විවරණය, සිරිනිවාස හිමි, මයිලෑව.: සමයවර්ධන, කොළඹ, 1966.

## 02. ඒකකය - උක්තාඛ්‍යාත භාවිතය

**නිපුණතාව**

1.0 පාලි භාෂාවේ මූලික වියරණ හා භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

1.2 මූලික භාෂා ප්‍රයෝග උපයෝගි කර ගනිමින් වාක්‍ය නිර්මාණය හා රචනය හුරු කර ලියයි.

**කාලච්ඡේද 05 යි.**

**ඉගෙනුම් පල**

- වාක්‍යයක මූලික ලක්‍ෂණ හඳුන්වයි.
- කර්තෘ, කර්ම හා ආඛ්‍යාත යෝගය පිළිබඳ රීතිය නිදසුන් මඟින් පෙන්වයි.
- උක්තය හා ආඛ්‍යාතය නිසි ලෙස ගළපා ලියයි.
- වාක්‍ය විෂයයෙහි විශේෂණ හා විශේෂ්‍ය පද ලිංගයෙන් විභක්තියෙන් වචනයෙන් සමාන වන බව පැහැදිලි කරයි.
- වාක්‍යයක ඇති පූර්වක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අතීත කිතක හා තුමන්ත ක්‍රියා උපුටා දක්වයි.
- වාක්‍යයක උක්ත, කර්ම හා ආඛ්‍යාතය, පිළිවෙළින් ඇතුළත් වුව ද පාලි භාෂාවේ එම පද අවිශේෂයෙන් යොදා ඇති බව තේරුම් ගෙන ලියයි. පරිවර්තන කාර්යයේ යෙදෙයි.
- ක්‍රියා විශේෂණ පද දුතියා හෝ තතියා හෝ විභක්තියෙන් යොදා ලියයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය යටතේ දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- වාක්‍යයක කර්තෘ, ක්‍රියා, හෝ කර්තෘ, කර්ම, ක්‍රියා හෝ වශයෙන් මූලික කොටස් ඇති බව
- උක්තය හා ආඛ්‍යාතය පුරුෂයෙන් වචනයෙන් සමාන විය යුතු බව
- විශේෂණ පද විශේෂ්‍ය පදය ලියා ඇති ලිංගයෙන්, විභක්තියෙන් හා වචනයෙන් ලිවිය යුතු බව.
- පූර්වක්‍රියා හා තුමන්තක්‍රියා මඟින් වාක්‍ය දීර්ඝ කළ හැකි බව.
- වර්තමාන කිතක පද මිශ්‍ර ක්‍රියා වශයෙන් යෙදෙන බව.
- උක්තය, කර්මය, ආඛ්‍යාතය පිළිවෙළින් ලිවීම සාමාන්‍ය ක්‍රමය වුව ද පාලි සම්ප්‍රදාය අනුව එම පිළිවෙළ වෙනස් වන බව.
- ක්‍රියා විශේෂණ දුතියා හෝ තතියා හෝ විභක්තිවලින් යෙදෙන බව

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- ක්‍රියාපද 10 ක් හා පඨමා විභක්ත්‍යන්ත නාම පද 10 ක් පුවරුවේ ලියා වාක්‍ය නිර්මාණය කරවීමට සැලැස්වීම
- කර්ම පද එක් කරමින් උක්ත, කර්ම හා ආඛ්‍යාත වශයෙන් වාක්‍ය නිර්මාණය කරවීම
- නාමපදවලට නාම විශේෂණත් ක්‍රියාපදවලට ක්‍රියා විශේෂණත් යොදා වාක්‍ය අලංකාර කරවීම
- එම වාක්‍ය පූර්වක්‍රියා, මිශ්‍රක්‍රියා, අතීත කෘදන්ත, තුමන්ත ක්‍රියා යන මේවායින් සුදුසු පද යොදා දීර්ඝ කිරීම

- නිර්දිෂ්ට කෘතිවල එන වාක්‍ය උපුටා දක්වා ඒවායේ උක්තය, කර්මය හා ආඛ්‍යාතය යනාදිය හඳුනා ගැනීමට අවස්ථාව සලසා දීම
- පාලි භාෂාවතරණය 02 වන පොතේ එන වාක්‍ය හා පාඨ මාධ්‍ය භාෂාවෙන් පාලියටත්, පාලියෙන් මාධ්‍ය භාෂාවටත් පරිවර්තනය කරවීම
- නිර්දිෂ්ට ග්‍රන්ථවල එන සංකීර්ණ වාක්‍ය අන්වයට අනුව අර්ථ ගැන්වීම
- ක්‍රියා පදවලට ක්‍රියා විශේෂණ පද යොදා වාක්‍ය නිර්මාණය කිරීම

**තක්සේරුව හා ඇගයීම**

- කර්තෘ ක්‍රියා සහිත වාක්‍ය ලියා දක්වයි.
- උක්තාඛ්‍යාත සම්බන්ධය රැකෙන පරිදි වාක්‍ය ලියයි.
- විශේෂණ–විශේෂ්‍ය පද නිවැරදි ව යොදයි.
- වාක්‍යයක ඇති පූර්වක්‍රියා, මිශ්‍රක්‍රියා අතීත කෘදන්ත, තුමන්ත ක්‍රියා උපුටා දක්වයි.
- රීතිය නොබිඳ මාධ්‍ය භාෂාගත වාක්‍ය පාලියට නඟයි. පාලි වාක්‍ය මාධ්‍ය භාෂාවට නඟයි.
- ක්‍රියා විශේෂණ පද නිවැරදි ව භාවිත කරයි.
- පාලි භාෂාවතරණය 02 වන පොතේ නිර්දිෂ්ට අභ්‍යාස පාලියෙන් මාධ්‍ය භාෂාවටත් මාධ්‍ය භාෂාවෙන් පාලියටත් නඟයි.
- නිර්දිෂ්ට ග්‍රන්ථවල ඡේද මාධ්‍ය භාෂාවට නඟයි

**ගුණාත්මක යෙදවුම්**

- කළු , සුදු, කොළ පුවරුව
- පාලි භාෂාවතරණය 1, 2 පොත්
- නිර්දිෂ්ට පාලි පාඨ ග්‍රන්ථ

**වැඩි දුර ගවේෂණය**

- පාලි භාෂාව 5 මූලික පිරිවෙන, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, සමයවර්ධන, 2013.

## 03. ඒකකය - කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය

**නිපුණතාව**

1.0 පාලි භාෂාවේ මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

1.2 මූලික භාෂා ප්‍රයෝග උපයෝගි කර ගනිමින් වාක්‍ය නිර්මාණය හා රචනය හුරු කර ලියයි.

**කාලච්ඡේද 05 යි.**

**ඉගෙනුම් පල**

- කර්තෘකාරක වාක්‍යයක ලක්‍ෂණ පැහැදිලි කරයි.
- උක්ත කර්තෘට අනුව ආඛ්‍යාතය ලියයි.
- කර්තෘකාරක වාක්‍ය මාධ්‍ය භාෂාවට හරවා ලියයි.
- කර්මකාරක වාක්‍යයක ලක්‍ෂණ පැහැදිලි කරයි.
- වාක්‍ය කර්මකාරකයෙන් ලියන විට භාවිත වන 'ය' ප්‍රත්‍යයයෝගය පැහැදිලි කරයි.
- කිතක පද ආඛ්‍යාත වශයෙන් යෙදෙන අයුරු පෙන්වා දෙයි.
- කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයට හරවා ලියයි.
- කර්මකාරක වාක්‍ය කර්තෘකාරකයට හරවා ලියයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය යටතේ දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- කර්තෘකාරක වාක්‍යයක කර්තෘ, කර්ම, ක්‍රියා වශයෙන් මූලික කොටස් තුනක් ඇති බව
- උක්ත කර්තෘ අනුව ආඛ්‍යාතය යෙදිය යුතු බව
- සකර්මක වාක්‍ය කර්මකාරකයට හරවා ලිවිය හැකි බව
- කර්මකාරක ආඛ්‍යාතය පරස්සපදයෙන් හා අත්තනොපදයෙන් යෙදිය හැකි බව
- කර්තෘකාරක වාක්‍යයක් කර්මකරකයට හැරවීමේ දී කර්ම පදය උක්ත කොට ඊට සරිලන පරිදි ආඛ්‍යාතය යෙදිය යුතු බව
- කර්මකාරක ආඛ්‍යාතය යෙදීමේ දී කර්මකාරක 'ය' ප්‍රත්‍යයය යොදා ගන්නා බව
- කර්මකාරක වාක්‍යයක කර්තෘ අනුක්ත ව තතියා විභක්තියෙන් ලිවිය යුතු බව
- අතීත කිතක පද කර්මකාරක ආඛ්‍යාත ලෙස ද යෙදෙන බව
- අතීත කිතක ආඛ්‍යාත සේ යෙදෙන විට පුරුෂ භේදයක් නොමැති බව හා ලිංග හා වචන භේදයක් පමණක් ඇති බව
- සකර්මක කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයට හරවා ලිවිය හැකි බව
- කර්මකාරක වාක්‍ය කර්තෘකාරකයට හරවා ලිවිය හැකි බව

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමය**

- සකර්මක කර්තෘකාරක වාක්‍යයක් පුවරුවේ ලියා එහි කර්තෘ, කර්ම හා ක්‍රියා පෙන්වා දීම
- වාක්‍යයක කර්තෘ උක්ත වී පඨමාවෙන් සිටින බවත් කර්මය අනුක්ත වී දුතියාවෙන් සිටින බවත් ආඛ්‍යාතය කර්තෘකාරක වන බවත් පෙන්වා දීම
- වාක්‍යයක් කර්මකාරකයට හැරවීමේ දී උක්ත කර්තෘ අනුක්ත වන බවත් කර්මය උක්ත වන බවත් පෙන්වා දීම
- උක්ත කර්මයට අනුව ආඛ්‍යාතය යෙදිය යුතු බව පෙන්වා දීම
- කර්මකාරක ආඛ්‍යාත යෙදීමේ දී ප්‍රත්‍යයයට මුලින් ඇති අක්ෂරය ද්විත්ව වන බව පෙන්වා දීම
- කර්මකාරක ආඛ්‍යාත යෙදීමේ දී 'ය' ප්‍රත්‍යය භාවිත වන ආකාරය පෙන්වා දීම
- වාක්‍ය කිහිපයක් කර්තෘකාරකයෙන් කර්මකාරකයටත් කර්මකාරකයෙන් කර්තෘකාරකයටත් හැරවීම
- පාලි භාෂාවතරණය 1 පොතේ 26 වන අභ්‍යාස පරිවර්තනය කොට කර්මකාරක වාක්‍ය කර්තෘකාරකයට හැරවීම හා කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයට හැරවීම
- අතීත කිතක ආඛ්‍යාත වශයෙන් යෙදෙන බව පෙන්වා දීම
- නිර්දිෂ්ට ග්‍රන්ථවල අතීත කිතක ආඛ්‍යාත වශයෙන් යෙදුණු වාක්‍ය කිහිපයක් උපුටා දැක්වීම

**තක්සේරුව හා ඇගයීම**

- සකර්මක කර්තෘකාරක වාක්‍ය ලියා දක්වයි.
- උක්ත ආඛ්‍යාත සම්බන්ධය පැහැදිලි කරයි.
- කර්මකාරක වාක්‍යයන්හි ලක්‍ෂණ පෙන්වා දෙයි.
- වාක්‍යයන්හි උක්ත කර්තෘ අනුක්ත කර්ම, අනුක්ත කර්තෘ උක්ත කර්ම පද පෙන්වා දෙයි.
- කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයට හරවා ලියයි.
- කර්මකාරක වාක්‍ය කර්තෘකාරකයට හරවා ලියයි.
- අතීත කිතක පද කර්මකාරක ආඛ්‍යාත ලෙස යොදන ආකාරය පෙන්වා දෙයි.
- අතීත කිතක ආඛ්‍යාත ලෙස යෙදී ඇති වාක්‍ය උපුටා දක්වයි.

**ගුණාත්මක යෙදවුම්**

- කළු , සුදු, කොළ පුවරුව
- පාලි භාෂාවතරණය 01, 02 පොත්

**වැඩි දුර ගවේෂණය**

- නිර්දිෂ්ට පාලි පාඨ ග්‍රන්ථ

# 04. ඒකකය - කාරක හා උපපද විභක්ති

**නිපුණතාව**

1.0 පාලි භාෂාවේ මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

1.2 මූලික භාෂා ප්‍රයෝග උපයෝගි කර ගනිමින් වාක්‍ය නිර්මාණය හා රචනය හුරු කර ලියයි.

**කාලච්ඡේද 07 යි.**

**ඉගෙනුම් පල**

- කාරක යන්න හඳුන්වයි.
- ෂට් කාරකය නම් කරයි.
- ෂට් කාරක යෙදෙන විභක්ති නම් කරයි.
- වාක්‍යයක ඇති පදවල කාරකය හා විභක්තිය නම් කරයි.
- විභක්ති නම් කොට ඒ ඒ විභක්තීන්හි විභක්ත්‍යර්ථ පැහැදිලි කරයි.
- ඒ ඒ විභක්තීන්හි ප්‍රයෝග උදාහරණ දක්වමින් පෙන්වා දෙයි.
- උපපද විභක්ති හඳුනාගෙන නිදසුන් උද්ධෘත කර පෙන්වා දෙයි.
- උපපද අනුව විභක්තිය හා එහි අර්ථය ප්‍රකාශ කරයි.
- සුවිශේෂ භාෂා ප්‍රයෝග හඳුනාගෙන ඒවායේ අර්ථ විමර්ශනය කරයි.
- නිර්දිෂ්ට ග්‍රන්ථයන්හි එන කාරක පද, විභක්ත්‍යන්ත පද හා උපපද විභක්ති පද උපුටා දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය යටතේ දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- පාලි භාෂාවේ විභක්ති 9ක් ඇති බව
- ඒ ඒ විභක්තියෙන් ඒ ඒ අර්ථ පැවසෙන බව
- ඒ ඒ විභක්තියට අදාළ විභක්ති ප්‍රයෝග ඇති බව
- විභක්ති 9 අතරින් විභක්ති 6ක් පමණක් ක්‍රියා නිෂ්පත්තියට හේතු වන බව
- නිපාත, උපසර්ග නැතහොත් ධාතු යෙදීමෙන් නියමිත සාමාන්‍ය විභක්ති ක්‍රමය ඉක්මවා සුවිශේෂ විභක්ති ගන්නා බව
- ඇතැම් විභක්ති අර්ථ ගැනීම සඳහා වෙනත් විභක්ති යොදා ගන්නා බව.

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමය**

- පාලි භාෂාවේ විභක්ති 9ක් ඇති බව පෙන්වා දීම
- ඒ ඒ විභක්තීන්හි අර්ථ පැහැදිලි කොට නිදසුන් ලබා දීම
- නිර්දිෂ්ට කෘතීන්හි එන පදවල විභක්තිය හා අර්ථය පැහැදිලි කර දීම
- පඨමා, ආලපන, ඡට්ඨී විභක්ති හැර සෙසු විභක්ති කාරක වන බව පෙන්වා දීම

- කාරකාර්ථ නංවන පාලි වාක්‍ය නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට කෘතිවලින් උද්ධෘත කිරීමට සිසුන් යොමු කිරීම
- උපපද විභක්ති හඳුන්වා දී එබඳු භාෂා ප්‍රයෝග සහිත වාක්‍ය හඳුනාගෙන ඒවා උද්ධෘත කොට මාධ්‍ය භාෂාවට නැඟීම
- ඒ ඒ විභක්ති ප්‍රයෝග හඳුන්වා දී නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට කෘතිවලින් විභක්ති ප්‍රයෝගවලට උදාහරණ දැක්වීම
- විභක්ත්‍යර්ථ, කාරකාර්ථ හා උපපද විභක්ති සහිත පද නිර්දිෂ්ට හා අනිදිර්ෂ්ට කෘතිවලින් සොයා ලිවීමට සිසුන් යොමු කිරීම
- විභක්තියක් වෙනුවට වෙනත් විභක්තියක පදයක් යොදා වාක්‍ය ලියන අවස්ථා නිර්දිෂ්ට හා අනිදිර්ෂ්ට කෘතිවලින් උපුටා දැක්වීම හා ඒවායේ අර්ථය ලිවීම
- ව්‍යාකරණ ග්‍රන්ථ උපයෝගි කර ගනිමින් කාරක විභක්ති හා උපපද විභක්ති පිළිබඳ වගුවක් පිළියෙල කරවීම
- සුවිශේෂ භාෂා ප්‍රයෝග සඳහා නිර්දිෂ්ට ග්‍රන්ථවලින් නිදසුන් සැපයීම

**තක්සේරුව හා ඇගයීම**

- විභක්ති 9 නම් කර අර්ථ දක්වයි.
- කාරකාර්ථ ලබන හා කාරකාර්ථ නොලබන විභක්ති වෙන් කර දක්වයි.
- කාරක හය නම් කර උදාහරණ සපයයි.
- උපපද විභක්ති භාවිතය හඳුනාගෙන එම භාෂා ප්‍රයෝග සහිත වාක්‍ය උද්ධෘත කර ලියයි.
- ඒ ඒ විභක්තිය යෙදෙන විශේෂ විභක්ති ප්‍රයෝග හඳුන්වා උදාහරණ දෙයි.
- විභක්ති අර්ථයක් ප්‍රකාශ කිරීමට වෙනත් විභක්තියක පදයක් යෙදෙන අවස්ථා හඳුනාගෙන පෙන්වා දෙයි.
- කිසියම් පදයක් කවර විභක්තියකට අයත් ද යන බව ලියා දක්වයි.
- කිසියම් වාක්‍යයක කාරකය හා විභක්තිය නම් කරයි.
- උපපද විභක්තීන්හි අර්ථ දක්වයි.

**ගුණාත්මක යෙදවුම්**

- පාලි ව්‍යාකරණ විවරණය, මයිලෑවේ ශ්‍රී නිවාස හිමි
- 12 ශ්‍රේණියට නියමිත නිර්දිෂ්ට, අනිර්දිෂ්ට ගද්‍ය පද්‍ය කොටස්
- පාලි භාෂාව 5 - මූලික පිරිවෙන

**වැඩි දුර ගවේෂණය**

- බාලාවතාරය, ආරියදාස, සෙනෙවිරත්න.: සමයවර්ධන, කොළඹ, 1994.

## 05. ඒකකය - ත්‍රෛකාලික ක්‍රියා

**නිපුණතාව**

1.0 පාලි භාෂාවේ මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

1.2 මූලික භාෂා ප්‍රයෝග උපයෝගි කර ගනිමින් වාක්‍ය නිර්මාණය හා රචනය හුරු කර ලියයි.

**කාලච්ඡේද 06 යි.**

**ඉගෙනුම් පල**

- ආඛ්‍යාත පදයක මූලික ලක්ෂණ හඳුන්වයි.
- කාලත්‍රයය හඳුන්වයි.
- කාලත්‍රයට අයත් ප්‍රධාන ආඛ්‍යාත විභක්ති තුන නම් කරයි.
- වත්තමානා ප්‍රත්‍යය මාලාව පිළිවෙළින් ලියයි.
- වතතමානා ආඛ්‍යාත ප්‍රත්‍යයමාලාව යොදා ධාතුවක් වරනඟා දක්වයි.
- හවිස්සන්ති ප්‍රත්‍යයමාලාව පිළිවෙළින් ලියයි.
- වත්තමානා හා හවිස්සන්ති ආඛ්‍යාත ප්‍රත්‍යය සසඳමින් වාක්‍ය නිර්මාණය කරයි.
- වර්තමාන කාල වාක්‍ය අනාගත කාලයටත් අනාගත කාල වාක්‍ය වර්තමාන කාලයටත් හරවා ලියා මාධ්‍ය භාෂාවට නඟයි.
- අජ්ජතනී ප්‍රත්‍යයමාලාව පිළිවෙළින් ලියයි.
- පාලි ධාතු කිහිපයක් අජ්ජතනී ප්‍රත්‍යයමාලාව යොදා වරනඟා දක්වයි.
- අජ්ජතනී විභක්තියේ රූප බහුලත්වය ප්‍රකට වන පරිදි වගුවක් පිළියෙළ කරයි.
- චුරාදි ගණයේ ධාතු අජ්ජතනී ආඛ්‍යාතයේ වරනැඟෙන අයුරු පැහැදිලි කරයි.
- දෙනු ලබන ආඛ්‍යාත පදයක ආඛ්‍යාත විභක්තිය, පුරුෂය හා වචනය නම් කරයි.
- නිර්දිෂ්ට කෘතිවල ආඛ්‍යාත පද උපුටා දක්වා, කාලත්‍රයයට අනුව වගුගත කර දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය යටතේ දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ආඛ්‍යාත පදයක මූලික ලක්ෂණ කිහිපයක් ඇති බව
- වත්තමානා, හවිස්සන්ති, අජ්ජතනී වශයෙන් කාලත්‍රයයට අයත් ප්‍රධාන ආඛ්‍යාත තුනක් ඇති බව.
- සියලු ම ආඛ්‍යාත කර්තෘකාරකයේ හා කර්මකාරකයේ පරස්සපද, අත්තනෝපද දෙකෙහි වරනැඟෙන බව
- ඒ ඒ ආඛ්‍යාතයට අදාළ වූ ප්‍රත්‍යයමාලාවක් ඇති බව
- එක් එක් වාක්‍යයේ ආඛ්‍යාතය වෙනස් කොට කාලත්‍රයයට හැරවිය හැකි බව

- අජ්ජතනී ආඛ්‍යාත විභක්තිය රූප බහුලත්වයෙන් යුක්ත බව
- අජ්ජතනී ආඛ්‍යාත විභක්තිය චුරාදි ගණික ධාතුවල දී වෙනස් ආකාරයකට වරනැගෙන බව
- දෙනු ලබන ආඛ්‍යාත පදයක ආඛ්‍යාත විභක්තිය පුරුෂය හා වචනය නම් කළ හැකි බව
- ඡේදයක ඇති ආඛ්‍යාත පද උපුටා වගුගත කොට දැක්විය යුතු බව
- ආඛ්‍යාත පදය නිසි ලෙස යොදමින් වාක්‍ය නිර්මාණය කළ යුතු බව හා එකී වාක්‍ය මාධ්‍ය භාෂාවට නැගිය යුතු බව

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමය**

- බාලාවතාරයේ එන 'යන්තිකාලං තිපුරිසං' යනාදි ගාථාවට අනුව ආඛ්‍යාත පදයක මූලික ලක්ෂණ පැහැදිලි කිරීම
- කාලත්‍රයය පැහැදිලි කොට කාලත්‍රයයට අයත් ප්‍රධාන ආඛ්‍යාත විභක්ති තුන පෙන්වා දීම
- වත්තමානා ආඛ්‍යාත ප්‍රත්‍යයමාලාව වාචෝද්ගත කරවා ධාතු කිහිපයක් වරනඟා දැක්වීම
- ධාතු කිහිපයක් දී 'වත්තමානා' ආඛ්‍යාත පද සාදවා වගුගත කිරීමට සිසුන් යොමු කිරීම
- පාලි භාෂාවතරණය 1 පොතේ 3 - 6 පාඩම් අභ්‍යාස අධ්‍යයනය කිරීමට ඉඩ සලසා දීම
- භවිස්සන්ති ප්‍රත්‍යයමාලාව 'වත්තමාන', ආඛ්‍යාත ප්‍රත්‍යය මාලාව හා සසඳා පෙන්වීම
- භවිස්සන්ති ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යයමාලාව වාචෝද්ගත කරවා ධාතු කිහිපයක් වරනඟා දැක්වීම
- පාලි භාෂාවතරණය 1 පොතේ 9, 10 පාඩම් අභ්‍යාස අධ්‍යයනය කිරීමට සිසුන් යොමු කිරීම
- අජ්ජතනී ආඛ්‍යාත ප්‍රත්‍යයමාලාව වාචෝද්ගත කරවා ධාතු කිහිපයක් වරනඟා වගුගත කොට දැක්වීම
- අජ්ජතනී ආඛ්‍යාතයේ රූප බහුලත්වය පෙන්වා දී චුරාදි ගණික ධාතු අජ්ජතනී ආඛ්‍යාතයේ වරනැගෙන අයුරු පෙන්වා දීම
- පාලි භාෂාවතරණය 1 පොතේ 7, 8 අභ්‍යාස අධ්‍යයනය කිරීමට සිසුන් යොමු කිරීම
- නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට ග්‍රන්ථවල එන ආඛ්‍යාත පද වගුගත කොට දැක්වීමට සිසුන් යොමු කිරීම
- ආඛ්‍යාත පදවල විභක්තිය, පුරුෂය හා වචනය පෙන්වා දීම

**තක්සේරුව හා ඇගයීම**

- ආඛ්‍යාත පදයක මූලික ලක්ෂණ පැහැදිලි කරයි.
- කාලත්‍රය නම් කොට ඒ ඒ කාලයට අදාළ ආඛ්‍යාත විභක්තිය ලියයි.
- දෙනු ලබන ධාතුවක් වත්තමානා, භවිස්සන්ති, අජ්ජතනි ආඛ්‍යාතයන්හි වරනඟා දක්වයි.
- වත්තමානා භවිස්සන්ති, අජ්ජතනී ආඛ්‍යාත විභක්තිවලට අයත් ප්‍රත්‍යයමාලා පිළිවෙළින් ලියා දක්වයි.
- දෙනු ලබන වාක්‍යයක් කාලත්‍රයයට හරවා ලියයි.
- කාලත්‍රයයට අයත් පාලි වාක්‍ය මාධ්‍ය භාෂාවටත් මාධ්‍ය භාෂාවෙන් පාලි භාෂාවටත් නිවැරදි ව පරිවර්තනය කරයි.
- පාලිභාෂාවතරණය 1 පොතේ 3 - 10 අභ්‍යාස හදාරයි.
- නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට ග්‍රන්ථවල එන ආඛ්‍යාත පද උපුටා කාලත්‍රයයට අනුව වගුගත කොට දක්වයි.
- ආඛ්‍යාත පදයක ආඛ්‍යාත විභක්තිය, පුරුෂය හා වචනය ලියා දක්වයි.
- ත්‍රෛකාලික ආඛ්‍යාත පද යොදා ගනිමින් සරල වාක්‍ය නිර්මාණය කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- කළු, සුදු, කොළ පුවරුව
- පාලි භාෂාවතරණය 1 පොත
- නිර්දිෂ්ට හා අනිදිර්ෂ්ට පාලි පාඨ ග්‍රන්ථ

**වැඩි දුර ගවේෂණය**

- පාලි ව්‍යාකරණ විවරණය, සිරිනිවාස හිමි, මයිලෑව.: සමයවර්ධන, කොළඹ, 1966.

## 06. ඒකකය - සන්ධි

**නිපුණතාව**

1.0 පාලි භාෂාවේ මූලික වියරණ හා භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

1.3 මූලික ව්‍යාකරණාංග හඳුනාගෙන පද සාධනය පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛන කාර්යයේ යෙදෙයි.

**කාලච්ඡේද 06යි.**

**ඉගෙනුම් පල**

- සන්ධි යනු කුමක් දැයි හඳුන්වයි.
- සන්ධියෙහි ප්‍රයෝජන ලියා දක්වයි.
- අභ්‍යන්තර සන්ධියේ හා බාහිර සන්ධියේ වෙනස පැහැදිලි කරයි.
- බාහිර සන්ධි ප්‍රභේද නම් කරයි.
- ඒ ඒ සන්ධි ප්‍රභේදය හඳුන්වා උදාහරණ සපයයි.
- සන්ධිපද විසන්ධි කර දක්වයි.
- විසන්ධි පද රීතියට අනුව සන්ධි කර දක්වයි.
- දෙනු ලබන සන්ධි පදයක් කවර සන්ධි ප්‍රභේදයකට අයත් දැයි ලියා දක්වයි.
- නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට කෘතිවල සන්ධිපද උපුටා දක්වා වගුගත කරයි.
- සන්ධි විධි නම් කර නිදසුන් සහිත ව පැහැදිලි කරයි
- නිර්දිෂ්ට කෘතිවල සන්ධි පද විසන්ධි කොට සන්ධි රීති ඇසුරෙන් සන්ධි කර දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය යටතේ දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- සන්ධි යනු කුමක් දැයි හැඳින්විය යුතු බව
- සන්ධිවල ප්‍රයෝජන ඇති බව
- අභ්‍යන්තර හා බාහිර වශයෙන් සන්ධි ප්‍රභේද 2ක් ඇති බව හා අභ්‍යන්තර සන්ධිය නිත්‍ය බව
- බාහිර සන්ධිය ප්‍රභේද සහිත බව
- ඒ ඒ සන්ධියට ආවේණික ලක්ෂණ ඇති බව
- නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට කෘතිවල ඇති සන්ධි පද හඳුනාගත යුතු බව
- එකී සන්ධි පද කවර සන්ධි ප්‍රභේදයකට අයත් දැයි නම් කළ යුතු බව හා විසන්ධි කොට රීතියට අනුකූලව සන්ධි කළ යුතු බව
- නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට කෘතිවල එන සන්ධි පද උපුටා වගුගත කොට දැක්විය යුතු බව
- සන්ධි පද භාවිත කරමින් ලේඛන කාර්යයෙහි යෙදිය යුතු බව

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමය**

- සන්ධිපද සහිත නිර්දිෂ්ට ග්‍රන්ථාගත ඡේදයක් උපුටා පුවරුව මත ලිවීම
- එහි ඇති සන්ධි පද සලකුණු කිරීම
- එම සන්ධිපද විසන්ධි කොට දැක්වීම
- පූර්ව වර්ණයේ හා පර වර්ණයේ පිහිටීම අනුව ඒ ඒ සන්ධි පද අයත් සන්ධි ප්‍රභේදය නම් කිරීම
- තනි පද සන්ධි වී ඇති ආකාරය පෙන්වා දී එහි නිත්‍ය බව පැහැදිලි කිරීම
- ඉහත නිදසුන් යොදා ගනිමින් සන්ධි හැඳින්වීමට සිසුන්ගෙන් අදහස් ගැනීම
- සන්ධියේ ප්‍රයෝජන මොනවා දැයි සිසුන්ගෙන් ප්‍රශ්න කොට පිළිතුරු ලබා ගැනීම
- සන්ධි ප්‍රභේද පැහැදිලි කිරීම හා ඒ ඒ සන්ධියේ ප්‍රධාන ලක්ෂණ පෙන්වා දීම
- සන්ධි විධි යොදා ගනිමින් විසන්ධි පද සන්ධි කරගන්නා අයුරු පෙන්වා දීම
- නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට කෘතිවල සන්ධිපද උපුටා දැක්වීමට සිසුන් යොමු කිරීම
- උපුටාගත් සන්ධි පද විසන්ධි කිරීමටත් සන්ධි ප්‍රභේදය නම් කිරීමටත් සිසුන් යොමු කිරීම
- පාලි භාෂාවතරණය 2 වන පොතේ සන්ධි පාඩම් සහිත අභ්‍යාස පැවරුමක් ලෙස කරවීම

**තක්සේරුව හා ඇගයීම**

- සන්ධි හඳුන්වා දී ප්‍රයෝජන ලියා දක්වයි.
- සන්ධි ප්‍රභේද නම් කර නිදසුන් සපයයි.
- අභ්‍යන්තර හා බාහිර සන්ධියේ ලක්ෂණ පෙන්වා දෙයි.
- සන්ධි රීති අනුව කරමින් විසන්ධි පද සන්ධි කරයි.
- සන්ධි පද විසන්ධි කොට සන්ධි ප්‍රභේදය දක්වයි.
- නිර්දිෂ්ට කෘතිවල එන සන්ධි පද උපුටා දක්වා විසන්ධි කොට සන්ධි ප්‍රභේදය නම් කර වගුගත කර දක්වයි.
- පාලි භාෂාවතරණයේ 2 වන පොතේ අදාළ අභ්‍යාස කරයි.
- අභ්‍යන්තර සන්ධිය භාවිත වන ආකාරය පෙන්වා දෙයි.

**ගුණාත්මක යෙදවුම්**

- කළු, සුදු, කොළ පුවරුව
- පාලි භාෂාවතරණය 2, 3 පොත්
- පාලි භාෂාව 5, මූලික පිරිවෙන
- නියමිත නිර්දිෂ්ට හා අනිදිර්ෂ්ට පාලි පාඨ ග්‍රන්ථ

**වැඩි දුර ගවේෂණය**

- පාලි ව්‍යාකරණ විවරණය, සිරිනිවාස හිමි, මයිලෑව.: සමයවර්ධන, කොළඹ, 1966.

# 07. ඒකකය - නාම වරනැගීම

**නිපුණතාව**

1.0 පාලි භාෂාවේ මූලික වියරණ හා භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

1.3 මූලික ව්‍යාකරණාංග හඳුනාගෙන පද සාධනය පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛන කාර්යයේ යෙදෙයි.

**කාලච්ඡේද 06යි.**

**ඉගෙනුම් පල**

- නාම හා නාම පද හඳුන්වයි
- නාම පදයක් ලිංග, විභක්ති හා වචන යන මේවායින් යුක්ත බව ප්‍රකාශ කරයි.
- විභක්ති හා ඒවායේ ප්‍රත්‍යය මාලාව වගුගත කර දක්වයි.
- නාම ලිංගත්‍රයයට අයත් වන හා ස්වරාන්ත වන බව පෙන්වා දෙයි.
- අකාරාන්ත නාමයක් වරනගා අර්ථ ගන්වයි.
- ලිංගත්‍රයයට අයත් අ, ආ, ඉ, ඊ, උ, ඌ කාරාන්ත නාම භාවිතය විමර්ශනය කරයි.
- පුල්ලිංග හා නපුංසක ලිංග නාම වරනැගීමේ සමවිෂමතා පෙන්වා දෙයි.
- ස්ත්‍රීලිංග නාම වරනැගීමේ සුවිශේෂතා හඳුනාගෙන වාක්‍ය ලිවීමේ දී ඒවා නිවැරදි ව උපයෝගි කර ගනියි.
- නාම පදයක ලිංගය, විභක්තිය හා වචනය ලියා දක්වයි.
- මනෝගණික ශබ්දවල සුවිශේෂතා හඳුනා ගෙන ලියයි.
- නිර්දිෂ්ට ග්‍රන්ථවල එන නාමපද නාම, ලිංග, විභක්ති හා වචන වශයෙන් වගුගත කර දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය යටතේ දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- නාම හා නාමපද හැඳින්විය යුතු බව
- නාමපදය නාම, ලිංග, විභක්ති හා වචන, යන ප්‍රභේදවලින් යුක්ත බව
- නාම විභක්ති 9ක් ඇති බව
- නාම විභක්ති 9ට අදාළ විභක්ති ප්‍රත්‍යය මාලාවක් ඇති බව
- නාමයකට විභක්ති ප්‍රත්‍යයක් එකතු කොට (අභ්‍යන්තර සන්ධිය) නාම පදයක් සාදා ගත යුතු බව
- නාම ලිංගත්‍රයයට අයත් බව
- පාලියේ සියලු ම නාම ස්වරාන්ත වන බව
- ලිංගත්‍රයයට අයත් අ, ආ, ඉ, ඊ, උ, ඌ කාරාන්ත නාම සියලු විභක්තිවල වරනැගිය යුතු බව

- නපුංසකලිංග ශබ්ද හා පුල්ලිංග ශබ්ද ඇතැම් විභක්තිවල සමාන බව
- ස්ත්‍රීලිංග ශබ්ද වරනැඟීමේ ස්වරූප හඳුනා ගත යුතු බව
- මනෝගණික ශබ්දවල විශේෂතා හඳුනාගෙන වරනගා දක්විය යුතු බව
- නිර්දිෂ්ට ග්‍රන්ථවල එන නාමපද නාම, ලිංග, විභක්ති හා වචන වශයෙන් වගුගත කොට දක්විය යුතු බව

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමය**

- ලිංගත්‍රයයට අයත් නාමපද කිහිපයක් පුවරුවේ ලියා නාමය හා විභක්ති ප්‍රත්‍යය වෙන් කර දැක්වීම
- නාමය ස්වරාන්ත වන බව පෙන්වා දෙමින් ඒ ඒ විභක්තියට අයත් විභක්ති ප්‍රත්‍යය ලියා දැක්වීම
- නාමය, වරනැඟෙන ස්වරූපය අනුව එය ලිංගත්‍රයයට අයත් වන බව පෙන්වා දීම
- නාමපද කිහිපයක විභක්ති ප්‍රත්‍යය වෙන් කොට දක්වීමට සිසුන්ට අවස්ථාව ලබා දී එකී නාම කිනම් ලිංගයකට අයත් දැයි ලියා දැක්වීමට යොමු කිරීම
- අකාරාන්ත පුල්ලිංග නාමයක් සියලු විභක්තිවල වරනඟා ලියා දැක්වීම
- සමාන ශබ්ද  කිහිපයක් වරනඟා අර්ථ ගැන්වීම
- පුල්ලිංග හා නපුංසක ලිංග ශබ්දවල සම - විෂමතා පෙන්වා දීම
- ස්ත්‍රීලිංග ශබ්ද කිහිපයක් ලබා දී ඒවා පුල්ලිංග ශබ්දවලින් වෙනස් වන ආකාරය වටහා ගැනීමට ක්‍රම සලසා දීම
- ලිංගත්‍රයයට අයත්  අ, ආ, ඉ, ඊ, උ, ඌ කාරාන්ත ශබ්ද වගුගත කොට දක්වා සම විෂමතා තේරුම් ගැනීමට අවස්ථාව සලසා දීම
- පුල්ලිංග ශබ්ද ස්ත්‍රීලිංගයට හරවා ලියවීම
- නාමපදවල ලිංග, විභක්ති හා වචන වෙන් කර දැක්වීම
- මනෝගණික ශබ්දවල සුවිශේෂතා  පෙන්වා දීම
- නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට පාලි ග්‍රන්ථයන්හිවල එන පදවල විභක්තිය හා විභක්ත්‍යර්ථ ලියවීම
- පාලි පාඨ පරිවර්තනය කරවීම

**තක්සේරුව හා ඇගයීම**

- නාමය හා නාම පදය අතර වෙනස පැහැදිලි කරයි.
- නාම පදයක ලිංගය, විභක්තිය හා වචනය ලියා දක්වයි.
- විභක්ති හා විභක්ති ප්‍රත්‍යය ලියා දක්වයි.
- විභක්ත්‍යර්ථ පෙන්වා දෙයි.
- නාමයක ලිංගය හා අන්ත ස්වරය තේරුම් ගෙන වරනැඟෙන ආකාරය ලියා දක්වයි.
- පුල්ලිංග හා නපුංසක ලිංග ශබ්දවල සම - විෂමතා පෙන්වා දෙයි.
- ස්ත්‍රීලිංග ශබ්ද විභක්තිවල වරනඟා දක්වයි.
- ලිංගත්‍රයයට අයත් අ, ආ, ඉ, ඊ, උ, ඌ කාරාන්ත ශබ්ද වගුගත කොට වරනඟා දක්වයි.
- මනෝගණික ශබ්දවල වෙනස පැහැදිලි කරමින් විභක්තිවල වරනඟා අර්ථ ගන්වයි.
- පුල්ලිංග ශබ්ද ස්ත්‍රීලිංගයට හරවා වරනඟා දක්වයි.
- නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට ග්‍රන්ථගත නාමපදයන්හි ලිංග, විභක්ති හා වචන පෙන්වා දෙයි.
- ලේඛන කාර්යයේ දී නාම වරනැඟීම නිවැරදි ව භාවිත කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- කළු, සුදු, කොළ පුවරුව
- පාලි නාම වරනැඟිල්ල
- පාලි භාෂාවතරණය 1, 2 පොත්
- පාලි භාෂාව 5, මූලික පිරිවෙන
- නිර්දිෂ්ට පාලි පාඨ ග්‍රන්ථ

**වැඩි දුර ගවේෂණය**

- බාලාවතාරය, ආරියදාස, සෙනෙවිරත්න.: සමයවර්ධන, කොළඹ, 1994.

# 08. ඒකකය - පූර්වක්‍රියා, තුමන්ත ක්‍රියා, උපසර්ග හා නිපාත

**නිපුණතාව**

1.0 පාලි භාෂාවේ මූලික වියරණ හා භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

1.3 මූලික ව්‍යාකරණාංග හඳුනාගෙන පද සාධනය පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛන කාර්යයේ යෙදෙයි.

**කාලච්ඡේද 06 යි.**

**ඉගෙනුම් පල**

- පූර්වක්‍රියා හඳුන්වයි.
- පූර්වක්‍රියා ප්‍රත්‍යය හඳුනාගෙන එහි භාවිතය සඳහා නිදසුන් සපයයි.
- නිවැරදි ලේඛනය සඳහා පූර්වක්‍රියා උපයෝගි කර ගනියි.
- තුමන්ත ක්‍රියා නිවැරදි ලේඛනය සඳහා යොදා ගනියි.
- උපසර්ග හඳුන්වයි.
- උපසර්ග 20 නම් කරයි.
- උපසර්ගවල කාර්යභාරය හා උපයෝගිතාව පැහැදිලි කරයි.
- උපසර්ග කිහිපයක් සහිත පාලි වචන ලියා දක්වා විග්‍රහ කරයි.
- සන්ධි වීම නිසා උපසර්ගය අප්‍රකට වූ අවස්ථා පෙන්වා දෙයි.
- නිපාත හඳුන්වයි.
- නිපාතවල අර්ථ හැඳිනගෙන ඒවා යොදමින් වාක්‍ය රචනයේ යෙදෙයි.
- පාලි ඡේදවල ඇති පූර්වක්‍රියා, තුමන්ත ක්‍රියා, උපසර්ග හා නිපාත වගුගත කොට දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය යටතේ දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- පූර්වක්‍රියා හැඳින්විය යුතු බව
- පූර්වක්‍රියා ප්‍රත්‍යය 3ක් ඇති බව
- උපසර්ගයක් මුලින් ඇති විට 'ය' ප්‍රත්‍යයය ආදේශ වන බව
- නිවැරදි ලේඛනය සඳහා පූර්වක්‍රියා උපයෝගි කර ගත යුතු බව
- නිර්දිෂ්ට කෘතිවල ඇති පූර්වක්‍රියා උපුටා දැක්විය යුතු බව
- තුමන්ත ක්‍රියා හැඳින්විය යුතු බව
- නිර්දිෂ්ට කෘතිවල ඇති තුමන්ත ක්‍රියා හඳුනාගත යුතු බව
- උපසර්ග හඳුන්වා උපසර්ග 20 නම් කළ යුතු බව

- සන්ධි වීමේදි උපසර්ග අප්‍රකට ව පවතින අවස්ථා ඇති බව
- උපසර්ග යෙදුණු වචන උපුටා දක්විය යුතු බව
- නිපාත හැඳින්විය යුතු බව
- නිපාත භාවිත කරමින් වාක්‍ය නිර්මාණය කළ යුතු බව
- පාලි ඡේදවල ඇති පූර්වක්‍රියා, තුමන්ත ක්‍රියා, උපසර්ග හා නිපාත වගුගත කොට දක්විය යුතු බව

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමය**

- කෙටි වාක්‍ය පුවරුවේ ලියා වාක්‍ය දීර්ඝ කිරීම සඳහා පූර්වක්‍රියා වැදගත්වන බව පෙන්වා දීම
- පූර්වක්‍රියා පද උපුටා දක්වා පූර්වක්‍රියා ප්‍රත්‍යය භාවිතය පැහැදිලි කොට ඡේදයක පූර්වක්‍රියා උපුටා දක්වීමට සිසුන් යොමු කිරීම
- නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට ග්‍රන්ථවල එන පූර්වක්‍රියා පද ලේඛනයක් සකස් කරවීම
- දීර්ඝ වාක්‍ය ලිවීමට තුමන්ත ක්‍රියා උපයෝගි වන අන්දම නිර්දිෂ්ට හෝ අනිර්දිෂ්ට හෝ පාලි පාඨයක් මඟින් පෙන්වා දීම
- තුමන්ත ක්‍රියා විභක්ති, පුරුෂ ආදියේ වර නොනැඟෙන බව පෙන්වා දීම
- තුමන්ත ක්‍රියා යොදමින් වාක්‍ය නිර්මාණය කරවීම
- උපසර්ග හඳුන්වා දී උපයෝගිතාව හා කාර්යභාරය පැහැදිලි කිරීම
- උපසර්ග අප්‍රකට ව පෙනෙන අවස්ථා සෙවීමට සිසුන් යොමු කරවීම
- උපසර්ග දෙකක් හෝ වැඩි ගණනක් හෝ යෙදුණු පද එකතු කොට උපසර්ග වෙන් කොට දක්වීමට සිසුන් යොමු කිරීම
- නිපාත යන්නෙහි අරුත පැහැදිලි කොට, වාක්‍යයක යෙදුණු නිපාත පද උපුටා දැක්වීම
- නිපාත පද නිර්දිෂ්ට හා අනිදිර්ෂ්ට කෘතිවලින් උපුටා දක්වීමට සිසුන් යොමු කිරීම
- නිපාත පද යොදමින් වාක්‍ය නිර්මාණය කිරීම
- නිර්දිෂ්ට කෘතිවල එන පූර්වක්‍රියා, තුමන්ත ක්‍රියා, උපසර්ග හා නිපාත පද වගුවක් සැකසීමට සිසුන් යොමු කිරීම

**තක්සේරුව හා ඇගයීම**

- පූර්වක්‍රියා හඳුන්වා පූර්වක්‍රියා ප්‍රත්‍යය නම් කරයි.
- පූර්වක්‍රියා පද හඳුනාගෙන ලියයි, අර්ථ ගන්වයි.
- 'ත්වා' ප්‍රත්‍යය වෙනුවට 'ය' ප්‍රත්‍යය ආදේශය සිදුවන බවට නිදසුන් පෙන්වා දෙයි.
- පූර්වක්‍රියා පද යොදා ගනිමින් දීර්ඝ වාක්‍ය නිර්මාණය කරයි.
- තුමන්ත ක්‍රියා හඳුන්වයි.
- ඡේදයක ඇති තුමන්ත ක්‍රියා පද උපුටා දක්වා අර්ථ ගන්වයි.
- උපසර්ග හඳුන්වා ඒවායේ කාර්යභාරය පැහැදිලි කරයි.
- ඡේදයක ඇති උපසර්ග පද උපුටා දක්වයි.
- උපසර්ග එකකට වැඩියෙන් යෙදුණු අවස්ථා පෙන්වා දෙයි.
- උපසර්ග සහිත පද යොදා ගනිමින් වාක්‍ය නිර්මාණය කරයි.
- නිපාත හඳුන්වා, නිපාත වර්ග නම් කරයි.
- ඡේදයක ඇති නිපාත උපුටා දක්වා ඒවායේ අර්ථය ලියයි.
- නිපාත පද යොදා ගනිමින් වාක්‍යය නිර්මාණය කරයි.
- නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට ග්‍රන්ථවල එන පාලි පාඨයන්හි ඇති පූර්වක්‍රියා, තුමන්තක්‍රියා, උපසර්ග හා නිපාත පද උපුටා දක්වා වගුගත කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- කළු, සුදු, කොළ පුවරුව
- පාලි භාෂාවතරණය 2 පොත
- නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට කෘති

**වැඩි දුර ගවේෂණය**

- පාලි ව්‍යාකරණ විවරණය, සිරිනිවාස හිමි, මයිලෑව.: සමයවර්ධන, කොළඹ, 1966.
- පාලි භාෂාව 5 මූලික පිරිවෙන, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, සමයවර්ධන, 2013.

# 09. ඒකකය - සමාස

**නිපුණතාව**

1.0 පාලි භාෂාවේ මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

1.3 මූලික ව්‍යාකරණාංග හඳුනාගෙන පද සාධනය පිළිබඳ අවබෝධයෙන් යුතුව ලේඛන කාර්යයේ යෙදෙයි.

**කාලච්ඡේද 08 යි.**

**ඉගෙනුම් පල**

- සමාස හඳුන්වා, සමාස ප්‍රයෝජන නම් කරයි.
- සමාසවල පදසිද්ධි ක්‍රමය පැහැදිලි කොට සමාස ප්‍රභේද ලියා දක්වයි.
- සමාස පද විග්‍රහ කොට සමාසය නම් කරයි.
- ලේඛන කාර්යයේ දී සමාස පද නිවැරදි ව භාවිත කරයි.
- නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට කෘතිවල එන සමාස උද්ධෘත කර වගුගත කොට දක්වයි.
- සමාස පද යොදා ගනිමින් අර්ථවත් වාක්‍ය ලියයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය යටතේ දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- පදයන්ගේ කෙටි කිරීම සමාස නම් වන බව
- සමාස කිරීමේ ප්‍රයෝජන ඇති බව
- සමාස ප්‍රභේද 6ක් ඇති බව
- සමාස පද විග්‍රහ කොට සමාස ප්‍රභේදය නම් කළ යුතු බව
- නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට කෘතිවල එන සමාස පද උපුටා වගුගත කොට දැක්විය යුතු බව
- සමාස පද යොදා ගනිමින් අර්ථවත් වාක්‍ය නිර්මාණය කළ යුතු බව

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට කෘතිවල එන පාලි ඡේදයක් පුවරුවේ ලියා සමාස පද සලකුණු කිරීම
- එකී සමාස පද උපුටා දක්වා විග්‍රහ කොට පෙන්වීම
- සමාස කිරීමේ ප්‍රයෝජන පෙන්වා දීම
- සමාස පදවල විවිධත්වය මත සමාස ප්‍රභේද පැහැදිලි කොට සමාසය නම් කිරීම
- නිර්දිෂ්ට කෘතිවල එන සමාස පද උපුටා දක්වා, වගුගත කිරීමට සිසුන් යොමු කරවීම
- අසමස්ත පද සමාස කිරීම
- සමාස පද යොදා අර්ථවත් වාක්‍ය ලියවීම

**තක්සේරුව හා ඇගයීම**

- සමාස හඳුන්වා සමාස ප්‍රයෝජන ලියා දක්වයි.
- සමාස පද විග්‍රහ කොට දක්වයි.
- සමාස ප්‍රභේදය නම් කරයි.

- සමාස පද උපුටා දක්වා වගුගත කරයි.
- සමාස පද යොදා ගනිමින් අර්ථවත් වාක්‍ය ලියයි.
- සමාස පද සහිත වාක්‍ය මාධ්‍ය භාෂාවෙන් පාලි භාෂාවටත් පාලි භාෂාවෙන් මාධ්‍ය භාෂාවටත් පරිවර්තනය කර ලියයි.

**ගුණාත්මක යෙදවුම්**

- කළු, සුදු, කොළ පුවරුව
- පාලි භාෂාවතරණය 2 පොත
- පාලි භාෂාව 5 - මූලික පිරිවෙන

**වැඩි දුර ගවේෂණය**


- බාලාවතාරය, ආරියදාස, සෙනෙවිරත්න.: සමයවර්ධන, කොළඹ, 1994.
- පාලි ව්‍යාකරණ විවරණය, සිරිනිවාස හිමි, මයිලෑව.: සමයවර්ධන, කොළඹ, 1966.

# 10. ඒකකය - තද්ධිත

**නිපුණතාව**

1.0 පාලි භාෂාවේ මූලික වියරණ හා භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

1.3 මූලික ව්‍යාකරණාංග හඳුනාගෙන පද සාධනය පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛන කාර්යයේ යෙදෙයි.

**කාලච්ඡේද 06යි.**

**ඉගෙනුම් පල**

- තද්ධිත හඳුන්වා තද්ධිතයන්හි ප්‍රයෝජන නම් කරයි.
- තද්ධිත ප්‍රභේද නම් කොට ඒ ඒ තද්ධිත ප්‍රත්‍යයන් ලියා දක්වයි.
- තද්ධිත පද විග්‍රහ කොට තද්ධිත ප්‍රභේදය නම් කරයි.
- ලේඛන කාර්යයේ දී තද්ධිත පද නිවැරදි ව භාවිත කරයි.
- නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට කෘතිවල එන තද්ධිත උද්ධෘත කොට වගුගත කොට දක්වයි.
- තද්ධිත පද යොදා ගනිමින් අර්ථවත් වාක්‍ය ලියයි.
- තද්ධිත පද සහිත වාක්‍ය මාධ්‍ය භාෂාවෙන් පාලියටත්, පාලියෙන් මාධ්‍ය භාෂාවටත් නඟයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය යටතේ දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- තද්ධිත ප්‍රත්‍යයාර්ථ නාම බව
- නාම පදවලින් පර ව පමණක් තද්ධිත ප්‍රත්‍යය යෙදෙන බව
- තද්ධිතයන්හි ප්‍රයෝජන ඇති බව
- තද්ධිත ප්‍රභේද 3ක් ඇති බව
- ඒ ඒ තද්ධිත ප්‍රභේදයට අයත් ප්‍රත්‍යය සමූහයක් ඇති බව
- තද්ධිත පද විග්‍රහ කොට ප්‍රභේදය නම් කළ යුතු බව
- නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට කෘතිවල එන තද්ධිත පද උපුටා වගුගත කළ යුතු බව
- තද්ධිත පද යොදා ගනිමින් වාක්‍ය නිර්මාණය කළ යුතු බව
- තද්ධිත පද සහිත වාක්‍ය මාධ්‍ය භාෂාවෙන් පාලියටත් පාලියෙන් මාධ්‍ය භාෂාවටත් නැඟිය යුතු බව

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- නිර්දිෂ්ට කෘතිවල එන තද්ධිත පද කිහිපයක් උපුටා දැක්වීම
- එම තද්ධිත පදයන්හි නාමය හා තද්ධිත ප්‍රත්‍යයය වෙන් කොට දැක්වීම
- තද්ධිත ප්‍රභේදය පෙන්වා දීම
- තද්ධිත පදවල ප්‍රයෝජන දක්වා තද්ධිත පද සාදා ගන්නා අයුරු පෙන්වා දීම

- ඒ ඒ තද්ධිත ප්‍රභේදයට අයත් ප්‍රත්‍යය පෙළ ගස්වා, තද්ධිත පද යොදා වාක්‍ය සාදා ගැනීමට සිසුන් යොමු කිරීම
- නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට කෘතිවල එන තද්ධිත පද උපුටා දක්වා වගුගත කරවීම
- තද්ධිත පද යොදා ගැනීමෙන් පුළුල් අදහසක් කෙටියෙන් කිව හැකි බව පෙන්වා දීම
- තද්ධිත පද යොදා අර්ථවත් වාක්‍ය නිර්මාණයට සිසුන් යොමු කිරීම
- තද්ධිත පද සහිත වාක්‍ය පරිවර්තනය කිරීමට සැලැස්වීම

**තක්සේරුව හා ඇගයීම**

- තද්ධිත හඳුන්වා ප්‍රයෝජන ලියයි.
- තද්ධිත ප්‍රභේද නම් කරයි
- ඒ ඒ තද්ධිත ප්‍රභේදයට අයත් ප්‍රත්‍යය ලියා දක්වයි.
- තද්ධිත පද හඳුනාගෙන කිනම් ප්‍රභේදයකට අයත් තද්ධිත පද දැයි ලියා දක්වයි.
- ලේඛනයේ දී තද්ධිත පද නිවැරදි ව භාවිත කරයි.
- නිර්දිෂ්ට අනිර්දිෂ්ට කෘතිවල එන තද්ධිත පද වගුගත කර දක්වයි.
- තද්ධිත පද උපයෝගි කර ගනිමින් වාක්‍ය නිර්මාණය කරයි.
- තද්ධිත පද සහිත වාක්‍ය නිවැරදි ව පරිවර්තනය කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- කළු, සුදු, කොළ පුවරුව
- පාලි භාෂාවතරණය 2 පොත
- පාලි භාෂාව 5 - මූලික පිරිවෙන

**වැඩි දුර ගවේෂණය**

- බාලාවතාරය, ආරියදාස, සෙනෙවිරත්න.: සමයවර්ධන, කොළඹ, 1994.
- පාලි ව්‍යාකරණ විවරණය, සිරිනිවාස හිමි, මයිලෑව.: සමයවර්ධන, කොළඹ, 1966.

## 11. ඒකකය - කිං (ක) ශබ්දය ඇසුරෙන් ප්‍රශ්න සැකසීම

**නිපුණතාව**

2.0 නිවැරදි වාචික සන්නිවේදනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම**

2.1 පාලි භාෂා සම්ප්‍රදායානුකූල ව ප්‍රශ්න අසයි.

2.2 අසන ලද ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයයි.

2.3 අදහසක් නිවැරදිව පාලි භාෂාවෙන් ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද 10 යි.**

**ඉගෙනුම් පල**

- කිං (ක) ශබ්දය ලිංගත්‍රයයේ වරනඟයි.
- කිං (ක) ශබ්දයේ විභක්තිය, ලිංගය හා වචනයට අනුරූපී ලෙස අර්ථ කියයි, ලියයි.
- කිං (ක) ශබ්දය ඇසුරෙන් සරල ප්‍රශ්න සකසයි.
- අසන ලද ප්‍රශ්නවලට සරල පිළිතුරු ලියයි.
- ලිංගවලට, විභක්තිවලට හා වචනවලට අනුරූපී ලෙස ප්‍රශ්න අසයි, පිළිතුරු ලියයි.
- සාමාන්‍ය තොරතුරු දැනගැනීමට ප්‍රශ්න අසයි.
- සම්භාෂණ ප්‍රයෝග උපයෝගි කරගෙන පිළිතුරු දෙයි.
- කතර, කතම ශබ්ද උපයෝගි කරගෙන ප්‍රශ්න අසයි, පිළිතුරු සපයයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය යටතේ දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ප්‍රශ්නවාචක සර්වනාම ශබ්දයක් වන කිං (ක) ශබ්දය ලිංගත්‍රයයේ වරනැඟෙන බව
- ලිංගයට විභක්තියට වචනයට අනුරූපී ලෙස අර්ථය ලිවිය යුතු බව

  **කො** ත්වං? (පුං)

  **කා** තෙසං නිප්ඵත්ති භවිස්සති? (ඉ)

  වාණිජො **කානි** වික්කිණාති? (නපුං)

- දීර්ඝ වාක්‍යවල කිං ශබ්ද රූප යෙදෙන අයුරු පෙන්වා දී ඒවායේ අර්ථ විමසිය යුතු බව
- ප්‍රශ්නවාචී වෙනත් සර්වනාම පද උපයෝගි කරගෙන වාක්‍ය නිර්මාණය හා පිළිතුරු සැකසිය යුතු බව
  **කතමෙ** ච පන බ්‍රාහ්මණකරණා ධම්මා?

  **කතමානි** ඡ භොගානං අපායමුඛානි ?

- සාමාන්‍ය තොරතුරු දැන ගැනීමට ප්‍රශ්න අසා පිළිතුරු සැපයිය යුතු බව.

  **කො'සි** ත්වං? අහං එකො පථිකො.

  **කුතො** ත්වං ආගතොසි? අහං ඉන්දුදෙසතො ආගතොම්හි.

  ත්වං **කිං** කාතුං ආගතොසි? අහං භණ්ඩානි වික්කිණිතුං ආගතොම්හි.

කො තුය්හං පිතා? මම පිතා මහානාමො වාණිජො.

**කත්ථ** ත්‍වං කමමං කරොසි? අහං එකස්මිං සාසනඝරෙ (තැපැල් හලක) කම්මං කරොමි.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- කිං ශබ්දය ලිංගත්‍රයයේ වරනගා වගුගත කොට ප්‍රදර්ශනය කිරීම
- කිං ශබ්දයේ ලිංගයට විභක්තියට හා වචනයට අනුරූපී ලෙස අර්ථ කීම හා සිසුන් ලවා ලියවීම
- නම, ගම ආදි තොරතුරු දක්වෙන ප්‍රශ්න සකසා ලිවීම, විමසීම, පිළිතුරු ලබාගැනීම සඳහා සිසුන් යොමු කිරීම
- දිර්ඝ වාක්‍යවල කිං ශබ්ද රූප යෙදී ඇති අයුරු පෙන්වා දීම
- කිං, කතර, කතම ආදි ශබ්ද යෙදුණු පාලි වාක්‍ය නිර්දිෂ්ට අනිර්දිෂ්ට කෘතිවලින් උපුටා තේරුම ලියවීම

**තක්සේරුව හා ඇගයීම**

- කිං ශබ්දය වගුගත කර ලියයි.
- තොරතුරු දැනගැනීමට ප්‍රශ්න අසයි. පිළිතුරු සපයයි.
- කිං, කතර, කතම ශබ්ද යෙදුණු පාලි වාක්‍යය උපුටා දක්වා තේරුම ලියයි.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට පාඨ ග්‍රන්ථ
- පාලි නාමවරනැඟිල්ල
- අනිර්දිෂ්ට ග්‍රන්ථ

**වැඩි දුර ගවේෂණය**

- පාලි ගද්‍ය පද්‍ය රචනා, බුද්ධදත්ත හිමි, පොල්වත්තේ.: අම්බලන්ගොඩ, 1960.
- Aids to Pali Conversation and Translation, by A. P. Buddhadatta Thero.

# 12. ඒකකය - ප්‍රශ්නවාචක නිපාත උපයෝගී කරගෙන ප්‍රශ්න සැකසීම

**නිපුණතාව**

2.0 නිවැරදි වාචික සන්නිවේදනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම**

2.1 පාලි භාෂා සම්ප්‍රදායානුකූල ව ප්‍රශ්න අසයි.

2.2 අසන ලද ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයයි.

2.3 අදහසක් නිවැරදි ව පාලි භාෂාවෙන් ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද 10 යි.**

**ඉගෙනුම් පල**

- ප්‍රශ්නවාචක නිපාත අර්ථය සමඟ ලියා දක්වයි.
- ප්‍රශ්නවාචක නිපාත වාක්‍යවල යෙදෙන අයුරු විස්තර කරයි.
- ප්‍රශ්නවාචක නිපාත යොදා වාක්‍ය නිර්මාණය කරයි.
- සම්භාෂණය සඳහා ප්‍රශ්නවාචක නිපාත උපයෝගි කර ගනියි.
- ප්‍රශ්නවාචක පද යෙදුණු තැන් ගවේෂණය කරයි.
- ප්‍රශ්නවාචක නිපාත සහිත වාක්‍ය උපුටා ලියා දක්වා තේරුම ලියයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය යටතේ දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ප්‍රශ්නවාචක නිපාත පද හැකි තාක් තෝරා ලිවිය යුතු බව

  කිං, කථං, කත්‍ථ, කීවචිරං, කුදස්සු, කච්, කීව, කුත්‍ර, අපි, නු, නනු, කථංභූත, කතිවිධං, කති, කතික්ඛත්තුං, වැනි නිපාත ලියා තේරුම ලිවිය යුතු බව

- ප්‍රශ්නවාචක නිපාත වාක්‍යවල යෙදෙන අයුරු පෙන්වා දිය යුතු බව
- ප්‍රශ්නවාචක නිපාත යෙදුණු වාක්‍ය තෝරා අර්ථය දැක්විය යුතු බව
- සම්භාෂණය සඳහා ප්‍රශ්නවාචක නිපාත උපයෝගී කර ගත හැකි බව

  **කහන්නු** බො සම්ම කාරායන, සො භගවා විහරති අරහං සම්මා සම්බුද්ධො. අත්‍ථි මහාරාජ, මෙදතලුම්පං නාම සක්‍යානං නිගමො. තත්‍ථ සො භගවා අරහං සම්මා සම්බුද්ධො විහරති.

  **කීවදූරෙ** පන සම්ම කාරායන, නගරම්හා සක්‍යානං නිගමො? න දූරෙ මහාරාජ. තිණි යොජනානි. සක්කා දිවසාවසෙසෙන ගන්තුං.

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමය**

- අර්ථ සහිත ව ප්‍රශ්නවාචක නිපාත නාමාවලියක් ඉදිරිපත් කිරීම
- ප්‍රශ්නවාචක නිපාත වාක්‍යවල මුල, මැද හා අග යෙදෙන බව පෙන්වා දීම
- ප්‍රශ්නවාචක නිපාත එකකට වඩා යෙදුණු වාක්‍ය සඳහා විශේෂ අවධානය යොමු කරවීම
- ප්‍රශ්නවාචක නිපාත යෙදුණු පාලි වාක්‍ය නිර්දිෂ්ට අනිර්දිෂ්ට කෘතිවලින් උද්ධෘත කොට ඒවායේ තේරුම ලිවීම

**තක්සේරුව හා ඇගයීම**

- ප්‍රශ්නවාචක නිපාත තේරුම සමඟ ලියයි.
- ප්‍රශ්නවාචක නිපාත සහිත වාක්‍ය උපයෝගි කරගෙන සංවාදයක් ඉදිරිපත් කරයි.
- ප්‍රශ්නවාචක නිපාත යෙදුණු පාලි වාක්‍යය උපුටා තේරුම් ලියයි.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට පාඨ ග්‍රන්ථ
- පාලි භාෂාව හා රචනය - පැණිහෙළ සිරි සම්බෝධි ස්ථවිර

**වැඩි දුර ගවේෂණය**

- පාලි ගද්‍ය පද්‍ය රචනා - පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි
- පාලි භාෂාවතරණය 2, බුද්ධදත්ත නා හිමි, පොල්වත්තේ.: සමයවර්ධන, කොළඹ, 1999.
- Aids to Pali Conversation and Translation, by A. P. Buddhadatta Thero

## 13. ඒකකය - **උච්චාරණය හා ස්මරණය**

**නිපුණතාව**

3.0 නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ කියවා භාවිතයට හුරු වෙයි.

**නිපුණතා මට්ටම :**

3.1 පාලි ගද්‍ය පද්‍ය පාඨ නිවැරදි ව උච්චාරණය කරයි.

3.2 සම්ප්‍රදායාගත රිද්මානුකූල ව සජ්ඣායනය කරයි.

3.3 සුවිශේෂ පාලි පාඨ වනපොත් කරයි.

**කාලච්ඡේද 10 යි**

**ඉගෙනුම් පල**

- තෝරාගත් සූත්‍ර පාඨ හා ගාථා හඬනඟා කියවයි.
- අල්පප්‍රාණ, මහාප්‍රාණ හා සංයුක්ත අක්ෂර පැහැදිලි ව උච්චාරණය කරයි.
- ගාථාවල විවිධ වෘත්ත හා යතිය කෙරෙහි සැලකිලිමත් ව සජ්ඣායනා කරයි.
- නියමිත ගද්‍ය හා පද්‍ය කොටස් මතකයෙන් කියවයි.
- නියමිත ගද්‍ය හා පද්‍ය කොටස් මතකයෙන් නිවැරදි ව ලියයි.
- පද බෙදීම් පිළිබඳ අවබෝධයෙන් යුතු ව සජ්ඣායනා කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය යටතේ දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- අදාළ සූත්‍ර පාඨ හා ගාථා හඬනඟා කියවිය යුතු බව
- අල්පප්‍රාණ, මහාප්‍රාණ හා සංයුක්ත අක්ෂර පැහැදිලි ව උච්චාරණය කළ යුතු බව
- ගාථාවල විවිධ වෘත්ත හා යතිය කෙරෙහි සැලකිලිමත් ව සජ්ඣායනා කළ යුතු බව
- නියමිත ගද්‍ය හා පද්‍ය කොටස් මතකයෙන් කියවිය යුතු බව
- නියමිත ගද්‍ය හා පද්‍ය කොටස් මතකයෙන් නිවැරදි ව ලිවිය යුතු බව
- පද බෙදීම් පිළිබඳ අවබෝධයෙන් යුතු ව සජ්ඣායනා කළ යුතු බව

නිදසුන් :-

වැරදි ලෙස අක්ෂර භාවිතය - ඉතිබි සෝ බගවා අරහං,... පුරිසධම්මසාරථී සත්ථා

වැරදි ලෙස පද බෙදීම - අධිවාසේ තුනෝ භන්තේ

නිවැරදි ලෙස අක්ෂර භාවිතය - **ඉතිපි සො භගවා අරහං,..... පුරිසදම්මසාරථී සත්ථා, දෙවමනුස්සානං**

නිවැරදි ලෙස පද බෙදීම - **අධිවාසෙතු නො භන්තෙ**

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමය**

- විවිධ ශෛලීන්ට අයත් ගද්‍ය පද්‍ය කොටස් උපුටා දැක්වීම
- අර්ථානුරූප ව, අර්ථයට හානි නොවන පරිදි ඒ පිළිබඳ සැලකිලිමත් වෙමින් සජ්ඣායනා කිරීම
- උපුටා දක්වන ලද ගද්‍ය පද්‍ය පාඨයන්හි වෙනස්කම් පෙන්වා දීම
- උපුටා ගත් ගද්‍ය පද්‍ය පාඨයන් විවිධ ශෛලීන් ට අනුව සම්ප්‍රදාය නොබිඳ සජ්ඣායනා කරවීම.
- පාලි සම්ප්‍රදායානුකූල වාක්‍යයන්හි වාක්‍ය ඛණ්ඩ ගළපා අර්ථ දැක්වීම
- උපුටා ගත් ගද්‍ය පද්‍ය පාඨ වනපොත් කරවීම හා ඒවායේ අන්වය සකස් කොට පෙන්වීම

**තක්සේරුව හා ඇගයීම**

- නිර්දිෂ්ට ඡේද පොත බලා ගෙන නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවයි.
- නිර්දිෂ්ට ගාථා හා පාඨ ස්මරණයෙන් කියයි.
- උක්ත පාඨ අල්පප්‍රාණ, මහාප්‍රාණ අක්ෂර නිවැරදි ව භාවිත කරමින් නිවැරදි පද බෙදීම් සහිත ව ව්‍යාකරණානුකූල ව ලියයි.

**ගුණාත්මක යෙදවුම්**

- ධම්මපදය CD/ කැසට් පට
- සිගාලකසුත්ත
- ධම්මපද
- මහාසුපිනජාතක

**වැඩි දුර ගවේෂණයට**

- දීඝනිකායට්ඨකථා (සිගාල සුත්ත) ප්‍රථම භාගය, දේවමිත්ත හිමි, හෙයියන්තුඩුවේ.: හේවාවිතරණ මුද්‍රණය, කොළඹ, 1989.
- ධම්මපදට්ඨකථා, රතනසාර හිමි, කහවේ.: හේවාවිතාරණ මුද්‍රණය, 1989/1991.

# 14. ඒකකය - නිර්දිෂ්ට ග්‍රන්ථය - මහාසුපින ජාතක

**නිපුණතාව**

4.0 නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ පරිවර්තන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම**

4.1 අන්වය හඳුනාගනියි.

4.2 ක්‍රියාකාරක පද සම්බන්ධය නිවැරදි ව තේරුම් ගනියි.

4.3 පාලි උද්ධෘත පාඨ මාධ්‍ය භාෂාවට පරිවර්තනය කරයි.

**කාලච්ඡේද 30 යි**

**ඉගෙනුම් පල**

- ජාතකට්ඨකථාව පිළිබඳ හැඳින්වීමක් කරයි.
- ජාතක කථාවක ආකෘතිය දක්වයි.
- මහාසුපින ජාතකයේ කථා සාරය කියයි.
- ජාතක ගාථාව ස්මරණයෙන් කියයි. අර්ථ ගන්වයි.
- පරිවර්තනයක මූලික ලක්ෂණ තේරුම් කරයි.
- මාධ්‍ය භාෂාවේ වාක්‍ය රීති (අන්වය, ක්‍රියාකාරක පද සම්බන්ධ ආදිය) තේරුම් ගෙන නිවැරදි ව පරිවර්තන කාර්යයේ යෙදෙයි.
- ජාතක කථාව ආශ්‍රයයෙන් අසන ප්‍රශ්නවලට පාලි භාෂාවෙන් පිළිතුරු දෙයි.
- තෝරාගත් පදවල ව්‍යාකරණ විභාග කොට දක්වයි.
- ජාතක කථාවේ විශේෂ භාෂා ප්‍රයෝග හඳුනාගෙන අර්ථ දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය යටතේ දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ජාතකට්ඨකථාවේ සඤ්ඤාදී පඤ්චකය දැක්විය යුතු බව
- ජාතකට්ඨකථාව ගැඹුරු ජීවිත ආදර්ශ ලබා දෙන කථා ඇතුළත් කෘතියක් බව
- පුද්ගල ජීවිතයේ සාර්ථකත්වය සමාජ සංවර්ධනයට බලපාන බව
- ධාර්මික පාලනය දෙලොව දියුණුවට හේතු වන බව
- ඛුද්දක නිකායට අයත් ජාතකපාලියට ලියන ලද ජාතකට්ඨකථාවෙහි කථාවස්තු 557ක් ඇති බව
- කෘතියේ කතුවරයා අවිනිශ්චිත වුව ද, එය අත්ථදස්සි, බුද්ධමිත්ත හා බුද්ධදේව යන හිමිවරුන්ගේ ආරාධනයෙන් මහාවිහාර න්‍යායය අනුගමනය කරමින් රචිත බව
- තෝරා ගත් ඡේද කිහිපයක අනුවාදය දැක්විය යුතු බව
- පාලි ජාතක කථාවල ව්‍යුහය පැහැදිලි කළ යුතු බව (අතීත කථාව, වර්තමාන කථාව, ගාථාව, අර්ථ විවරණය හා සමෝධානය)
- අන්වය සකසා අර්ථය දැක්විය යුතු බව
- දුෂ්කර පද අත් නොහැර අරුත් කිව යුතු බව
- සමස්ත කථා සාරය ගෙනහැර දැක්විය යුතු බව

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමය**

- ජාතකපාළිය හා ජාතකට්ඨකථා ග්‍රන්ථ ශිෂ්‍යයන්ට ප්‍රදර්ශනය කිරීම
- එම ග්‍රන්ථ පිළිබඳ කෙටි හැඳින්වීමක් කිරීම
- පාලි අට්ඨකථා නාමාවලිය ප්‍රදර්ශනය කරමින් එහි ජාතකට්ඨකථාව ඇතුළත් වන ස්ථානය පැහැදිලි කිරීම
- ජාතකට්ඨකථාවේ කර්තෘ, කාලය, අන්තර්ගතය හා ව්‍යුහය පිළිබඳ විස්තර කිරීම
- පරිවර්තනයක මූලික ලක්ෂණ පැහැදිලි කිරීම

  (පරිවර්තනය නූතන ලෝකයේ ඉතා ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වන විෂය ධාරාවකි. එහි පරිවර්තනය, අනුවර්තනය, අනුවාදය, පදගත පරිවර්තනය යනුවෙන් විවිධාකාර ප්‍රභේද ඇත. පරිවර්තකයා මූලාශ්‍රය භාෂාව, ඉලක්ක භාෂාව හා අදාළ සංස්කෘතිය යන අංග තුන ම දත යුතු අතර මෙහිදී මූලාශ්‍රය භාෂාව (පාලි) ඉලක්ක භාෂාව (සිංහල) හා සංස්කෘතිය (පැරණි ඉන්දීය හා ශ්‍රී ලාංකේය සංස්කෘතිය) වන බව පැහැදිලි කිරීම.)
- පදගත පරිවර්තනය සඳහා සිසුන් හුරු කිරීම
- අර්ථය රැකෙන සේ, දුෂ්කර පද අත් නොහැර, සමස්තය තේරුම් ගෙන, පරිවර්තනය කළ යුතු බව පැහැදිලි කිරීම
- ගද්‍යයක අන්වය, පද්‍යයක අන්වයට වඩා පහසු බව (කථාවට අදාළ ගාථාව හා තෝරාගත් ඡේදයක් ඇසුරෙන්) පැහැදිලි කිරීම
- නිවැරදි අර්ථාවබෝධයට ක්‍රියාකාරක පද සම්බන්ධය වැදගත් වන ආකාරය දැක්වීම
- පාලි උද්ධෘත මාධ්‍ය භාෂාවට පරිවර්තනයේ දී මාධ්‍ය භාෂාවට ආවේණික රීතියෙහි අවශ්‍යතාව පැහැදිලි කිරීම

  **පාලි රීතිය -** (ඒකවචන උක්තය හා ඒකවචන ආඛ්‍යාතය)

  **ඉදං සත්ථා ජෙතවනෙ විහරන්තො සොළස මහාසුපිනෙ ආරබ්භ කථෙසි.**

  **සිංහල රීතිය** - (**ගෞරවාර්ථ උක්තය** හා බහුවචන ආඛ්‍යාතය)

  මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙව්රම වසන සේක්, සොළොස් මහ සිහින අරබයා දෙසූ සේක./ වදාළ සේක. / වදාළහ.
- මහාසුපින ජාතකයේ පදගතාර්ථ දැක්වීම
- **"ලාපූනි සීදන්ති සිලා ප්ලවන්ති"** යනාදී ගාථාව වාචෝද්ගත කරවා අර්ථ ගැන්වීම
- තෝරාගත් ඡේද කිහිපයක් මාධ්‍ය භාෂාවට පරිවර්තනය කර ඉන් මතු වන ගැටලු නිරවුල් කර දීම

**තක්සේරුව හා ඇගයීම**

- මහාසුපින ජාතකයේ අතීත හා වර්තමාන කථා සාරය පන්තියට ඉදිරිපත් කරයි.
- **"ලාපූනි සීදන්ති සිලා ප්ලවන්ති"** යනා දී ගාථාව ස්මරණයෙන් කියයි, අර්ථගන්වයි.
- **මහාසුපින ජාතකය** මාධ්‍ය භාෂාවෙන් පන්තියට ඉදිරිපත් කරයි.
- ජාතක කථාව ව්‍යාකරණානුකූල ව පරිවර්තනය කොට ලියා දක්වයි.
- එක් එක් සිහිනයෙන් ප්‍රකාශ කෙරෙන සිහින පලාපල ලියා දක්වයි.

**ගුණාත්මක යෙදවුම්**

- ශ්‍රව්‍ය - දෘශ්‍ය සංයුක්ත තැටි
- ජාතකට්ඨකථා, පියතිස්ස හිමි, විදුරුපොළ.: හේවාවිතාරණ මුද්‍රණය, 1988/1990.
- පාලි සාහිත්‍යය, බුද්ධදත්ත නා හිමි, පොල්වත්තේ.: රත්න පොත් ප්‍රකාශයෝ, කොළඹ, 2012.

## 15. ඒකකය - නිර්දිෂ්ට ග්‍රන්ථය - ධම්මපදය

**නිපුණතාව**

4.0 නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ පරිවර්තන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම**

4.1 අන්වය හඳුනාගනියි.

4.2 ක්‍රියාකාරක පද සම්බන්ධය නිවැරදි ව තේරුම් ගනියි.

4.3 පාලි උද්ධෘත පාඨ මාධ්‍ය භාෂාවට පරිවර්තනය කරයි.

**කාලච්ඡේද 30 යි**

**ඉගෙනුම් පල**

- ධම්මපදය පිළිබඳ හැඳින්වීමක් කරයි.
- ධම්මපදයේ අන්තර්ගතය, ස්වභාවය හා වැදගත්කම පැහැදිලි කරයි.
- ධම්මපදයේ වර්ග නාමයන්, එම වර්ගවල අන්තර්ගතයන්ට අනුරූප වන සේ නම් කර ඇති ආකාරය පණ්ඩිත වර්ගය ඇසුරින් පැහැදිලි කරයි.
- ධම්මපදයේ පණ්ඩිත වග්ගයේ අන්තර්ගතය පැහැදිලි කරයි.
- පණ්ඩිත වර්ගයේ ගාථාවල අන්වය ලියා දක්වයි.
- ගාථාවන්හි පදගතාර්ථ නිවැරදි ව ලියා දක්වයි.
- ගාථාවල සරල අදහස මාධ්‍ය භාෂාවෙන් ඉදිරිපත් කරයි.
- ගාථාවල විශේෂ පද හඳුනාගෙන අටුවාගත අර්ථය මාධ්‍ය භාෂාවෙන් ප්‍රකාශ කරයි.
- පණ්ඩිත වග්ගයට අයත් ගාථා වනපොත් කොට මතකයෙන් කියයි.
- පණ්ඩිත වග්ගයට අයත් ගාථා නිවැරදි අක්ෂර වින්‍යාසය හා පද බෙදීම් සහිතව ලියා දක්වයි

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය යටතේ දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- සූත්‍ර පිටකයට අයත් ඛුද්දක නිකායේ දෙවන ග්‍රන්ථය ධම්මපදය බව
- ධම්මපදය බෞද්ධයාගේ අත්පොත වශයෙන් හඳුන්වන බව
- ධම්මපදය ගාථා 423කින් හා වර්ග 26කින් සමන්විත බව
- මෙහි ඇතුළත් බොහෝ ගාථා ත්‍රිපිටකයේ විවිධ ස්ථානවල සංග්‍රහ වී ඇති බව
- ධම්මපදය මැනවින් හැදෑරීම සඳහා ධම්මපදට්ඨකථාව අතිශයින් ප්‍රයෝජනවත් බව
- ගාථාවන්හි අන්වය සකස් කළ යුතු බව
- අටුවාව ආශ්‍රයෙන් ධර්මාර්ථ විවරණය කළ යුතු බව
- පණ්ඩිත වර්ගයේ ගාථාවන්හි සමස්තය තේරුම් ගෙන ව්‍යාකරණ රීති අනුව පරිවර්තනය සිදු කළ යුතු බව
- පණ්ඩිත වර්ගයේ සියලු ම ගාථා වනපොත් කළ යුතු බව
- පණ්ඩිත වග්ගයේ ගාථා නිවැරදි අක්ෂර වින්‍යාසය හා පද බෙදීම් සහිත ව ලිවිය යුතු බව හා කියවිය යුතු බව

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමය :**

- සිංහල, ඉංග්‍රීසි ආදි ධම්මපද පරිවර්තන කිහිපයක් හා අට්ඨකථාව ප්‍රදර්ශනය කරමින් පාඩම ආරම්භ කිරීම
- ධම්මපදයේ අන්තර්ගතය හා ව්‍යූහය පිළිබඳ විස්තර කිරීම
- ගාථාවන්හි අර්ථය අට්ඨකථාව ද ඇසුරු කර ගනිමින් පැහැදිලි කිරීම

- ගාථාවල අනුවාදය ඉදිරිපත් කිරීම
- පදගත පරිවර්තන කාර්යය සඳහා සිසුන් හුරු කරවීම
- අදාළ පද්‍යවල පදගතාර්ථ පාඩම් කරවීම
- අර්ථය රැකෙන සේ, දුෂ්කර පද අත්නොහැර, සමස්තය තේරුම් ගෙන පරිවර්තනය කිරීමට හුරු කරවීම
- නිවැරදි අර්ථාවබෝධයට ක්‍රියාකාරක පද සම්බන්ධය වැදගත් වන ආකාරය දක්වීම
- සියලු ගාථා මාධ්‍ය භාෂාවට පරිවර්තනය කරවා, මාධ්‍ය භාෂාවට පරිවර්තනය කිරීමේ දී මතු වන ගැටලු පැහැදිලි කිරීම
- පණ්ඩිත වර්ගයේ සියලු ම ගාථා වාචෝද්ගත කරවීම

**තක්සේරුව හා ඇගයීම**

- ධම්මපදය පිළිබඳ හැඳින්වීමක් කරයි.
- නිර්දිෂ්ට ගාථාවල අන්වය ලියයි.
- සිංහල වාක්‍ය රීතිය අනුව නිවැරදි ව පරිවර්තන කාර්යයේ යෙදෙයි.
- පණ්ඩිත වර්ගයේ ගාථා මතකයෙන් කියයි.
- නිවැරදි පද බෙදීම් සහිත ව ගාථා ලියා දක්වයි.
- පණ්ඩිත වර්ගයේ ගාථාවල අර්ථය මතකයෙන් ඉදිරිපත් කරයි.
- තෝරාගත් පදවල ව්‍යාකරණ විභාග කරයි.
- පණ්ඩිත වග්ගය ඇසුරෙන් ධර්මදේශනයක්/ කථාවක් පවත්වයි.
- දුරවබෝධ පද අටුවා විවරණ ආශ්‍රයෙන් පැහැදිලි කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- ධම්මපදය
- සද්ධර්මකෞමුදී නම් වූ ධර්මපද ප්‍රදීපිකාව
- සංයුක්ත තැටිය, පූජ්‍ය වේරගොඩ සාරද හිමි

**වැඩි දුර ගවේෂණයට**


- ධම්මපදට්ඨකථා, රතනසාර හිමි, කහවේ: හේවාවිතාරණ මුද්‍රණය, 1989/1991.
- Abeyanayake, Oliver, A Textual and Historical Analysis of the Khuddakanikaya

## 16. ඒකකය - **නිර්දිෂ්ට ග්‍රන්ථය - සිගාලකසුත්ත**

නිපුණතාව

4.0 නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය කොටස් පරිවර්තන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම**

4.1 අන්වය හඳුනාගනියි.

4.2 ක්‍රියාකාරක පද සම්බන්ධය නිවැරදි ව තේරුම් ගනියි.

4.3 පාලි උද්ධෘත පාඨ මාධ්‍ය භාෂාවට පරිවර්තනය කරයි.

**කාලච්ඡේද 40 යි**

**ඉගෙනුම් පල**

- සූත්‍රය පිළිබඳ හැඳින්වීමක් කරයි.
- සූත්‍රයේ අන්තර්ගතය, ස්වභාවය හා වැදගත්කම පැහැදිලි කරයි.
- සූත්‍රාගත ගාථාවල අන්වය ලියයි. කියයි.
- ගාථාවන්හි පදගතාර්ථ ලියා දක්වයි.
- ගාථාවල සරල අදහස මාධ්‍ය භාෂාවෙන් ඉදිරිපත් කරයි.
- සූත්‍රාගත විශේෂ පද හඳුනාගෙන අටුවාගත අර්ථය මාධ්‍ය භාෂාවෙන් ඉදිරිපත් කරයි.
- සූත්‍රයට අයත් ගාථා වනපොත් කොට මතකයෙන් කියයි.
- සූත්‍රාගත ගාථා නිවැරදි අක්ෂර වින්‍යාසය හා පද බෙදීම් සහිත ව ලියා දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය යටතේ දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- සූත්‍රය පිළිබඳ හැඳින්වීමක් කළ යුතු බව
- සූත්‍රයේ අන්තර්ගතය, ස්වභාවය හා වැදගත්කම පැහැදිලි කළ යුතු බව
- සූත්‍රාගත ගාථාවල අන්වය ලියවිය යුතු බව හා කියවිය යුතු බව
- ගාථාවන්හි පදගතාර්ථ ලියා දැක්විය යුතු බව
- ගාථාවල සරල අදහස මාධ්‍ය භාෂාවෙන් ඉදිරිපත් කළ යුතු බව
- සූත්‍රාගත විශේෂ පද හඳුනාගෙන අටුවාගත අර්ථය මාධ්‍ය භාෂාවෙන් ඉදිරිපත් කළ යුතු බව
- සූත්‍රයට අයත් ගාථා හා විශේෂ පාඨ වනපොත් කොට මතකයෙන් ලියා දැක්විය යුතු බව
- සූත්‍රයට අයත් ගාථා නිවැරදි අක්ෂර වින්‍යාසය හා පද බෙදීම් සහිත ලියා දැක්විය යුතු බව හා මාධ්‍ය භාෂාවට පරිවර්තනය කළ යුතු බව

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමය**

- සූත්‍රය පිළිබඳ හැඳින්වීමක් කිරීම
- සූත්‍රයේ අන්තර්ගතය, ස්වභාවය හා වැදගත්කම පැහැදිලි කිරීම
- සූත්‍රාගත ගාථාවල අන්වය ලිවීම කියවීම
- ගාථාවන්හි පදගතාර්ථ ලියා දැක්වීම
- ගාථාවල සරල අදහස මාධ්‍ය භාෂාවෙන් ඉදිරිපත් කිරීම
- සූත්‍රාගත විශේෂ පද හඳුනාගෙන අටුවාගත අර්ථය මාධ්‍ය භාෂාවෙන් ඉදිරිපත් කිරීම
- සූත්‍රයට අයත් ගාථා වනපොත් කරවා මතකයෙන් කියවීම
- සූත්‍රයට අයත් ගාථා හා පාඨ නිවැරදි අක්ෂර වින්‍යාසය හා පද බෙදීම් සහිත ව ලියා දැක්වීම

**තක්සේරුව හා ඇගයීම**

- සූත්‍රය පිළිබඳ හැඳින්වීමක් කරයි.
- සූත්‍රයේ අන්තර්ගතය, ස්වභාවය හා වැදගත්කම පැහැදිලි කරයි.
- සූත්‍රයේ සරල අදහස මාධ්‍ය භාෂාවෙන් ඉදිරිපත් කරයි.
- සූත්‍රාගත විශේෂ පද හඳුනාගෙන අටුවාගත අර්ථය මාධ්‍ය භාෂාවෙන් ඉදිරිපත් කරයි.
- සූත්‍රයට අයත් ගාථා හා පාඨ මතකයෙන් කියයි.
- සූත්‍රයට අයත් ගාථා හා පාඨ නිවැරදි අක්ෂර වින්‍යාසය හා පද බෙදීම් සහිත ව ලියා දක්වයි.

**ගුණාත්මක යෙදවුම්**

- (අදාළ කොටස) - සුමංගල විලාසිනී (ද්විතීය භාගය), රේවත හිමි, බෝරුැග්ගමුවේ.: හේවාවිතරණ මුද්‍රණය, 1992, කොළඹ.

**වැඩි දුර ගවේෂණයට**

- ඡට්ඨ සංගායනා සංයුක්ත තැටිය
- අන්තර්ජාලය

# 17. ඒකකය - අනිර්දිෂ්ට ගද්‍ය පාඨ - අර්ථාවබෝධය

**නිපුණතාව**

5.0 ගද්‍ය පද්‍ය පාඨ කියවා අර්ථය අවබෝධ කර ගනියි.

**නිපුණතා මට්ටම**

5.1 පාලි ගද්‍ය පාඨ කියවා අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.

**කාලච්ඡේද 10 යි.**

**ඉගෙනුම් පල**

- තෝරාගත් පාලි ගද්‍ය පාඨ නිවැරදි ව කියවයි.
- වාක්‍යවල උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය දක්වයි.
- ආඛ්‍යාත පදවල විභක්තිය, පුරුෂය හා වචනය වෙන් කර ලියයි.
- උක්ත පදවල ලිංගය, ශබ්ද ප්‍රකෘතිය වෙන් කර ලියයි.
- උක්ත පද ස්වරාන්ත වශයෙන් වෙන් කරයි.
- ආඛ්‍යාත පදවල ධාතුව හා ප්‍රත්‍යය වෙන්කර ලියයි.
- සන්ධි පද විසන්ධි කර ලියයි.
- විසන්ධි පද සන්ධි කර දක්වයි.
- සමාස, තද්ධිත, කිතක, පූර්වක්‍රියා, තුමන්ත ක්‍රියා, නාමවිශේෂණ, ක්‍රියාවිශේෂණ, නිපාත හා උපසර්ග වෙන් කර ලියයි.
- සරල මෙන්ම සංකීර්ණ වාක්‍ය මාධ්‍ය භාෂාවට පරිවර්තනය කරයි.
- පාලි ඡේදයක් ඇසුරෙන් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේදී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට පාලි ඡේද දහයක් ඇසුරෙන් ප්‍රශ්න විමසිය යුතු බව
- අනිර්දිෂ්ට පරිවර්තනයේ වැදගත්කම පැහැදිලි කළ යුතු බව
- සම්පූර්ණ පෙළ සමස්තාර්ථය තේරුම් ගෙන කියවිය යුතු බව
- ක්‍රියාකාරක පද සම්බන්ධය තේරුම් ගනිමින් කියවිය යුතු බව
- දුෂ්කර පද සලකුණු කර ගත යුතු බව
- වාක්‍යවල අන්වය සකසා ගත යුතු බව
- සන්ධි පද විසන්ධි කොට අර්ථය ලබා ගත යුතු බව
- සමාස, තද්ධිත, කිතක, පූර්වක්‍රියා, තුමන්ත ක්‍රියා, නාමවිශේෂණ, ක්‍රියාවිශේෂණ, නිපාත හා උපසර්ග හඳුනාගෙන අර්ථ ගැන්විය යුතු බව
- සරල මෙන් ම සංකීර්ණ වාක්‍ය මාධ්‍ය භාෂාවට නැඟිය යුතු බව
- පාලි ඡේදයක් ඇසුරෙන් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු බව

නිදර්ශන 01

පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

> මහාවාසවිහාරෙ අරියවංසධම්මදෙසනා කථනකාලෙ කණ්ඩරජ්ජවාසී එකො මහා ථෙරො ධම්මං සොස්සාමීති වත්‍වා ගන්ත්වා අත්තනො නිසීදනඔකාසං අලභිත්වා පරිසපරියන්තෙ එකස්මිං තිණගුම්බෙ අට්ඨාසි. තත්ථ ඨත්වා ධම්මං සුණමානස්ස එකො භුජගො තිණගුම්බතො නික්ඛමිත්වා පාදන්තරෙනාරුය්හ චත්තාරො දාඨා පාපෙත්‍වා නිසීදනපස්සෙ ඩසී. ථෙරො ධම්මසවණ අන්තරායං මා හොතුති චින්තෙත්වා හත්‍ථං ඔතාරෙත්වා භුජගස්ස සීසං දළ්හං ගහෙත්වා උපාහනථවිකායං පක්ඛිපිත්වා මුඛං බන්ධිත්වා ධම්මං අස්සොසි. ධම්මස්සවණානුභාවෙන දට්ඨට්ඨානතො විසං න උග්ගතං. ධම්මස්සවණාවසානෙ අරුණුග්ගතෙ මනුස්සානං ච ගතකාලෙ මහාභුජගො මයා ගහිතොති භුජගං දස්සෙසි.

1. 'අරියවංසධම්මදෙසනා' යනු කුමක් ද?
2. තෙරුන් වහන්සේ ධර්ම දේශනය අසන ලද්දේ කුමන ස්ථානයේ සිට ද?
3. සර්පයා දෂ්ට කළ පසු උන් වහන්සේට ඇති වූ සිතිවිල්ල කුමක් ද?
4. 'උපාහන ථවිකය' යනු කුමක් ද?
5. උන් වහන්සේ විසින් භික්‍ෂූන් වහන්සේලාට සර්පයා දක්වනු ලැබුවේ කුමන වේලාවේ ද?
6. 'නිසීදනපස්ස' යනු කුමක් ද?
7. සර්ප විෂ උන් වහන්සේගේ ශරීර පුරා පැතිර නො ගියේ කුමක් නිසා ද?
8. මෙම සිද්ධියට සම්බන්ධ තෙරුන් වහන්සේගේ නම කුමක් ද?
9. 'ඔහාරෙත්‍වා' යන ක්‍රියා පදයේ ධාතුව හා ප්‍රත්‍යය වෙන් කර දක්වන්න.
10. 'අට්ඨාසි' යන පදයේ ආඛ්‍යාත විභක්තිය, පුරුෂය හා වචනය දක්වන්න.

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමය**

- අනිර්දිෂ්ට පාලි ඡේද උපුටා දැක්වීම
- සමස්තාර්ථය තේරුම් ගෙන කියවීම
- වාක්‍යවල ක්‍රියාකාරක පද සම්බන්ධය දැක්වීම
- දුෂ්කර පද සලකුණු කිරීම
- වාක්‍යවල අන්වය සකසා ගැනීම
- සන්ධි පද විසන්ධි කොට දැක්වීම
- සමාස, තද්ධිත, කිතක, පූර්වක්‍රියා, තුමන්ත ක්‍රියා, නාමවිශේෂණ, ක්‍රියාවිශේෂණ, නිපාත හා උපසර්ග හඳුනාගෙන අර්ථ ගැන්වීම
- සරල මෙන් ම සංකීර්ණ වාක්‍ය මාධ්‍යභාෂාවට නැඟීම
- පරිවර්තන දුර්වලතා පුවරුවේ ලියා දක්වමින් එම දුර්වලතා සඳහා ප්‍රතිපෝෂණය ලබාදීම
- පාලි ඡේදයක් ඇසුරෙන් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම

**තක්සේරුව හා ඇගයීම**

- අනිර්දිෂ්ට පරිවර්තනය පිළිබඳ හැඳින්වීමක් කරයි.
- අනිර්දිෂ්ට ගද්‍ය පාඨවල ක්‍රියාකාරක පද සම්බන්ධය අනුව අර්ථය ලියා දක්වයි.
- අනිර්දිෂ්ට ගද්‍ය පාඨ මාධ්‍ය භාෂාගත වාක්‍ය රීතිය අනුව පරිවර්තනය කරයි.
- වාක්‍යවල ඇති ව්‍යාකරණාංග හඳුනාගෙන ඒ අනුව අර්ථ ගන්වයි.
- අනිර්දිෂ්ට පාඨ ඇසුරෙන් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.

**ගුණාත්මක යෙදවුම්**

- ධම්මපදට්ඨකථා, රතනසාර හිමි, කහවේ.: හේවාවිතාරණ මුද්‍රණය, 1989/1991.
- සහස්සවත්ථුප්පකරණය, සංස්: පියරතන හිමි, වැගම.: ගොඩගේ, 1999.
- රසවාහිනී, ගුණරතන, සංස්, කොළඹ, 1968.
- පාලි සංග්‍රහය, කරුණාරත්න, අශෝක.: ගුණසේන, කොළඹ, 1964.

## 18. ඒකකය - අනිර්දිෂ්ට පද්‍ය පාඨ - අර්ථාවබෝධය

**නිපුණතාව**

5.0 ගද්‍ය පද්‍ය පාඨ කියවා අර්ථය අවබෝධ කර ගනියි.

**නිපුණතා මට්ටම**

5.2 පාලි පද්‍ය පාඨ කියවා අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.

**කාලච්ඡේද 05 යි.**

**ඉගෙනුම් පල**

- තෝරාගත් පාලි පද්‍ය පාඨ නිවැරදි ව කියවයි.
- උද්ධෘත ගාථාවල උක්ත ආඛ්‍යාත පද වෙන් වෙන් ව ලියයි.
- ගාථාවල අන්වය ලියා දක්වයි.
- අංකිත පදවල ව්‍යාකරණ විභාග දක්වයි.
- තෝරාගත් ගාථාවල නිවැරදි අදහස මාධ්‍ය භාෂාවට පරිවර්තනය කරයි.
- ගාථා ඇසුරෙන් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය යටතේ දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- තෝරාගත් පාලි පද්‍ය පාඨ නිවැරදි ව කියවිය යුතු බව
- ගාථා පාඨවල උක්ත ආඛ්‍යාත පද වෙන් වෙන් ව ලිවිය යුතු බව.
- ගාථාවල අන්වය ලියා දැක්විය යුතු බව.
- පදවල ව්‍යාකරණ විභාග දැක්විය යුතු බව.
- තෝරාගත් ගාථාවල නිවැරදි අදහස මාධ්‍ය භාෂාවට පරිවර්තනය කළ යුතු බව.
- පාලි ගාථා ඇසුරෙන් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය හැකි බව.

  නිද :- ''ඔවදෙය්‍යානුසාසෙය්‍ය - අසබ්භා ච නිවාරයෙ
  සතං හි සො පියො හොති - අසතං හොති අප්පියො'' (ධම්මපදට්ඨකථා)

- ඉහත ගාථාව සඳහන් වන වර්ගය නම් කරන්න.
- මේ ගාථාව දේශනා කළේ ඡබ්බග්ගිය භික්ෂූන්ගෙන් කවර භික්ෂූන් දෙනමට ද?
- එම භික්ෂූන් දෙනම වාසය කළ ප්‍රදේශය නම් කරන්න.
- ගාථාවෙහි සඳහන් වන උපසර්ග දෙකක් උපුටා දක්වන්න.
- ගාථාව දේශනා කිරීමට හේතු වූ භික්ෂූන් වහන්සේලා දෙනම කළ වැරදි දෙකක් ලියන්න.
- ගාථාවේ සඳහන් සත්තමී ආඛ්‍යාත විභක්ති පද උපුටා දක්වන්න.
- බුදු රජාණන් වහන්සේ මේ ගාථාව දේශනා කළේ කවර ස්ථානයක දී ද?
- 'ඔවදෙය්‍ය' යන පදයේ ධාතුව හා ප්‍රත්‍යයය වෙන් කර දක්වන්න.

**තක්සේරුව හා ඇගයීම**

- සම්පූර්ණ පෙළ සමස්ත අර්ථය තේරුම් ගැනීමට පියවර කිහිපයක් යටතේ කියවයි.
- ක්‍රියාකාරක පද සම්බන්ධය තේරුම් ගනිමින් කියවයි.
- උක්ත ආඛ්‍යාත සම්බන්ධය අනුව ඒවායේ ඇති නාම හා ආඛ්‍යාත පද වෙන් කර ලියයි.
- රීත්‍යනුකූල ව පරිවර්තන කාර්යයේ යෙදෙයි.
- පද්‍ය පාඨය ඇසුරෙන් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.
- අංකිත පද වල ව්‍යාකරණ විභාග දක්වයි.

**ගුණාත්මක යෙදවුම්**

- ධම්මපදට්ඨකථා, රතනසාර හිමි, කහවේ.: හේවාවිතාරණ මුද්‍රණය, 1989/1991.
- සහස්සවත්ථුප්පකරණ, සංස්: පියරතන හිමි, වැගම.: ගොඩගේ, 1999.
- රසවාහිනී, ගුණරතන, සංස්, කොළඹ, 1968.

## 19. ඒකකය - සාරධර්ම චරිතායනය - ධම්මපදය

**නිපුණතාව**

6.0 පාලි භාෂා සාහිත්‍යයෙහි අන්තර්ගත සාරධර්ම චර්යාවෙන් ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම**

6.1 පාලි සාහිත්‍යාගත සාරධර්ම පිළිබඳ අවබෝධය ලබා ගැනීම සඳහා කියවයි.

6.2 භාෂා සාහිත්‍යාගත සාරධර්මවල සමාජ-සංස්කෘතික උපයෝගිතාව අවබෝධ කර ගනියි.

**කාලච්ඡේද 08 යි.**

**ඉගෙනුම් පල**

- නිර්දිෂ්ට ධම්මපද ගාථා කියවා ඒවායේ එන සාරධර්ම නම් කරයි.
- පණ්ඩිත වර්ගයේ එන ධර්මෝපදේශ අනුව තම ජීවන ප්‍රතිපදාව සකසා ගනියි.
- පාපමිත්‍ර ඇසුර දුරු කොට කල්‍යාණ මිත්‍ර ඇසුර ලබයි.
- පණ්ඩිත ආශ්‍රය උභයාර්ථ සාධනය කරන බව පිළිගෙන කටයුතු කරයි.
- ආත්ම දමනයේ වැදගත්කම වටහාගෙන ගැටලු විසඳීමට කටයුතු කරයි.
- පරාර්ථ චර්යාවේ වටිනාකම තේරුම් ගෙන සුභසාධන කටයුතුවල නියැළෙයි.
- ලාභ - අලාභාදිය මැදහත් සිතින් විඳ දරාගෙන ඉවසීමෙන් කටයුතු කරයි.
- චරිත සංවර්ධනයෙහි ලා පණ්ඩිත වර්ගයේ උපයෝගිතාව පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය යටතේ දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- වරද පෙන්වන්නා නිධානයක් පෙන්වන්නකු මෙන් සිතිය යුතු බව
- උභයාර්ථ සංසිද්ධිය පිණිස කල්‍යාණ මිත්‍රත්වය හේතු වන බව පිළිගෙන ක්‍රියා කළ යුතු බව
- ධර්මයෙහි හැසිරීම, ඉවසීම හා නින්දා ප්‍රශංසාදියෙහි අකම්ප්‍ය ගුණය (හිත වික්ෂිප්ත කර නොගෙන පහන් සිතින් විසීම) උගත් බුද්ධිමත් අයගේ චරිත ලක්ෂණ බව
- ආත්ම දමනය කරගැනීම උසස් පුද්ගල ලක්ෂණයක් බව
- ආත්මාර්ථය සඳහා හෝ පරාර්ථය සඳහා හෝ පව් නොකළ යුතු බව
- නුවණැත්තා සැම විට ම, සියලු ආකාරයෙන් ම පව් දුරු කොට කුසල් දහම් වඩන බව

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමය**

- පණ්ඩිත වර්ගයේ එන ධර්මෝපදේශ සංග්‍රහයක් සකස් කිරීම
- අටුවාවෙහි දැක්වෙන කථා ඇසුරෙන් ආදර්ශ පාඨ, චිත්‍ර ප්‍රදර්ශනය කිරීම
- මිත්‍රත්වයේ වටිනාකම තහවුරු කිරීමට මඟ පෙන්වීම් සිදු කරන කණ්ඩායම් බිහි කිරීම
- පරාර්ථචර්යාවේ වටිනාකම තේරුම් ගෙන දන්සල් පැවැත්වීම හා ලේ දන් දීම වැනි සුභසාධන කටයුතු සංවිධානය කිරීම

- ලාභ - අලාභ, නින්දා - ප්‍රශංසා ආදිය මැදහත් සිතින් විඳ දරා ගැනීමේ වැදගත්කම පිළිබඳ කථා පැවැත්වීම
- ධර්මයෙන් බැහැර වීමේ දුර්විපාක දක්වෙන පුවත් ප්‍රදර්ශනය කිරීම
- පණ්ඩිත වර්ගය ඇසුරෙන් ධර්ම දේශනා මාලාවක් සංවිධානය කිරීම
- පාපී කටයුතු නිග්‍රහයට ලක් කිරීම
- යහපත් කටයුතු සඳහා උපස්තම්භනය කිරීම

**තක්සේරුව හා ඇගයීම**

- ධම්මපදයේ එන ආදර්ශ පාඨ හා චිත්‍ර ප්‍රදර්ශනය කරයි.
- පණ්ඩිත ලක්ෂණ දක්වෙන පුවරුවක් සකස් කර ප්‍රදර්ශනය කරයි.
- ධම්මපද ගාථා ස්මරණයෙන් කියයි.
- පණ්ඩිත වර්ගයේ එන ධර්මෝපදේශ සංග්‍රහයක් සකස් කරයි.
- අටලෝ දහමෙන් කම්පා නොවීමේ වැදගත්කම ප්‍රකට කරමින් කථාවක් පවත්වයි.

**ගුණාත්මක යෙදවුම්**

- ධම්මපද
- සකස් කළ චිත්‍ර හා ආදර්ශ පාඨ සහිත පුවරු

**වැඩිදුර ගවේෂණය**

- ධම්මපදට්ඨකථා, රතනසාර හිමි, කහවේ.: හේවාවිතාරණ මුද්‍රණය, 1989/1991.
- ධම්මපද සංයුක්ත තැටිය

## 20. ඒකකය - සාරධර්ම චරිතායනය - සිගාලකසුත්ත

**නිපුණතාව**

6.0 පාලි භාෂා සාහිත්‍යයෙහි අන්තර්ගත සාරධර්ම චර්යාවෙන් ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම**

6.1 පාලි සාහිත්‍යාගත සාරධර්ම පිළිබඳ අවබෝධය ලබා ගැනීම සඳහා කියවයි.

6.2 භාෂා සාහිත්‍යාගත සාරධර්මවල සමාජ සංස්කෘතික උපයෝගිතාව අවබෝධ කර ගනියි.

**කාලච්ඡේද 8 යි.**

**ඉගෙනුම් පල**

- සුත්‍රාගත සාරධර්ම නම් කරයි.
- එකී සාරධර්ම අනුව තම ජීවන ප්‍රතිපදාව සකසා ගනියි.
- සුදුසු මිත්‍රයන් තෝරාගෙන ඇසුරු කරයි.
- භෝග විනාශ මුඛ දුරුකර සරල අල්පේච්ඡ ජීවිතයට හුරු වෙයි.
- එකිනෙකාගේ වගකිම් තේරුම් ගෙන යුතුකම් ඉටු කරමින් සහජීවන ප්‍රතිපදාව ප්‍රගුණ කරයි.
- අගතිගාමී බව දුරු කර සාධාරණ හා යුක්තිගරුක පුරවැසියකු බවට පත්වෙයි.
- සාරධර්ම සමාජගත කිරීම අරමුණු කොට ධර්ම දේශනා, චිත්‍ර ප්‍රදර්ශනය, පිරිත් දේශනය, සීල සමාදානය භාවනා පුහුණුව වැනි කාර්යයන්හි යෙදෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය යටතේ දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- අගතිගාමී වීම නිසා අවපක්ෂයෙහි චන්ද්‍රයා මෙන් පුද්ගලයා පිරිහෙන බව
- පංචසීලය ආරක්ෂා කිරීමෙන් සමාජය ආරක්ෂිත ස්ථානයක් වන බව
- ප්‍රාණඝාතයෙන් වැළකීම නිසා ජීවිත රක්ෂණය ද,
  අදත්තාදානයෙන් වැළකීම නිසා දේපළ රක්ෂණය ද,
  කාමමිථ්‍යාචාරයෙන් වැළකීම නිසා යුගදිවි රක්ෂණය ද,
  මුසාවාදයෙන් වැළකීම නිසා සන්නිවේදන සත්‍යතාව ද,
  සුරාපානයෙන් වැළකීම නිසා කායික හා මානසික ස්වස්ථතා රක්ෂණය ද ඇති වන බව
- භෝග විනාශ මුඛ අවබෝධ කරගෙන ඒවා ස්වකීය චරිතයෙන් ඈත් කළ යුතු බව
- මිත්‍රත්වය ආත්ම දමනයටත් සමාජ ශුභසිද්ධියටත්, ඉවහල් වන බව තේරුම් ගෙන යහපත් මිතුරන් ඇසුරු කළ යුතු බව
- එකිනෙකාගේ වගකිම හා යුතුකම සමාජ සංස්ථාවන්හි පැවැත්මට සාපේක්ෂ බව
- සිගාලක සුත්‍රයේ ඉගැන්වෙන සදිසාව සමාජය අර්ථවත් කරවන ක්‍රමයක් ලෙස හඳුන්වා දිය යුතු බව

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමය**

- සුත්‍රය කියවා එහි එන යහපත් සමාජ ධර්ම නම් කිරීම
- පාපමිත්‍රයන්ගේ හා කල්‍යාණ මිත්‍රයන්ගේ ලක්ෂණ දක්වෙන පුවරුවක් සකස් කර ප්‍රදර්ශනය කිරීම

- භෝග විනාශ මුඛයන් දුරු කිරීමට ඒවායේ දුර්විපාක දක්වෙන ප්‍රදර්ශනයක් සංවිධානය කිරීම.
- එකිනෙකාගේ යුතුකම් හා වගකීම් දක්වෙන වගුගත පුවරුවක් සකස් කිරීම.
- සූත්‍රයේ ඇතුළත් කරුණු එකිනෙක තෝරාගෙන ධර්මදේශනා මාලාවක් සංවිධානය කිරීම.
- සූත්‍රයේ ඉගැන්වෙන උපදේශ ආදර්ශ පාඨ ලෙස සකස් කර ප්‍රදර්ශනය කිරීම.

**තක්සේරුව හා ඇගයීම**

- සූත්‍රයේ සාරාංශයක් පිළියෙළ කරයි.
- ධර්ම දේශනා හා විවාද සංවිධානය කරයි.
- ප්‍රදර්ශනයක් සංවිධානය කරයි.
- යුතුකම් හා වගකීම් වගුගත කොට දක්වයි.
- අගතිගාමී බවෙහි දුර්විපාක පෙන්වා දෙමින් කථා කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- සිගාලක සූත්‍රය
- සකස් කළ චිත්‍ර හා ප්‍රවෘත්ති පුවරු

**වැඩි දුර ගවේෂණය**

- සුමංගල විලාසිනී (ද්විතීය භාගය), රේවත හිමි, බෝරුග්ගමුවේ.: හේවාවිතරණ මුද්‍රණය, 1992, කොළඹ.

## 21. ඒකකය - සාරධර්ම චරිතායනය - මහාසුපින ජාතක

**නිපුණතාව**

6.0 පාලි සාහිත්‍යයෙහි අන්තර්ගත සාරධර්ම චර්යාවෙන් ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම**

6.1 පාලි සාහිත්‍යාගත සාරධර්ම පිළිබඳ අවබෝධය ලබා ගැනීම සඳහා කියවයි.

6.2 භාෂා සාහිත්‍යාගත සාරධර්මවල සමාජ සංස්කෘතික උපයෝගිතාව අවබෝධ කර ගනියි.

**කාලච්ඡේද 09 යි.**

**ඉගෙනුම් පල**

- මහාසුපින ජාතකය කියවා එහි එන සාරධර්ම හා උපදේශ නම් කරයි.
- මවුපිය වැඩිහිටියන්ට සැලකීම වගකීමක් සේ සලකා කටයුතු කරයි.
- පරිසරය සුරක්ෂිත කර ගැනීමට රුක් රෝපණ ආදි කටයුතු කරයි.
- අල්ලස් දීම හා ගැනීම සමාජ දූෂණ ක්‍රියාවක් සේ සලකා ඒවායෙන් ඉවත් වෙයි.
- යුතුකම හා වගකීම වගවීමක් සේ සලකා කටයුතු කරයි.
- තමා කෙරෙහිත් අනුන් කෙරෙහිත් වගකීමක් ඇති ව එකිනෙකාගේ වටිනාකම්වලට ගරු කිරීමට පුහුණු වෙයි.
- පුද්ගල විෂමචාර ක්‍රියා ජීවි - අජීවි පරිසරයට බලපාන බව ප්‍රකාශ කරයි.
- සාරධර්ම අනුව කටයුතු කිරීම යාවජීව ක්‍රියාවලියක් බව පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය යටතේ දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- මහාසුපින ජාතකයේ සිහින 16 නම් කළ යුතු බව
- සිහින 16 විවරණය කළ යුතු බව
- රජවරුන් අධර්මිෂ්ඨ වන විට පොදු ජන සමාජය ද අධර්මිෂ්ඨ වන බව
- පොදු ජන සමාජය අධර්මිෂ්ඨ වන විට ස්වාභාවික සම්පත් නිසි පරිදි නො ලැබෙන බව
- වෘද්ධාපචායනය උතුම් ගුණධර්මයක් බව
- සුදුස්සා සුදුසු තනතුරෙහි පිහිටුවීම සමාජ සුභසාධනයට ඉවහල් වන බව
- යුක්තිය පසිඳලන්නන් අල්ලස් ගැනීමෙන් සමාජ සාධාරණය බිඳ වැටෙන බව
- අයබදු ගැනීම බඹරුන් රොන් ගන්නා සේ කළ යුතු බව
- පැවිදි පිරිස් මිල මුදල් අපේක්ෂාවෙන් කටයුතු කිරීම සමාජය පිරිහීමට හේතු වන බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- මහාසුපින ජාතකයේ සිහින 16 නම් කිරීම හා එහි අර්ථය විවරණය කිරීම
- සිහින 16 දක්වෙන චිත්‍ර ප්‍රදර්ශන හා තොරණ ප්‍රදර්ශන සංවිධානය කිරීම
- මහාසුපින ජාතකයෙන් සකස් වූ කවි බණ හා විරිදු බණ ආදිය රැස් කොට ඒවා අසන්නට සැලැස්වීම
- මහාසුපින ජාතකයෙන් ධර්ම දේශනා හා කථා පැවැත්වීම

- නූතන සමාජයෙහි මෙම සිහිනයන් උද්දීපනය වන අවස්ථා දක්වෙන පුවත් පත් තොරතුරු රැස් කිරීම හා ප්‍රදර්ශනය කිරීම.
- මහාසුපින ජාතකය ඇසුරෙන් විවාද හා ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් ඉදිරිපත් කිරීම.

**තක්සේරුව හා ඇගයීම**

- සිහින 16 මතකයෙන් කියයි.
- සිහින 16 දක්වෙන චිත්‍ර 16ක් අඳියි.
- මහාසුපින ජාතකයෙන් ධර්ම දේශනා, කථා හා විවාද සංවිධානය කරයි.
- පුද්ගල විෂමචාර ක්‍රියාවලින් බැහැර වෙයි.

**ගුණාත්මක යෙදවුම්**

- ජාතකට්ඨකතා, පියතිස්ස හිමි, විදුරුපොළ.: හේවාවිතාරණ මුද්‍රණය, 1988/1990.
- සිංහල ජාතක පොත I, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, 2005.
- සකස් කළ චිත්‍ර හා කවිබණ ශ්‍රව්‍ය, දෘශ්‍ය සංයුක්ත තැටි

**වැඩි දුර ගවේෂණය**

- අන්තර්ජාලය

## 22. ඒකකය - සාහිත්‍ය රසාස්වාදනය - i

**නිපුණතාව**

7.0 පාලි සාහිත්‍ය රසාස්වාදයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම**

7.1 නිර්දිෂ්ට පාලි ගද්‍ය පද්‍ය පාඨයන්හි අන්තර්ගත කාව්‍යෝක්ති හඳුනාගෙන ලියා දක්වයි.

කාලච්ඡේද 8 යි.

**ඉගෙනුම් පල**

- පාලි සාහිත්‍යය තුළ ජාතකට්ඨකථාවේ සුවිශේෂතාව හඳුන්වයි.
- මහා සුපින ජාතකයේ වර්තමාන හා අතීත කථා සාරාංශ කරයි.
- මහා සුපින ජාතකයේ උපමා රූපකාදි අලංකාර යෙදුම් උද්ධෘත කර ලියයි.
- භාෂාව මඟින් අවස්ථා හා සිද්ධි නිරූපණය පැහැදිලි කරයි.
- ධම්මපදයේ සාහිත්‍යමය වටිනාකම පෙන්වා දෙයි.
- පණ්ඩිත වර්ගයේ එන උපමා රූපකාදි අලංකාර ප්‍රයෝග උද්ධෘත කොට නම් කරයි.
- ධර්මාර්ථ විශ්ලේෂණයට කාව්‍යමය උපක්‍රම භාවිත කර ඇති අයුරු පැහැදිලි කරයි.
- සිගාලක සූත්‍රයේ ව්‍යූහමය ලක්‍ෂණ හඳුනා ගනියි.
- සිගාලක සූත්‍රයේ ඇතුළත් උපමාදි අලංකාර ප්‍රයෝග හඳුනාගෙන උපුටා ලියයි.
- ධර්ම මාර්ගය පැහැදිලි කිරීමට කාව්‍ය මාර්ගය උපයෝගි කරගෙන ඇති අයුරු පෙන්වා දෙයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස්**

යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේදී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්‍ෂිප්තය**

- මහාසුපින ජාතකය සාරාංශ කළ යුතු බව
- මහාසුපින ජාතකයේ ව්‍යූහය හඳුනාගත යුතු බව
- මහාසුපින ජාතකයේ සිහින 16 අර්ථ සහිත ව අවබෝධ කර ගත යුතු බව
- මහාසුපින ජාතකයේ එන උපමා රූපකාදි අලංකාර යෙදුම් උද්ධෘත කොට ලිවිය යුතු බව
- අවස්ථා හා සිද්ධි නිරූපණය විස්තර කළ යුතු බව
- විවිධ භාෂා ප්‍රයෝග හා සාහිත්‍යාත්මක යෙදුම් ස්මරණයෙන් කිව යුතු බව
- පණ්ඩිත වර්ගයේ ගාථා ස්මරණයෙන් කිව යුතු බව
- උපමා රූපකාදිය දැක්වෙන ගාථා උද්ධෘත කොට අදාළ අලංකාර නම් කළ යුතු බව
- ධර්මාර්ථ විශ්ලේෂණයට කාව්‍යමය උපක්‍රම භාවිත කර ඇති අයුරු විමර්ශනය කළ යුතු බව
- ධර්මාර්ථ පැහැදිලි කිරීමේදී කාව්‍යමාර්ගය උපයෝගි කරගෙන ඇති අයුරු පෙන්වා දිය යුතු බව
- සිගාලක සූත්‍රයේ සාහිත්‍යමය වැදගත්කම සාකච්ඡා කළ යුතු බව
- සිගාලක සූත්‍රයේ සමාජ විද්‍යාත්මක යථාර්ථය සාකච්ඡා කළ යුතු බව
- සිගාලක සූත්‍රයේ උපමා ආදි අලංකාර ප්‍රයෝග උද්ධෘත කොට දක්විය යුතු බව

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමය**

- මහාසුපින ජාතකය සාරාංශය කිරීම හා ලිවීම
- මහාසුපින ජාතකයේ ව්‍යූහමය ලක්‍ෂණ ලියා දැක්වීම
- සිහින 16 දැක්වෙන කවි බණ, විරිදු හෝ චිත්‍ර හෝ පන්තියට ඉදිරිපත් කිරීම
- උපමා රූපකාදි අලංකාර යෙදුම් උද්ධෘත කොට දක්වා ඒවා නම් කිරීම
- ධ්වනි, සංකේත හා වාක් ප්‍රයෝග යනාදිය මතකයෙන් කීම

- පණ්ඩිත වර්ගයේ ගාථා ස්මරණයෙන් කීම
- පණ්ඩිත වර්ගයේ උපමා රූපකාදි කාව්‍ය ප්‍රයෝග උද්ධෘත කොට නම් කිරීම
- දීඝනිකායේ සිගාල සූත්‍රයේ සාරය ලිවීම.
- සිගාලක සූත්‍රයේ සාහිත්‍යමය ලක්ෂණ දක්වෙන අවස්ථා උද්ධෘත කොට ලිවීම

**තක්සේරුව හා ඇගයීම**

- මහාසුපින ජාතකයේ එන කාව්‍ය ප්‍රයෝග උද්ධෘත කොට දක්වා නම් කරයි.
- මහාසුපින ජාතකයේ භාෂා ලක්ෂණ විමර්ශනය කරයි.
- මහාසුපින ජාතකයේ එන චරිත විවරණය කරයි.
- ධම්මපදයේ පණ්ඩිත වර්ගයේ එන උපමාදි ප්‍රයෝග උද්ධෘත කොට නම් කරයි.
- ධ්වනි පූර්ණ ගාථා මතකයෙන් කියයි.
- ධම්මපදයේ ගාථා හා කථා ආශ්‍රයයෙන් නව නිර්මාණ කරයි.
- සිගාල සූත්‍රයේ ව්‍යූහය පිළිබඳ සටහනක් ලියයි.
- මිත්‍රයන්ගේ චරිත ලක්ෂණ නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- සිගාලක සූත්‍රයේ එන උපමාදි අලංකාර ප්‍රයෝග උද්ධෘත කොට නම් කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට ගද්‍ය හා පද්‍ය පාඨ
- නිර්දිෂ්ට කොටස් සඳහා ලියවී ඇති කෘති හා ශ්‍රව්‍ය සහ දෘශ්‍ය සංයුක්ත තැටි

**වැඩි දුර ගවේෂණය**

- සෞන්දර්ය පිළිබඳ බෞද්ධ ආකල්පය, පියරතන හිමි වැගම.: තරංජී ප්‍රින්ට්ස්, මහරගම, 2010.

# 23. ඒකකය - සාහිත්‍ය රසාස්වාදනය - ii

**නිපුණතාව**

7.0 පාලි සාහිත්‍යය රසාස්වාදනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම**

7.2 ගද්‍ය පද්‍ය පාඨයන්හි අන්තර්ගත කාව්‍යෝක්ති රසවින්දනයට හා ඇගයීමට පුහුණු වෙයි.

**කාලච්ඡේද 7 යි.**

**ඉගෙනුම් පල**

- මහාසුපින ජාතකයේ සන්දර්භය අවබෝධ කර ගනියි.
- ඓතිහාසික, සමාජ විද්‍යාත්මක හා දේශපාලනික පසුබිම විවරණය කරයි.
- පුද්ගල ගති ලක්ෂණ හඳුනාගෙන ඒවා මතු කොට දක්වයි.
- අවස්ථා හා සිද්ධි නිරූපණය කර ඇති ආකාරය පෙන්වා දෙයි.
- උපමා රූපකාදි අලංකාර විශ්ලේෂණය කරයි.
- විවිධ රසභාව හඳුනාගෙන ඒවා විශ්ලේෂණය කරයි.
- ධම්මපදයේ ගාථාවන්හි අනුප්‍රාසාදිය තේරුම් ගෙන ශබ්දරසය විමර්ශනය කරයි.
- කාව්‍ය රසය හා ධර්ම රසය තුලනාත්මක ව පැහැදිලි කරයි.
- සිගාලක සූත්‍රයේ ධර්මාර්ථ විශ්ලේෂණය කරයි.
- අර්ථ පූර්ණ යෙදුම්, වක්‍රෝක්ති ආදි කාව්‍යෝපක්‍රම විමර්ශනය කරයි.
- කාව්‍යමය හා සාහිත්‍යමය ලක්ෂණ විමර්ශනය කරමින් විචාරාත්මක ලේඛනයේ යෙදෙයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස්**

යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය යටතේ දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- මහාසුපින ජාතකයේ ව්‍යූහය හා සන්දර්භය අවබෝධ කර ගත යුතු බව
- මහා සුපින ජාතකයේ අන්තර්ගතයත්, සමාජ විද්‍යාත්මක, මනෝවිද්‍යාත්මක හා දේශපාලනික යථාර්ථයත් හෙළි කර ගත යුතු බව
- පුද්ගල ගති ලක්ෂණ සාමාජය කෙරෙහි ප්‍රතිචාර දක්වන ආකාරය විවරණය කළ යුතු බව
- උපමාදි අලංකාර භාවිතය හඳුනාගත යුතු බව
- ශෘංගාරාදි රස හඳුනාගත යුතු බව
- ධ්වනිපූර්ණ කාව්‍යප්‍රයෝග හඳුනාගත යුතු බව
- ධම්මපදයේ ගාථාවන්හි ශබ්දානුප්‍රාස විවරණය කළ යුතු බව
- ගාථාවන්හි අර්ථ රසය මඟින් ධර්ම රසය මතු වන ආකාරය විවරණය කළ යුතු බව
- අභියෝගවලට ප්‍රතිචාර දැක්වීමට සාහිත්‍යමය විඥානය තියුණු කරගත යුතු බව
- සිගාලක සූත්‍රයේ ව්‍යූහය හා සන්දර්භය අවබෝධ කර ගත යුතු බව
- පුද්ගල චරිත ලක්ෂණ හඳුනා ගැනීමෙන් ඉස්මතු වන සාහිත්‍යමය රසය විමර්ශනය කළ යුතු බව
- සූත්‍ර ධර්මයන්හි එන අර්ථපූර්ණ යෙදුම් වක්‍රෝක්ති ආදියෙන් මතු වන රසභාවයන් හඳුනාගත යුතු බව
- පුද්ගල පෞරුෂ සංවර්ධනයට සාහිත්‍යමය විචාරය හා රසාස්වාදය ඉවහල් වන බව

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමය**

- මහාසුපින ජාතකයේ ව්‍යූහය හා සන්දර්භය පිළිබඳ හැඳින්වීමක් කිරීම
- සාහිත්‍ය රසය පිළිබඳ හැඳින්වීමක් කිරීම
- මහාසුපින ජාතකයේ අන්තර්ගතයෙන් හෙළි වන සමාජ විද්‍යාත්මක හා දේශපාලනික යථාර්ථය සිසුන් සමඟ සාකච්ඡා කිරීම

- මහාසුපින ජාතකය උපයෝගි කරගෙන බිහි වී ඇති සාහිත්‍ය නිර්මාණ (කවි බණ හා කාව්‍ය ආදිය) පිළිබඳ ව විමර්ශනය කිරීම
- ජාතක කථාවල අවස්ථා හා සිද්ධි නිරූපණය කර ඇති ආකාරය සාකච්ඡා කිරීම
- ජාතක කථා වස්තු බීජ කොට සරල නිර්මාණ ඉදිරිපත් කිරීමට උනන්දු කරවීම
- ජාතකකථාකරු භාෂාව භාවිත කර ඇති ආකාරය සාකච්ඡා කිරීම
- ධම්මපදයේ ඇති පද්‍යයන්හි ආකෘතිය පිළිබඳ අවබෝධයක් ලබා දීම
- උපමා රූපකාදි අලංකාර හඳුනාගැනීමට මඟ පෙන්වීම
- කාව්‍ය රසය හා ධර්ම රසය විඳගත හැකි ආකාරය පැහැදිලි කිරීම
- ගාථා හා කාථා වස්තු අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාව විමර්ශනය කොට රස වින්දනයට පෙලඹවීම
- ධම්මපදය ඇසුරෙන් බිහි වී ඇති සාහිත්‍යමය නිර්මාණ ඇගයීම
- සිගාලක සූත්‍රයෙහි කාව්‍යෝක්ති උද්ධෘත කොට ඒවායේ කාව්‍යාර්ථය පැහැදිලි කිරීම
- සූත්‍ර ධර්මයන්හි පුද්ගල චරිත ප්‍රකට වන ආකාරය සාකච්ඡා කිරීම
- සාහිත්‍යමය විචාරය පුහුණු කිරීම

**තක්සේරුව හා ඇගයීම**

- මහාසුපින ජාතකයේ සාරාංශය ලියයි.
- මහාසුපින ජාතකය ඇසුරෙන් සංවාදයක් ලියයි.
- උපමා රූපකාදිය උද්ධෘත කොට ඒවායේ යථායෝග්‍ය බව පෙන්නුම් කරයි.
- ධම්මපදයේ උපමා රූපකාදිය සහිත ගාථා ස්මරණයෙන් කියයි.
- සිගාලක සූත්‍රයේ එන කාව්‍ය ප්‍රයෝග උද්ධෘත කොට දක්වයි.
- අවස්ථා හා සිද්ධි නිරූපණය සඳහා භාෂාව උපයෝගි කරගෙන ඇති ආකාරය පෙන්වා දෙයි.
- අන්තර්ගත සංසිද්ධි සිතුවමට හෝ කවියට හෝ නඟයි.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ
- ජාතකට්ඨකථා
- ජාතක කථා විමසුම - මාර්ටින් වික්‍රමසිංහ

**වැඩි දුර ගවේෂණය**


- සෞන්දර්ය පිළිබඳ බෞද්ධ ආකල්පය, පියරතන හිමි වෑගම.: තරංජී ප්‍රින්ට්ස්, මහරගම, 2010.
- ධම්මපද විචාරය, ධම්මානන්ද හිමි, මකුරුප්පේ.: සංඛ මුද්‍රණාලය, මරදාන, 1989.
- සුබෝධාලංකාරය, ලංකානන්ද හිමි, ලබුගම.: විද්‍යාශේඛර මුද්‍රණාලය, හොරණ, 1937.

## 24. ඒකකය - පාලි සාහිත්‍යාගත බෞද්ධ සංස්කෘතිය - ආචාර සමාචාර ධර්ම

**නිපුණතාව**

8. 0 පාලි සාහිත්‍යාගත බෞද්ධ සංස්කෘතිය වටහාගෙන එය සමාජ සහජීවනය ගොඩනගා ගැනීමට උපයෝගී කර ගනියි.

**නිපුණතා මට්ටම**

8. 1 පාලි සාහිත්‍යාගත සුවිශේෂී බෞද්ධ සංකල්ප හඳුනාගෙන ඒවායේ සංස්කෘතික වැදගත්කම හදාරයි.

**කාලච්ඡේද 05 යි.**

**ඉගෙනුම් පල**

- නිර්දිෂ්ට ග්‍රන්ථවල එන ආචාර සමාචාර ධර්ම යටතේ කරුණු එක් රැස් කරයි.
- ආචාර සමාචාර ධර්මයන්හි අගය පෙන්වා දෙයි.
- ආචාර සමාචාර ධර්ම මානව ප්‍රජාවගේ ප්‍රගමනයට ඉවහල් වන ආකාරය විමර්ශනය කරයි
- ආචාර සමාචාර ධර්ම සමාජ සහජීවනය කෙරෙහි හේතු වන ආකාරය සාකච්ඡා කරයි.
- ආචාර සමාචාර ධර්ම බෞද්ධ ශික්ෂණ ක්‍රමවේදයක් බව පිළිගෙන කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය යටතේ දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ආචාර සමාචාර ධර්ම හැඳින ගැනිම පිණිස සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය කළ යුතු බව.
- ආචාර සමාචාර ධර්ම කරුණු වශයෙන් එක් රැස් කළ හැකි බව.
- නිර්දිෂ්ට ග්‍රන්ථවල සඳහන් ආචාර සමාචාර ධර්මයන්හි අගය සාකච්ඡා කළ යුතු බව.
- ආචාර සමාචාර ධර්ම මානව ප්‍රජාවගේ ප්‍රගමනයට ඉවහල් වන ආකාරය විමර්ශනය කළ යුතු බව.
- ආචාර සමාචාර ධර්ම සමාජ සහජීවනය උදෙසා හේතු වන ආකාරය සාකච්ඡා කළ යුතු බව.
- බෞද්ධ ආචාර සමාචාර ධර්ම නිර්වාණගාමී ප්‍රතිපදාවේ මූලික අවශ්‍යතාවක් බව.

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමය**

- ආචාර සමාචාර ධර්ම කරුණු වශයෙන් එක් රැස් කරවීම
- නිර්දිෂ්ට ග්‍රන්ථවල සඳහන් වන ආචාර සමාචාර අගය සාකච්ඡා කිරීම
- ආචාර සමාචාර ධර්ම මානව ප්‍රජාවගේ ප්‍රගමනයට ඉවහල් වන ආකාරය පෙන්වා දීම
- ආචාර සමාචාර ධර්ම සමාජ සහජීවනය උදෙසා හේතු වන ආකාරය සාකච්ඡා කිරීම
- බෞද්ධ ආචාර සමාචාර ධර්ම නිර්වාණගාමී ප්‍රතිපදාවේ මූලික අවශ්‍යතාවක් බව පෙන්වා දීම

**තක්සේරුව හා ඇගයීම**

- ආචාර සමාචාර ධර්ම පිළිබඳ ඇගයීමක් කරයි.
- සිගාලක සූත්‍රයෙහි සඳහන් වන යුතුකම් හා වගකීම් පෙන්වා දීම සඳහා රූප සටහනක් සකස් කරයි.
- පාලි සාහිත්‍යාගත ආචාර සමාචාර ධර්ම බෞද්ධ සමාජයේ මුල් බැස ගෙන ඇති අයුරු සාකච්ඡා කරයි.

- බෞද්ධ ආචාර සමාචාර සංකල්පය ඇසුරෙන් ගොඩනැගුණු සමාජ සංස්ථා පෙන්වා දෙයි.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට ග්‍රන්ථ
- ධම්මපදට්ඨකථා, රතනසාර හිමි, කහවේ.: හේවාවිතාරණ මුද්‍රණය, 1989/1991.
- සුමංගල විලාසිනී (ද්විතීය භාගය), රේවත හිමි, බෝරුගේගමුවේ.: හේවාවිතාරණ මුද්‍රණය, 1992, කොළඹ.

**වැඩි දුර ගවේෂණය**

- හෙළ හැදියාව, විමලවංස හිමි බද්දේගම.: සමයවර්ධන, කොළඹ, 1996.

## 25. ඒකකය - පාලි සාහිත්‍යාගත බෞද්ධ සංස්කෘතිය - සත්පුරුෂ හා පණ්ඩිත ලක්ෂණ

**නිපුණතාව**

8.0 පාලි සාහිත්‍යාගත බෞද්ධ සංස්කෘතිය වටහාගෙන එය සමාජ සහජීවනය ගොඩනගා ගැනීමට උපයෝගී කර ගනියි.

**නිපුණතා මට්ටම**

8.1 පාලි සාහිත්‍යාගත සුවිශේෂ බෞද්ධ සංකල්ප හඳුනාගෙන ඒවායේ සංස්කෘතික වැදගත්කම හදාරයි.

**කාලච්ඡේද 05 යි.**

**ඉගෙනුම් පල**

- සත්පුරුෂ සහ පණ්ඩිත ගති ලක්ෂණ පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම පිණිස සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය කරයි.
- සත්පුරුෂ සහ පණ්ඩිත ගති ලක්ෂණ කරුණු වශයෙන් එක් රැස් කරයි.
- බාල සහ පණ්ඩිත ලක්ෂණ වෙන් වෙන් වශයෙන් වගු ගත කර දක්වයි.
- සත්පුරුෂ සහ පණ්ඩිත ක්‍රියාකාරකම් මානව ප්‍රජාවගේ ප්‍රගමනයට ඉවහල් වන ආකාරය විමර්ශනය කරයි.
- සත්පුරුෂ සහ පණ්ඩිත පුද්ගලයන් සමාජ සහජීවනය උදෙසා ක්‍රියා කරන ආකාරය පෙන්වා දෙයි.
- බෞද්ධ පුරුෂාර්ථ සාධනයට සත්පුරුෂ හා පණ්ඩිත ගති ලක්ෂණ ඉවහල් වන බව පෙන්වා දෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- සත්පුරුෂ සහ පණ්ඩිත ගති ලක්ෂණ පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම පිණිස සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය කළ යුතු බව
- සත්පුරුෂ සහ පණ්ඩිත ගති ලක්ෂණ කරුණු වශයෙන් එක් රැස් කළ යුතු බව
- බාල සහ පණ්ඩිත ලක්ෂණ වෙන් වෙන් වශයෙන් වගු ගත කළ යුතු බව
- සත්පුරුෂ සහ පණ්ඩිත ක්‍රියාකාරකම් මානව ප්‍රජාවගේ ප්‍රගමනයට ඉවහල් වන ආකාරය විමර්ශනය කළ හැකි බව
- සත්පුරුෂ සහ පණ්ඩිත පුද්ගලයන් සමාජ සහජීවනය උදෙසා ක්‍රියා කරන ආකාරය පෙන්වා දිය යුතු බව
- බෞද්ධ පුරුෂාර්ථ සාධනයට සත්පුරුෂ හා පණ්ඩිත ගති ලක්ෂණ ඉවහල් වන බව

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමය**

- ධම්මපදයේ පණ්ඩිත වර්ගය කියවීම හා අර්ථ පැහැදිලි කරදීම
- සත්පුරුෂ සහ පණ්ඩිත ලක්ෂණ කරුණු වශයෙන් එක් රැස් කිරීම
- සප්පුරිස - අසප්පුරිස හා බාල - පණ්ඩිත ලක්ෂණ නිර්වචනය කිරීම
- සත්පුරුෂ සහ පණ්ඩිත ක්‍රියාකාරකම් මානව ප්‍රජාවගේ ප්‍රගමනයට ඉවහල් වන ආකාරය විමර්ශනය කිරීම

- සත්පුරුෂ සහ පණ්ඩිත පුද්ගලයන් සමාජ සහජීවනය උදෙසා ක්‍රියා කරන ආකාරය පෙන්වා දීම
- සත්පුරුෂ සහ පණ්ඩිත ලක්‍ෂණ අධ්‍යයනය කොට ඒවා හඳුනා ගැනීමට අවස්ථාව සලසා දීම
- පණ්ඩිත හා සත්පුරුෂ ලක්ෂණ බෞද්ධ දර්ශනයෙහි වැදගත් සාධක බව ප්‍රකට කරවීම
- නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන් පණ්ඩිතයන්ගේ ක්‍රියාකාරකම් පැහැදිලි කිරීම
- නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන් සත්පුරුෂ හා පණ්ඩිත ක්‍රියාකාරකම් හඳුනා ගැනීමට අවස්ථාව සලසා දීම

**තක්සේරුව හා ඇගයීම**

- බාල - පණ්ඩිත හා සත්පුරුෂ - අසත්පුරුෂ ලක්‍ෂණ පැහැදිලි කරයි.
- පණ්ඩිත හා සත්පුරුෂ බව සුවිශේෂී බෞද්ධ චරිත ලක්‍ෂණ දෙකක් බව පෙන්වා දෙයි.
- පණ්ඩිත හා සත්පුරුෂ ලක්‍ෂණ ඇසුරෙන් ගොඩ නැගුණු බෞද්ධ සමාජ සංස්කෘතිය විමර්ශනය කරයි.
- නූතන සමාජයට පණ්ඩිත හා සත්පුරුෂ ලක්‍ෂණ ප්‍රවේශ කළ හැකි ආකාරය විමසයි.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට ග්‍රන්ථය - ධම්මපද

**වැඩි දුර ගවේෂණය**

- පණ්ඩිතවග්ග අත්ථවණ්ණනා - ධම්මපදට්ඨකථා, රතනසාර හිමි, කහවේ: හේවාවිතාරණ මුද්‍රණය, 1989/1991.

## 26. ඒකකය - පාලි සාහිත්‍යාගත බෞද්ධ සංස්කෘතිය - පඤ්චශීලය, කුසල් සහ අකුසල්

**නිපුණතාව**

8.0 පාලි සාහිත්‍යාගත බෞද්ධ සංස්කෘතිය වටහා ගෙන එය සමාජ සහජීවනය ගොඩනගා ගැනීමට උපයෝගී කර ගනියි.

**නිපුණතා මට්ටම**

8.2 පාලි සාහිත්‍යාගත සුවිශේෂ බෞද්ධ සංකල්ප හඳුනාගෙන ඒවා සමාජ සහජීවනය උදෙසා යොදා ගනියි.

**කාලච්ඡේද 05 යි.**

**ඉගෙනුම් පල**

- පඤ්චශීලය හා එහි නිවැරදි අර්ථ විග්‍රහය දක්වයි.
- කුසල් අකුසල් පිළිබඳ අවබෝධයෙන් ක්‍රියා කරයි.
- නිර්දිෂ්ට ග්‍රන්ථයන්හි සඳහන් කුශලාකුශල ක්‍රියා වෙන් කොට දක්වයි.
- පඤ්චශීලයෙහි සහ කුශල ක්‍රියාවන්හි අගය සාකච්ඡා කරයි.
- සමාජ සහජීවනය උදෙසා පඤ්චශීලයෙහි උපයෝගිතාව පෙන්වා දෙයි.
- බෞද්ධ පරමාදර්ශ සාධනයෙහි ලා කුසල් කිරීමේ ඇති අවශ්‍යතාව පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය යටතේ දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- පඤ්චශීලය හා එහි නිවැරදි අර්ථය විවරණය කළ යුතු බව
- කුසල් අකුසල් පිළිබඳ අවබෝධයෙන් ක්‍රියා කළ යුතු බව
- නිර්දිෂ්ට ග්‍රන්ථයන්හි සඳහන් වන කුශලාකුශල ක්‍රියාවන් වෙන් කොට දැක්විය යුතු බව
- පඤ්චශීලයෙහි සහ කුශලයෙහි අගය සාකච්ඡා කළ යුතු බව
- සමාජ සහජීවනය උදෙසා පඤ්චශීලයෙහි උපයෝගිතාව පෙන්වා දිය යුතු බව
- නිර්වාණාවබෝධය සඳහා කුශලය උපනිඃශ්‍රය වන බව

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමය**

- පඤ්චශීලය නිවැරදි ව උච්චාරණය කිරීම
- පඤ්චශීලය හා එහි අර්ථය නිවැරදි ව ලියා දැක්වීම
- කුසල් අකුසල් පිළිබඳ අවබෝධයෙන් ක්‍රියා කිරීම
- නිර්දිෂ්ට ග්‍රන්ථයන්හි කුසල් අකුසල් පිළිබඳ සඳහන් වන පාඨ කිහිපයක් පෙන්වා දීම
- පඤ්චශීලයෙහි සහ කුශලයෙහි අගය සාකච්ඡා කිරීම
- සමාජ සහජීවනය උදෙසා පඤ්චශීලයෙහි උපයෝගිතාව විමර්ශනය කිරීම
- නිර්වාණයට පූර්වගාමී ප්‍රතිපදාවක් ලෙස කුශල ක්‍රියා උපයෝගී වන බව පෙන්වා දීම

**තක්සේරුව හා ඇගයීම**

- පංචශීලය සමාජ සංවර්ධනයට අදාළ වන ආකාරය සාකච්ඡා කරයි.
- කුසල් අකුසල් වෙන් කොට හඳුන්වයි.
- සමාජ සහජීවනය වෙනුවෙන් කුශල කර්ම යොදාගත හැකි ආකාරය පැහැදිලි කරයි.
- කර්ම විපාක ප්‍රකට වන චිත්‍ර, මූර්ති හා කැටයම් ආදිය ප්‍රදර්ශනය කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට ග්‍රන්ථ

**වැඩිදුර ගවේෂණය**

- සිංහල ජාතක පොත, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, 2008.

## 27. ඒකකය - **පාලි සාහිත්‍යය - 1**

**නිපුණතාව**

9.0 පාලි සාහිත්‍යයේ ව්‍යුහය පිළිබඳ අවබෝධය ලබා ගැනීම සඳහා පාලි සාහිත්‍ය ග්‍රන්ථ පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම**

9.1 පාලි භාෂාවේ ප්‍රභවය පිළිබඳ අවබෝධය ලබා ගැනීමට කියවයි.

කාලච්ඡේද 05 යි.

**ඉගෙනුම් පල**

- පාලි සාහිත්‍යය යනු කුමක් දැයි පැහැදිලි කරයි.
- පාලි යන වචනය මුල් කාලයේ භාවිත වූයේ බුද්ධ වචනය හැඳින්වීමට බව පෙන්වා දෙයි.
- පාලි භාෂාවේ ප්‍රභවය පිළිබඳ පඬිවරුන්ගේ මතවාද සමාලෝචනය කරයි.
- ත්‍රිපිටකය පරම්පරාගත වාචෝද්ග්‍රහණයෙන් ගෙන ආ ආකාරය පැහැදිලි කරයි.
- ත්‍රිපිටකය පවත්වාගෙන ඒමේ දී ඇති වූ දුෂ්කරතා ගෙනහැර දක්වයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස්**

යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය යටතේ දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- පාලි සාහිත්‍යය යනු කුමක් දැයි පැහැදිලි කළ යුතු බව
- පාලි යන වචනයෙන් මුල් කාලයේ ත්‍රිපිටකය හැඳින්වුණු බව
- පාලි භාෂාවේ ප්‍රභවය පිළිබඳ ව පඬිවරුන් අතර මතවාද පැවති බව
- ත්‍රිපිටකය ආචාර්ය පරම්පරාගත වාචෝද්ග්‍රහණයෙන් ගෙන පැවත ආ බව
- ත්‍රිපිටකය වාචෝද්ග්‍රහණයෙන් ගෙන ඒමේ දී විවිධ දුෂ්කරතා ඇති වූ බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- ත්‍රිපිටකය අටුවා, ටීකා, ප්‍රකරණ, වංශකථා යනාදියෙන් පාලි සාහිත්‍යය සමන්විත බව
- පාලි යන වචනය ත්‍රිපිටකය සඳහා භාවිත වී ඇති ආකාරය පෙන්වා දීම
- පාලි භාෂාව හා මගධ භාෂාව අතර ඇති සම්බන්ධය දක්වෙන මත ඉදිරිපත් කොට විමසීම
- මගධ භාෂාවට හා පාලි භාෂාවට බුදුන් වහන්සේගේ සම්බන්ධතාව දක්වෙන මත ගෙනහැර දක්වීම
- පාලි භාෂාවේ ප්‍රභවය පිළිබඳ ව පඬිවරුන්ගේ මත විමසීම
- ත්‍රිපිටකය ආචාර්ය පරම්පරාගත ව වාචෝද්ග්‍රහණයෙන් පවත්වාගෙන ආකාරය පැහැදිලි කිරීම
- ත්‍රිපිටකය කටපාඩමෙන් පවත්වාගෙන ඒමේ දී පැනනැගුණු විවිධ දුෂ්කරතා ගෙන හැර දක්වීම

**තක්සේරුව හා ඇගයීම**

- පාලි සාහිත්‍යය යනු කුමක් දැයි හඳුන්වයි.
- ත්‍රිපිටකය පාලි යන වචනයෙන් හැඳින්වූ බවට සාධක ඉදිරිපත් කරයි.
- පාලි භාෂාව හා මගධ භාෂාව අතර ඇති සම්බන්ධය තහවුරු කෙරෙන මත සමාලෝචනය කරයි.
- පාලි භාෂාවේ ප්‍රභවය පිළිබඳ ව පඬිවරුන්ගේ මත ගෙනහැර දක්වයි.
- ත්‍රිපිටකය පරම්පරාගත වාචෝද්ග්‍රහණයෙන් පවත්වාගෙන ආ ආකාරය පැහැදිලි කරයි.
- ත්‍රිපිටකය කටපාඩමෙන් ගෙන ඒමේ දී පැනනැගුණු දුෂ්කරතා ගෙනහැර දක්වයි.

**ගුණාත්මක යෙදවුම්**

- පාලි සාහිත්‍යය, බුද්ධදත්ත නා හිමි, පොල්වත්තේ: රත්න පොත් ප්‍රකාශයෝ, කොළඹ, 2012.

# 28. ඒකකය - **පාලි සාහිත්‍යය - 2**

**නිපුණතාව**

9.0 පාලි සාහිත්‍යයේ ව්‍යූහය පිළිබඳ අවබෝධයය ලබා ගැනීම සඳහා පාලි සාහිත්‍ය ග්‍රන්ථ පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම**

9.2 ත්‍රිපිටක සාහිත්‍යය වර්ගීකරණය කරයි.

9.3 පාලි ත්‍රිපිටක ග්‍රන්ථ හඳුන්වයි.

9.4 පාලි ත්‍රිපිටක සාහිත්‍යයේ ඓතිහාසික පෙළගැස්වීම පැහැදිලි කරයි.

කාලච්ඡේද 15 යි.

**ඉගෙනුම් පල**

- ත්‍රිපිටක සාහිත්‍යයේ වඩාත් ප්‍රායෝගික හා විධිමත් වර්ගීකරණය විස්තර කරයි.
- ත්‍රිපිටකයට අයත් ග්‍රන්ථ වෙන වෙන ම ලියා දක්වයි.
- ත්‍රිපිටකයට අයත් ග්‍රන්ථ වෙන වෙන ම හඳුන්වයි.
- පිටක ග්‍රන්ථයන්හි ඇතුළත් සුත්ත, වග්ග, පණ්ණාසක, යනාදිය නම් කරයි.
- ත්‍රිපිටකයේ ඇති බුද්ධ දේශනා හා ශ්‍රාවක දේශනා වෙන් කොට දක්වයි.
- ඛුද්දකනිකායේ පෞරාණිකත්වය පිළිබඳ මත සමාලෝචනය කරයි.
- ත්‍රිපිටකයෙහි ග්‍රන්ථවල පැරණි හා පසු කාලීන බව තේරුම් ගනියි.
- අභිධර්ම පිටකයේ ඓතිහාසිකත්වය පිළිබඳ ව පවතින මත සමාලෝචනය කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස්**

යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය යටතේ දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ත්‍රිපිටක සාහිත්‍යයේ විවිධ වර්ගීකරණ ඇති බව
- වඩාත් ප්‍රායෝගික වර්ගීකරණය දැනට භාවිතයෙහි පවතින බව
- ත්‍රිපිටකයට අයත් ග්‍රන්ථ වෙන වෙන ම ලියා දැක්විය යුතු බව
- ත්‍රිපිටකයට අයත් ග්‍රන්ථ වෙන වෙන ම හැඳින්විය යුතු බව
- ත්‍රිපිටකයේ ඇති බුද්ධ දේශනා හා ශ්‍රාවක දේශනා වෙන්කොට දැක්විය යුතු බව
- ඛුද්දකනිකායේ පෞරාණිකත්වය පිළිබඳ මත පවතින බව
- ත්‍රිපිටක ග්‍රන්ථවල පැරණි හා පසු කාලීන බව විවිධ මත ඇසුරෙන් පෙන්වා දිය හැකි බව
- අභිධර්ම පිටකයේ ඓතිහාසිකත්වය පිළිබඳ විවිධ මත පවතින බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- ත්‍රිපිටක සාහිත්‍යයේ වර්ගීකරණ පෙන්වා දීම
- වඩාත් ප්‍රායෝගික වර්ගීකරණය පැහැදිලි කර දීම
- ත්‍රිපිටකයට අයත් ග්‍රන්ථ වෙන වෙන ම ලියා දැක්වීම
- ත්‍රිපිටකයට අයත් ග්‍රන්ථ වෙන වෙන ම හඳුන්වා දීම
- බුද්ධ දේශනා හා ශ්‍රාවක දේශනා වෙන් කොට හඳුනාගැනීම.
- ඛුද්දකනිකායේ පෞරාණිකත්වය පිළිබඳ මත ගෙනහැර දැක්වීම.
- ත්‍රිපිටකයෙහි ග්‍රන්ථවල පැරණි හා පසු කාලීන බවට විවිධ මත විමසීම.

- අභිධර්ම පිටකයේ ඓතිහාසිකත්වය පිළිබඳ ව පවතින මත විමසිය යුතු විමසීම.

**තක්සේරුව හා ඇගයීම**

- ත්‍රිපිටක සාහිත්‍යයේ විවිධ වර්ගීකරණ දක්වයි.
- ත්‍රිපිටක සාහිත්‍යය නිවැරදි ව වර්ගීකරණය කරයි.
- ත්‍රිපිටකයට අයත් ග්‍රන්ථ වෙන වෙන ම ලියා දක්වයි.
- බුද්ධ දේශනා හා ශ්‍රාවක දේශනා වෙන වෙන ම ලියා දක්වයි.
- ඛුද්දකනිකායේ පෞරාණිකත්වය පිළිබඳ මත ඉදිරිපත් කරයි.
- ත්‍රිපිටක ග්‍රන්ථ පැරණි හා පසුකාලීන වශයෙන් පෙළගස්වා ලියයි.
- අභිධර්ම පිටකයේ ඓතිහාසිකත්වය පැහැදිලි කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- පාලි සාහිත්‍යය, බුද්ධදත්ත නා හිමි, පොල්වත්තේ.: රත්න පොත් ප්‍රකාශයෝ, කොළඹ, 2012.
  (3 පරිච්ඡේදයේ දීඝ, මජ්ඣිම,  ඛුද්දක නිකාය තුන , විනය සහ අභිධර්ම පිටකයට අදාළ කොටස්)

## 29. ඒකකය - අර්ථ විවරණය - ව්‍යාකරණ විභාග

**නිපුණතාව**

10.0 අර්ථ විවරණ හැකියාව වර්ධනය කර ගනියි.

**නිපුණතා මට්ටම**

10.1 නිර්දිෂ්ට කෘතිවල ඇතුළත් විශේෂ පද විග්‍රහ (විභාග) කරයි.

**කාලච්ඡේද 25 යි.**

**ඉගෙනුම් පල**

- නිර්දිෂ්ට කොටස්වල අර්ථ ව්‍යාඛ්‍යාන කරයි.
- නියමිත කොටස්වල ව්‍යාකරණ විභාග ගෙනහැර දක්වයි.
- පද හා අර්ථ අතර ඇති සම්බන්ධය පැහැදිලි කරයි
- නිර්දිෂ්ට ඡේදවල පසුබිම විශ්ලේෂණය කරයි.
- උද්ධෘත පදවල ධර්මානුකූල විවරණය පැහැදිලි කරයි.
- නිවැරදි පාලි වාක්‍ය රචනයෙහි යෙදෙයි.
- නාම, සන්ධි, සමාස, තද්ධිත සහ කාරක ප්‍රයෝග ආදි ව්‍යාකාරණ ප්‍රවර්ගයන්ගේ භාවිතය හඳුන්වා දෙයි.
- වාච්‍යාර්ථය, ලක්‍ෂ්‍යාර්ථය හා ධ්වනිතාර්ථය පැහැදිලි කරයි.
- පාලි භාෂාවේ විශේෂ ප්‍රයෝග පිළිබඳ අවබෝධය ලබයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය යටතේ දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- නිර්දිෂ්ට පාලි පාඨවල අර්ථ ව්‍යාඛ්‍යාන දැක්විය යුතු බව
- ව්‍යාකරණ විභාග දැක්විය යුතු බව
- පද හා අර්ථ අතර ඇති සම්බන්ධය පැහැදිලි කළ යුතු බව
- නිර්දිෂ්ට ඡේදවල පසුබිම විශ්ලේෂණය කළ යුතු බව
- නාම, සන්ධි, සමාස, තද්ධිත, හා කිතක ආදි ව්‍යාකරණාංග නම් කළ යුතු බව
- වාච්‍යාර්ථය, ලක්‍ෂ්‍යාර්ථය, ධ්වනිතාර්ථය පැහැදිලි කළ යුතු බව
- පාලි භාෂාවේ විශේෂ ප්‍රයෝග පිළිබඳ අවබෝධය තිබිය යුතු බව

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමය**

- අදාළ ඡේද ශබ්ද නඟා කියවීම
- ශිෂ්‍යයා ලවා අර්ථ ව්‍යාඛ්‍යාන කරවා පැහැදිලි කිරීම
- දුරවබෝධ පද අටුවා ක්‍රමයෙන් පැහැදිලි කිරීම
- අදාළ ඡේදවල පසුබිම් සාකච්ඡා කිරීම
- ඒ ඒ පදවල ඇති නිපාත, උපසර්ග පද වෙන් කරවීම

- ඡේදාගත පදවල ව්‍යාකරණ ලක්‍ෂණ සාකච්ඡා කිරීම.
- ඡේදාගත පද ව්‍යාකරණ ප්‍රවර්ගවලට ඇතුළත් වන සේ වගුවක් සකස් කිරීම.

**තක්සේරුව හා ඇගයීම**

- දුරවබෝධ පද විස්තර කරයි.
- ප්‍රස්තුත මාතෘකා චිත්‍රයට නඟයි.
- ඒ ඒ පදවල දක්නට ලැබෙන ව්‍යාකරණ අංග ඇතුළත් කොට වගුවක් පිළියෙළ කරයි.
- ව්‍යාකරණ විස්තර කරදීම මඟින් නිසි අරුත පෙන්වා දෙමින් නිවැරදි වාක්‍ය ලියයි.

**ගුණාත්මක යෙදවුම්**

- (මහාසුපිනජාතක) - ජාතකට්ඨකථා, පියතිස්ස හිමි, විදුරුපොළ.: හේවාවිතාරණ මුද්‍රණය, 1988/1990.
- (පණ්ඩිත වර්ගය) - ධම්මපද විචාරය, ධම්මානන්ද හිමි, මකුරුප්පේ.: සංඛ මුද්‍රණාලය, මරදාන, 1989.
- දීඝනිකායට්ඨකථා (සිගාල සුත්ත) ප්‍රථම භාගය, දේවමිත්ත හිමි, හෙයියන්තුඩුවේ.: හේවාවිතාරණ මුද්‍රණය, කොළඹ, 1989.

## 30. ඒකකය - අර්ථ විවරණ - ධර්මාර්ථ විභාගය

**නිපුණතාව**

10.0 අර්ථ විවරණ හැකියාව වර්ධනය කර ගනියි.

**නිපුණතා මට්ටම**

10.2 තෝරා ගත් විශේෂ පදවල ධර්මාර්ථ විවරණය කරයි.

**කාලච්ඡේද 10 යි.**

**ඉගෙනුම් පල**

- නිර්දිෂ්ට ග්‍රන්ථයන්හි ගද්‍ය හා පද්‍ය කොටස් නිවැරදි ව හඬනඟා කියවයි.
- නිර්දිෂ්ට ග්‍රන්ථයන්හි කොටස්වල අර්ථය නිවැරදි ව කියයි.
- පද හා අර්ථ අතර ඇති සම්බන්ධය විමර්ශනය කරයි.
- විශේෂ පදවලට ධර්මාර්ථ විවරණ සපයයි.
- වාච්‍යාර්ථ හා ධර්මාර්ථ පැහැදිලි කරයි.
- දුරවබෝධ පද අත් නොහැර අර්ථ දක්වයි.
- අංකිත පද අටුවා නයින් විවරණය කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය යටතේ දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- නිර්දිෂ්ට ග්‍රන්ථයන්හි ගද්‍ය හා පද්‍ය කොටස් නිවැරදි ව කියවිය යුතු බව
- නිර්දිෂ්ට කොටස්වල අර්ථය නිවැරදි ව කියවිය යුතු බව
- පද හා අර්ථ අතර ඇති සම්බන්ධය විමර්ශනය කළ යුතු බව
- විශේෂ පදවලට ධර්මාර්ථ විවරණ සැපයිය යුතු බව
- වාච්‍යාර්ථ හා ධර්මාර්ථය පැහැදිලි කළ යුතු බව
- දුරවබෝධ පද අත් නොහැර අර්ථ දැක්විය යුතු බව
- අංකිත පද අටුවා නයින් විවරණය කළ යුතු බව

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමය**

- නිර්දිෂ්ට ග්‍රන්ථයන්හි ගද්‍ය හා පද්‍ය කොටස් නිවැරදි ව කියවීම
- නිර්දිෂ්ට කොටස්වල අර්ථය නිවැරදි ව කියවීම
- පද හා අර්ථ අතර ඇති සම්බන්ධය විමර්ශනය කොට පෙන්වා දීම
- විශේෂ පදවලට ධර්මාර්ථ විවරණ සැපයීම
- වාච්‍යාර්ථ හා ධර්මාර්ථ පැහැදිලි කිරීම
- දුරවබෝධ පද අත් නොහැර අර්ථ දැක්වීම
- අංකිත පද අටුවා නයින් විවරණය කිරීම

**තක්සේරුව හා ඇගයීම**

- නිර්දිෂ්ට කොටස් නිවැරදි ව මාධ්‍ය භාෂාවට නඟයි.
- පද්‍ය හා ගද්‍ය පාඨයන්හි පද විභාග කරයි.
- විශේෂ පදයන්ට ධර්මාර්ථ සපයයි.
- අංකිත පද අටුවා නයින් විවරණය කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට ග්‍රන්ථ

**වැඩි දුර ගවේෂණය**

- දීඝනිකායට්ඨකථා (සිගාල සුත්ත) ප්‍රථම භාගය, දේවමිත්ත හිමි, හෙයියන්තුඩුවේ.: හේවාවිතරණ මුද්‍රණය, කොළඹ, 1989.
- ධම්මපදට්ඨකථා, රතනසාර හිමි, කහවේ.: හේවාවිතාරණ මුද්‍රණය, 1989/1991.

## පාසල පදනම් කරගත් තක්සේරුකරණය හැඳින්වීම

නිපුණතා පාදක විෂයමාලාව හඳුන්වා දීමේ දී ඔබ අතට පත් කොට මෙතෙක් ඔබ පරිශීලනය කළ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය මඟින් පාසල පදනම් කරගත් තක්සේරුකරණය පිළිබඳ මේ වන විට ඔබ මනා වැටහීමක් ලබා තිබිය යුතුය. ඔබගේ පහසුව සඳහා මෙම ගුරු මාර්ගෝපදේශයේද එම විස්තර පහත දක්වා ඇත.

ඉගෙනුම්, ඉගැන්වීම් සහ ඇගයීම අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත් සංරචක තුනක් බවත් ඉගෙනුමෙහි සහ ඉගැන්වීමෙහි ප්‍රගතිය දැනගැනීම පිණිස ඇගයීම යොදාගත යුතු බවත් සැම ගුරුවරයකු විසින් ම දත යුතු පැහැදිලි කරුණකි. ඒවා අන්‍යෝන්‍ය බලපෑමෙන් යුතු ව ක්‍රියාකරන බවත් එසේ ම එකිනෙකෙහි සංවර්ධනය කෙරෙහි එම සංරචක බලපාන බවත් ගුරුවරු දනිති. සන්තතික (නිරන්තරයෙන් සිදු වන) ඇගයීම් මූල ධර්ම අනුව ඇගයීම සිදු විය යුත්තේ ඉගෙනීම හා ඉගැන්වීම කෙරෙන අතරතුර දී ය. මෙය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භයේ දී හෝ මැද දී හෝ අග දී හෝ යන ඕනෑ ම අවස්ථාවක දී සිදු විය හැකි ය. එලෙස තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය ඇගයීමට අපේක්ෂා කරන ගුරුවරයෙකු ඉගෙනුම ඉගැන්වීම හා සහ ඇගයීම පිළිබඳ සංවිධානාත්මක සැලැස්මක් යොදාගත යුතු වෙයි.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ හුදු විභාග ක්‍රමයක් හෝ පරීක්ෂණ පැවැත්වීමක් හෝ නො වේ. එය හඳුන්වනු ලබන්නේ සිසුන්ගේ ඉගෙනීමත් ගුරුවරුන්ගේ ඉගැන්වීමත් වැඩි දියුණු කිරීම සඳහා යොදාගනු ලබන මැදිහත්වීමක් වශයෙනි. මෙය සිසුන්ට සමීප ව සිටිමින් ඔවුන්ගේ ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන ඒවාට පිළියම් යොදමින් සිසුන්ගේ උපරිම වර්ධනය ළඟා කර ගැනීමට යොදා ගත හැකි වැඩපිළිවෙළකි.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම් මඟින් අනාවරණ ක්‍රියාවලියට සිසුන් යොමු කෙරෙන අතර, ගුරුවරයා සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටු කරන කාර්යය නිරීක්ෂණය කරමින් මාර්ගෝපදේශකත්වය සපයමින් කටයුතු කිරීම පාසල් පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂා කෙරේ. මෙහි දී ශිෂ්‍යයා නිරතුරු ව ඇගයීමට ලක් විය යුතු අතර ශිෂ්‍ය හැකියා සංවර්ධනය අපේක්ෂිත අන්දමින් සිදුවන්නේ දැයි ගුරුවරයා විසින් තහවුරු කරනු ලැබිය යුතු වෙයි.

ඉගෙනීම සහ ඉගැන්වීම මඟින් සිදුවිය යුත්තේ සිසුනට නිසි අත්දැකීම් ලබා දෙමින් ඒවා සිසුන් විසින් නිසි පරිදි අත්පත් ගනු ලැබ ඇත් දැයි තහවුරු කර ගැනීම ය. ඒ සඳහා නිසි මාර්ගෝපදේශය සැපයීම ය. ඇගයීමේ (තක්සේරු කිරීමේ) යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකි ය. එම මාර්ගෝපදේශ පොදු වේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (Feed Back) හා ඉදිරි පෝෂණයය (feed Forward) යනුවෙනි. සිසුන්ගේ දුබලතා හා නොහැකියා අනාවරණය කරගත් විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයත් ලබා දීම ගුරු කාර්යය වෙයි.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ අරමුණු අතරෙන් කවර අරමුණු කවර මට්ටමින් සාක්ෂාත් හැකි වූයේ දැයි හඳුනාගැනීම සිසුන්ට අවශ්‍ය වෙයි. ඇගයීම් වැඩ පිළිවෙළ ඔස්සේ සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර සිසුන් හා සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමුවිය යුතු ය. මෙ සඟා යොදාගත හැකි හොඳ ම ක්‍රමය වන්නේ පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රමය යි.

යථෝක්ත අරමුණ සහිත ව ක්‍රියා කරන ගුරුවරුන් විසින් තම ඉගැන්වීම් ක්‍රියාවලියත් සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියත් වඩාත් කාර්‍යක්‍ෂම කිරීම පිණිස ඒවා හොඳ කාර්යක්ෂමතාවෙන් යුක්ත ඉගෙනුම්-ඉගැන්වීම් සහ ඇගයීම් ක්‍රම යොදා ගත යුතු වෙයි. මේ සම්බන්ධයෙන් සිසුන්ට හා ගුරුවරුන්ට යොදා ගත හැකි ප්‍රවේශ පිළිබඳ ප්‍රභේද කිහිපයක් මතු දැක්වෙයි. මෙවා බොහෝ කලක සිට ගුරුවරුන් වෙත විභාග දෙපාර්තමේන්තුව විසින් ද ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද තොරතුරු සම්පාදනය කරන ලද ක්‍රමවේද වෙයි. එහෙයින් ඒවා සම්බන්ධයෙන් පාසල් පද්ධතියේ ගුරුවරුන් හොඳින් දැනු වත් වී ඇතැයි අපේක්ෂා කෙරේ.

1. පැවරුම්
2. ව්‍යාපෘති
3. සමීක්ෂණ
4. ගවේෂණ
5. නිරීක්ෂණ
6. ප්‍රදර්ශන / ඉදිරිපත් කිරීම
7. ක්ෂේත්‍ර චාරිකා
8. කෙටි ලිඛිත පරීක්ෂණ
9. ව්‍යුහගත රචනා
10. විවෘත ග්‍රන්ථ පරීක්ෂණ
11. නිර්මාණාත්මක ක්‍රියාකාරකම්
12. ශ්‍රවණ පරීක්ෂණ
13. ප්‍රායෝගික ක්‍රියාකාරකම්
14. කථනය
15. ස්වනිර්මාණ
16. කණ්ඩායම් ක්‍රියාකාරකම්
17. සංකල්ප සිතියම
18. ද්විත්තව සටහන් ජර්නල
19. බිත්ති පුවත්පත්
20. ප්‍රශ්න විචාරත්මක වැඩ සටහන්
21. ප්‍රශ්න හා පිළිතුරු පොත්
22. විවාද
23. සාකච්ඡා මණ්ඩල
24. සම්මන්ත්‍රණ
25. ක්ෂණික කථා
26. භූමිකා රංගන

හඳුන්වා දී ඇති මෙම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම සැම එකක් ම සැම විෂයයක් සම්බන්ධයෙන් සැම විෂය ඒකකයකට ම යොදා ගත යුතු යැයි අපේක්ෂා නොකෙරෙයි. තම විෂයයට, විෂය ඒකකයට ගැළපෙන ප්‍රභේදයක් තෝරා ගැනීමට ගුරුවරුන් දැනුම්වත් විය යුතු ය. වග බලා ගත යුතු ය. එහි දී පහත වගුවෙහි දැක්වෙන ආකාරයට උචිත නිර්නායක පදනම් කරගෙන ඇගයීම් ආධාරක සකස් කොට ඇගයීම් කාර්යය සිදු කළ යුතු වේ.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ නිදර්ශක ආධාරකය

1. පාසල් වාරය :- තෙවන වාරය
2. ආධාරක අංකය. :- 01
3. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම්. :- 6-1, 6-2
4. ආවරණය කෙරෙන විෂය සන්ධාරය. :- • මහාසුපින ජාතක - සාරධර්ම චරිතායනය
5. ආධාරකයේ ස්වභාවය :- ප්‍රදර්ශනයක් සංවිධානය කිරීම
6. ආධාරකයේ අරමුණු :-
   - මහාසුපින ජාතකයේ එන සාරධර්ම චරිතායනය කිරීම.
   - නූතන දූෂිත සමාජ සංසිද්ධිවලින් මතු පරපුර මුදවා ගැනීම.
   - සමාජය සුචරිතවත් කිරීම
   - වැඩිහිටි පරපුර ගරු කටයුතු පිරිසක් බවට පත්කිරීම
   - ආත්ම දමනය ප්‍රගුණ කිරීම
   - පරාර්ථ චර්යාව පුහුණු කිරීම
   - අන්‍යෝන්‍ය සුහසාධනය පුරුදු කිරීම
   - සමාජ සුචරිත ධර්ම පිළිබඳ වැඩසටහන් සංවිධානය පුහුණු කිරීම.
   - බුද්ධියට සමගාමී හදවතක් ඇති කිරීම
7. ආධාරකය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්.

**ගුරු උපදෙස්** :-

- එක් එක් ශිෂ්‍යයාට වෙන වෙන ම මාතෘකා ලබා දී ඒ ඒ මාතෘකාවට අදාළ පුවත්පත් වාර්තා අන්තර්ජාල තොරතුරු රැස්කිරීමට උපදෙස් දෙන්න.
- තොරතුරු රැස් කිරීමට හා ප්‍රදර්ශනයට නිශ්චිත කාල රාමුවක් දෙන්න.
- කණ්ඩායම් නායකයකු පත් කරන්න.
- පරිශීලනයට අදාළ චිත්‍ර, වෙබ් අඩවි යෝජනා කරන්න.
- නිර්ණායකයන්ට අදාළ ව ලකුණු පිරිනමන්න.

**සිසු උපදෙස්** :-

- තමා විසින් සැපයිය හැකි ප්‍රදර්ශන උපකරණ ගුරුවරයා සමඟ සාකච්ඡා කොට තීරණය කරන්න.
- මහාසුපින ජාතකයේ සිහිනයන්ට අදාළ කර ගත හැකි පුවත්පත් වාර්තා තෝරා ගැනීමේ දී සාමූහික ක්‍රියාවලියක් ලෙස සලකා කටයුතු කරන්න.
- තමා විසින් සොයාගනු ලබන දත්ත උසස් ලෙස හා නිර්මාණාත්මක ව ඉදිරිපත් කරන්න.

8. ඇගයීම් ක්‍රමය.

| නිර්ණායක / සිසු නම් | මාතෘකාවට අදාළ බව | ප්‍රශ්නවල නිවැරදි බව හා විශ්වාසවත් බව (ගුණාත්මක බව) | ප්‍රශ්නවල ප්‍රමාණාත්මක බව | දත්තවල ප්‍රමාණාත්මක බව | නිර්මාණාත්මක බව | එකතුව |
|---|---|---|---|---|---|---|
| 1 | | | | | | |
| 2 | | | | | | |
| 3 | | | | | | |
| 4 | | | | | | |
| 5 | | | | | | |

**ලකුණු පරාසය**

- ඉතා හොඳ යි 04
- හොඳ යි 03
- මධ්‍යස්ථ යි 02
- සංවර්ධනය විය යුතු යි 01

මුලින් ලකුණු 20ක් ප්‍රදානය කොට දෙවනු ව එය 2න් බෙදා අවසාන ලකුණු සටහන් කළ යුතු ය. ශිෂ්‍යයා ලබාගත් ලකුණු ඔත්තේ සංඛ්‍යාවක් නම් 2න් බෙදූ විට ඉතිරියක් වන නිසා එය ධනාත්මක අගයකින් පූර්ණ සංඛ්‍යාවකට වටයන්න. මේ ලකුණු ඇසුරෙන් ශිෂ්‍ය නිපුණතා මට්ටම තීරණය කෙරේ.

9-10 - විශිෂ්ට නිපුණතා මට්ටම
8 - ඉහළ මට්ටමේ නිපුණතාව
6-7 - සම්මාන මට්ටමේ නිපුණතා
4-5 - ආසන්න මට්ටමේ නිපුණතාව
3 - නිපුණතාවට ළඟා නොවූ

මේ නිදර්ශන ආධාරකයක් පමණි ගුරුවරයාට ස්වාධීන ව නිදර්ශක ආධාරක සැලසුම් සකස් කර ගත හැකි ය.